වාර්ෂික වාර්තාව 2020

සිරස්ස් අනුකලනය




සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම

වැවිලි අමාත්‍යාංශය

සිරස් අනුකලනය

සිරස් අනුකලනය යනු සමාගමකට බාහිර කොන්ත්‍රාත්කරුවන් හෝ සැපයුම්කරුවන් පිළිබඳව විශ්වාසය තබනවාට වඩා තම නිෂ්පාදන ක්‍රියාවලියේ විවිධ අවස්ථාවල සෘජු හිමිකාරත්වය ලබා ගනිමින් තම මෙහෙයුම් විධිමත් කර ගැනීමට ඉඩ සලසා දෙන ක්‍රමවේදයකි.

සිරස් අනුකලනය යනු කෘෂිකර්මයේ වෙළඳපොළ ව්‍යුහයට සහ තරඟකාරිත්වයට බලපෑම් ඇති කරන තීරණාත්මක සාධක වලින් එකකි. පෙරවාදී හා පසුගාමී ඒකාබද්ධතාවය යනු සිරස් අනුකලනය යටතේ තිබෙන ප්‍රධාන ධාරාවන් ය. පෙරවාදී ඒකාබද්ධතාවය යනු නිෂ්පාදන නිම කිරීම හා බෙදාහැරීමේ දිශාවට වූ කෘෂිකාර්මික නිෂ්පාදන වල දිගුවකි. පසුගාමී ඒකාබද්ධතාවය නිෂ්පාදන සිරස තුළ පූර්වවාදී විෂයයන් වලින් යෙදවුම් භාවිත කර පූර්ව අවධි වලට යොමු කරවීමයි. සිරස් ඒකාග්‍රතාවයේ තලය පුද්ගල කර්මාන්ත අතර පමණක් වෙනස් නොවූවද එක් එක් කර්මාන්තය තුළ ද සිදු වේ. සිරස් ඒකාග්‍රතාවය තුළින් ගනුදෙනු ජාත්‍යන්තරකරණය කළ යුතු අතර එමගින් දේශීය හා විදේශීය වෙළඳපොළ යන දෙක තුල ස්ථාවරත්වයේ තරඟකාරිත්වය වර්ධනය කිරීමේ අරමුණින් වෙළඳපොළ සම්බන්ධීකරණ කාර්යභාරය සිදු කෙරේ.



පටුන

අප ගැන	03
අපගේ දැක්ම, මෙහෙවර හා මූලික සාරධර්ම	04
ජයග්‍රහණයන්	05
සංධිස්ථාන	06
සභාපතිතුමාගේ පණිවුඩය	08
ප්‍රධාන විධායක නිලධාරීගේ පණිවුඩය	11
අධ්‍යක්ෂ මණ්ඩලය	14
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය	18
පළාත් වතු අධිකාරිවරු	19

කළමනාකරණ සංවාදය හා විශ්ලේෂණය

තිරසාරත්ව වාර්තාව	20
අවදානම් කළමනාකරනය	23
සාමූහික පාලන ප්‍රකාශය	25
විගණන කමිටු වාර්තාව	27

මූල්‍ය ප්‍රකාශන

අධ්‍යක්ෂ මණ්ඩල වාර්ෂික වාර්තාව	29
අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය	35
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගනකාධිපති වාර්තාව	36
විස්තීරණ ආදායම් ප්‍රකාශය	43
මූල්‍ය තත්ව ප්‍රකාශය	44
ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය	45
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	46
ගිණුම්කරන ප්‍රතිපත්ති	47
මූල්‍ය ප්‍රකාශන සටහන්	57

ඇමුණුම්

වාර්ෂික මහ සභා රැස්වීම් නිවේදනය	79
පෙරකලාසි පත්‍රය	80
ආයතනික තොරතුරු	ඇතුල් පසු පිට

අප ගැන

1992 පිහිටුවන ලද පූර්ණ රාජ්‍ය හිමිකම යටතේ ඇති සමාගමක් වන සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කර ඇත. සමාගම 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධිවිධානයන්ට අනුකූලව ජනතා වතු සංවර්ධන මණ්ඩලය මගින් එවකට පාලනය වූ වතු සමූහයක කර්තව්‍ය භාර ගෙන ව්‍යාපාර කටයුතු කරගෙනයාම සඳහා පිහිටුවන ලදී. සමාගමේ පූර්ණ කොටස් වල හිමිකාරත්වය ස්වර්ණමය කොටස්කරු වන මහා භාණ්ඩාගාරය විසින් දරනු ලැබේ. සමාගමේ ලියාපදිංචි කාර්යාලය අංක 80, දඹුල්ල පාර, කුරුණෑගල යන ස්ථානයේ පිහිටා ඇත.

ආරම්භයේ සිටම පෞද්ගලික කළමනාකරණය යටතේ වසර 13 කට ආසන්න කාලයක් ක්‍රියාත්මක වූ සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම පෞද්ගලික කළමනාකරණයේ පැවති දුර්වලතා තුළ 2005 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි එහි කළමනාකාරිත්වය රාජ්‍ය අංශයට යටතට පවරා ගෙන වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණයට යටත් කෙරිණි. විවිධ අමාත්‍යාංශ යටතේ පැවති සමාගම 2015 සැප්තැම්බර් 01 දින සිට රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ අතර එම අමාත්‍යාංශයෙන් පසුව 2015 සැප්තැම්බර් 01 වන දින සිට රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතට පත්ව එය පසුකාලීනව රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යාංශය බවට පරිවර්තනය විය.

2020 අගෝස්තු 09 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය පථයට ඇතුළත් වූ අතර, 2020 ඔක්තෝබර් 06 වන දින සිට පොල් කිතුල් තල් වගා සංවර්ධන සහ අදාළ කර්මාන්ත නිෂ්පාදන සහ අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ මූලික ව්‍යාපාරික අරමුණු වන පොල්, රබර් සහ වෙනත් අතුරුභෝග වගා කිරීම, නිෂ්පාදනය කිරීම, සැකසීම හා අලෙවි කිරීම නොවෙනස්ව අඛණ්ඩව ඒ ආකාරයෙන්ම පළාත් වතු 7 ක් පුරා හෙක්ටයාර් 4971.12 ක ක්‍රියාත්මක වේ. කුරුණෑගල, ගම්පහ සහ අනුරාධපුර යන දිස්ත්‍රික්ක තුනෙහි විවිධ කාලගුණික කලාප පුරා විහිදෙමින් පවතී. එක් එක් වත්ත අංශ නමින් හඳුන්වනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 2 ක් හෝ 3 ක් පුරා විහිදෙන කුඩා කොටස් වලට වැඩිදුරටත් බෙදා වෙන් කර ඇත.

සමාගම සේවකයන් 1100 කට වැඩි සංඛ්‍යාවකට සෘජු රැකියා අවස්ථා සලසා ඇති අතර, තවත් බොහෝ පිරිසකගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා වක්‍රව දායක වී ඇත.

අපගේ දැක්ම

ගිණිකොන දිග ආසියානු කලාපයේ ආදර්ශමත්ම වැවිලි සහ
කෘෂි ව්‍යාපාර කළමනාකාරිත්ව සමාගම බවට පත්වීම

අපගේ මෙහෙවර

ස්වාභාවික, භෞතික සහ මානව සම්පත් සමාජ වගකීමකින් යුතුව උකහා ගෙන
වැවිලි සහ අනෙකුත් කෘෂි ව්‍යාපාර ඵලදායී ලෙසත් ලාභදායී තිරසාර ලෙසත්
කළමනාකරණය කරමින් සියළු ප්‍රතිලාභීන්ගේ උන්නතිය උදෙසා කටයුතු කිරීම.

මූලික සාරධර්ම

හොඳම සේවයා	:	ගුණාත්මකබව හා ඵලදායිත්වය වෙනුවෙන් පෙනී සිටින අවංක, සුදුසුකම්ලත් හා කැපවුනු කාර්ය මණ්ඩලයක් බිහි කිරීම
ව්‍යාපාරිකත්වය	:	වටිනාකම් නැංවීම, ලාභදායිත්වය, පරිසර හිතකාමීබව සහ සාමූහික සමාජ වගකීම
ගුණාත්මක ප්‍රතිපාදකයා	:	අප සිදු කරන්නා වූ සියළුම කර්තව්‍යයන්හි දී ඉහළම පාරිභෝගික තෘප්තිය සහ අඛණ්ඩ උන්නතියක් ළඟා කර ගැනීමට කටයුතු කිරීම.
ඵලදායීතාවය	:	යොදවන සෑම සම්පත් ඒකකයකින්ම ඉහළම ඵලදායීතාවයක් ලබා ගැනීම, බිම් ඒකකයකින් උපරිම අස්වැන්නක් ලබා ගැනීම, තිරසාර අන්දමින් භූමියෙන් උපරිම ප්‍රයෝජන ගැනීම හා නාස්තිය අවම කිරීම.
ව්‍යවසායකත්වය	:	සියළු අවස්ථාවලදී පූර්ව ක්‍රියාකාරිත්වයක් තුළ නව ප්‍රවේශයන්ට යොමුවීම
වටිනාකම් එකතුකිරීම	:	ව්‍යාපාරික ලෝකයේ නිරන්තරයෙන් වෙනස්වන අවශ්‍යතා සඳහා යහපත් ලෙස ප්‍රතිචාර දැක්වීම.
ලාභදායිබව	:	ප්‍රාථමික නිෂ්පාදන සහ අගය එකතු කළ නිෂ්පාදන සඳහා ප්‍රශස්ත විකුණුම් මිලක් ලබා ගැනීම සහ නිෂ්පාදන පිරිවැය හැකි මට්ටමක පවත්වා ගැනීමට කටයුතු කිරීම.
පරිසර හිතකාමිබව	:	පරිසරයට හානියක් නොවන ලෙස හෝ අවම බලපෑමක් සහිතව සම්පත් උපරිමයෙන් යොදා ගැනීම
සමාජ වගකීම	:	යහපාලනයට ගරු කරමින් මහජනතාව සහ පරිසරය සුරැකීම

ජයග්‍රහණයන්

2011

- ජාතික තලයේ කෘෂි ව්‍යාපාරික දෙවන ස්ථානය
- ජාතික කෘෂි ව්‍යාපාරික සම්මාන මහා පරිමාණ නිෂ්පාදක (වැවිලි) රන් සම්මානය

2012

- ජාතික කෘෂි ව්‍යාපාරික සම්මානය - සමස්ථ ලංකා රන් සම්මානය
- ජාතික කෘෂි ව්‍යාපාරික සම්මාන මහා පරිමාණ නිෂ්පාදක (වැවිලි) රන් සම්මානය

2013

- ජාතික කෘෂි ව්‍යාපාරික සම්මානය
- ජාතික කෘෂි ව්‍යාපාරික සම්මාන මහා පරිමාණ නිෂ්පාදක (වැවිලි) රන් සම්මානය

2014

- ජාතික කෘෂි ව්‍යාපාරික සම්මානය
- ජාතික කෘෂි ව්‍යාපාරික සම්මාන මහා පරිමාණ නිෂ්පාදක (වැවිලි) රන් සම්මානය -2014

2015

- ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය මගින් පිරිනමන ජාතික ව්‍යාපාරික විශිෂ්ඨතා සම්මාන කෘෂි හා වැවිලි සඳහා වූ 2015 සම්මානය

2016

- ජාත්‍යන්තර ගම්මිරිස් ප්‍රජාව මගින් හොඳම ගම්මිරිස් වගාකරුට පිරිනැමෙන ජාත්‍යන්තර සම්මානය

2017

- ජාත්‍යන්තර ගම්මිරිස් ප්‍රජාව මගින් හොඳම ගම්මිරිස් වගාකරුට පිරිනැමෙන ජාත්‍යන්තර සම්මානය

2018

- ජාත්‍යන්තර ගම්මිරිස් ප්‍රජාව මගින් හොඳම ගම්මිරිස් වගාකරුට පිරිනැමෙන ජාත්‍යන්තර සම්මානය

2019

- ජාත්‍යන්තර ගම්මිරිස් ප්‍රජාව මගින් හොඳම ගම්මිරිස් වගාකරුට පිරිනැමෙන ජාත්‍යන්තර සම්මානය



සන්ධිස්ථාන

1992 ජූනි 18 දින

චිවකට පැවති රජයේ පුද්ගලීකරණ ප්‍රතිපත්තිය යටතේ ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ මණ්ඩල අංක 5 යටතේ පාලනය වූ වතු සමූහයක් ඒකාබද්ධ කොට 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාරික ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධිවිධානයන්ට අනුකූලව 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ පොදු සමාගමක් ලෙස කුරුණෑගල වැවිලි සමාගම ස්ථාපිත කෙරිණි. 1992 ජූනි 18 වන දින සිට 2004 දෙසැම්බර් 31 දින දක්වා කුරුණෑගල වැවිලි සමාගමේ කළමනාකාරිත්වය පුද්ගලික අංශයේ කළමනාකරණ නියෝජිත සමාගමක් විසින් සිදු කරන ලදී.

2005 ජනවාරි 01 දින

වසර 13 කට ආසන්න කාලයක් පුරා පැවති අකාර්යක්ෂම පෞද්ගලික කළමනාකරණය හේතු කොට ගෙන චිවකට රජය විසින් 2005 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සමාගමේ කළමනාකාරිත්වය රාජ්‍ය අංශය යටතට පවරා ගෙන වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතට පත් කෙරිණි.

2006 ජූනි 06 දින

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම පොල් සංවර්ධන අමාත්‍යාංශයට යටතට පත්වීම

2007 අප්‍රියෙල් 18 දින

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම රාජ්‍ය වතු කළමනාකරණ සහ සංවර්ධන අමාත්‍යාංශය යටතට පත්වීම.

2010 ජූනි 18 දින

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතට පත්වීම.

2010 නොවැම්බර් 16 දින

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය යටතට පත්වීම



2015 සැප්තැම්බර් 21 දින

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතට පත්වීම



2018 නොවැම්බර් 09 දින

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතට පත්වීම.



2018 මැයි 01 දින

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යාංශය යටතට පත්වීම



2015 පෙබරවාරි 18 දින

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතට පත්වීම



2020 අගෝස්තු 09 දින

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම වැවිලි අමාත්‍යාංශය යටතට පත්වීම.



සභාපතිතුමාගේ පණිවුඩය



සමාගමේ සියළුම පාර්ශ්වයන් වෙත,

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කිරීම පිළිබඳව මා සතුටු වෙමි. තිරසාර වර්ධනය අරමුණු කර ගත් අපගේ වාර්තාව පිළිබඳව ගැඹුරු හා පැහැදිලි අවබෝධයක් මෙතුළින් ඔබට ලැබෙනු ඇතැයි මා විශ්වාස කරමි.

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම ගිණිකොන දිග ආසියානු කලාපයේ ආදර්ශමත්ම වැවිලි හා කෘෂි ව්‍යාපාර කළමනාකරණ සමාගම බවට පත් කිරීම අපගේ අභිප්‍රාය වේ. මෙම දැක්ම සාක්ෂාත් කරනු වස් ස්වභාවික, භෞතික සහ මානව සම්පත් සමාජ වගකීමකින් යුතුව උකහා ගෙන වැවිලි සහ අනෙකුත් කෘෂි ව්‍යාපාර ඵලදායී ලෙසත් ලාභදායී ලෙසත් තිරසාර ලෙසත් කළමනාකරණය කරමින් සියළු ප්‍රතිලාභීන්ගේ හා අවසාන වශයෙන් රටේ උන්නතිය උදෙසා කටයුතු කරනු ලබයි.

කොවිඩ් 19 බලපෑම සහ ප්‍රතික්‍රියාවන්

කොවිඩ් 19 වසංගතය මගින් ගෝලීය හා දේශීය ආර්ථිකයට ඇති කරන දිගුකාලීන බලපෑම පසෙකලා ශ්‍රී ලංකාවේ වැවිලි ක්ෂේත්‍රයට වන නිශේධනීය බලපෑම ක්ෂේත්‍රයේ නිරත උනන්දුවක් දක්වන්නන්ගේ සක්‍රිය ක්‍රියාමාර්ග මගින් සැලකිය ලෙස අවම කර ගැනීමට හැකි විය. එතුළින් වතු සේවක සහ ප්‍රජාවන්ගේ ආරක්ෂාව සහතික කරන අතරතුරු මෙහෙයුම් බාධක අවම කර ගැනීමට අපේක්ෂිතය.

සමාලෝචිත වසර

කුරුණෑගල වැවිලි සමාගම 2020 දෙසැම්බර් 31 අවසන් වූ මූල්‍ය වර්ෂය තුල රු. මිලියන 214.9 ක බදු පසු ලාභයක් අත් කර ගනිමින් දැවැන්ත කාර්ය සාධනයක් පෙන්නුම් කර ඇත. මනා කෘෂිකාර්මික ක්‍රමවේද පිළිබඳව විශ්වාසය තබමින් අප තාක්ෂණය හා නිවැරදි කෘෂි ක්‍රමවේද සමබරව පවත්වාගෙන යාමට කැපව සිටි. එමගින් යෙදවුම් ගුණාත්වය හා අඛණ්ඩතාවය වැඩිදුරටත් ඉදිරියට ගෙන යමින් යටිතල පහසුකම් වැඩිදියුණුවට ආයෝජන සිදු කරමින් ස්වයංක්‍රියකරණය හදුන්වා දී ඇත. මෙම ප්‍රයත්න සියල්ල මගින් කාර්යක්ෂමතාව හා නිෂ්පාදිතය වර්ධනය කිරීම තුලින් අවසන් වශයෙන් මෙහෙයුම් අතිසාර්ථකත්වය අරමුණු කර ඇත.

රටේ පොල් සහ පොල් නිෂ්පාදන වල සමස්ත සැපයුම 2020 වසරේ දී හැකිලීමක් සිදු විය. එම වසර තුළ පොල් නිෂ්පාදනය 9.5 ක ප්‍රතිශතයකින් සැලකිය යුතු ලෙස අඩුවීමට හේතු පාදක වූයේ 2019 වසරේ දී ප්‍රධාන වශයෙන් පොල් වගා කරන ප්‍රදේශ වලට ප්‍රමාණවත්ව වැසි නොමැති වීමේ ප්‍රතිඵලයක් ලෙස 2020 දී පොල් නිෂ්පාදනයේ 9.5 ක සැළකිය යුතු අඩු වීමක් සිදු විය. ගෙඩි පොල් නිෂ්පාදනය පහත වැටීම සහ කොවිඩ් 19 වසංගතය අතරතුර සැපයුම් බාධා ඇතිවීම මගින් පොල් ආශ්‍රිත කර්මාන්ත වලට මරු පහරක් වැදීමට හේතුපාදක විය.

සමාගමේ පොල් නිෂ්පාදනය 2020 දී පසුගාමී ප්‍රවනතාවයක් පෙන්නුම් කිරීමට හේතුව වූයේ 2019 වසරේ දී ප්‍රධාන පොල් වගා කරන පෙදෙස් වලට ප්‍රමාණවත් වර්ෂාපතනයක් නොලැබීම ය. මේ නිසා සමාගමේ සමස්ත නිෂ්පාදනයෙන් සියයට 30 කට බලපෑම් විල්ල කළ වුවද NSA සියයට 99 කින් වැඩිවීම නිසා ගත වූ වසරට සාපේක්ෂව රු. මිලියන 168 ක අලෙවි වර්ධනයක් කුරුණෑගල වැවිලි සමාගමට ඉපයීමට හැකියාව අත් විය.

ජාතික රබර් නිෂ්පාදනය 2020 වසරේ දී සියයට 4.6 ක වර්ධනයක් අත්පත් කර ගැනීමට හැකි වූයේ ඒ සඳහා වූ ඉහළ මිල සහ වසරේ දෙවන භාගයේ පැවති හිතකර කාලගුණික තත්ත්වයන්ය. 2020 වසරේ ප්‍රථම භාගය තුළ රබර් නිෂ්පාදනය සියයට 10.1 කින් අවම වීමක් පෙන්නුම් කළද, කොවිඩ් 19 වසංගතයේ පළමු රැල්ල නිසා ඇති වූ සංචරන සීමා මැද කිරි කපන දින ප්‍රමාණය අඩු වීමත් රබර් වගා කරන ප්‍රදේශ වල වියළි කාලගුණයක් පැවතීමත් හේතුපාදක විය.

වසරේ දෙවන භාගය තුළ 23.2 කින් රබර් නිෂ්පාදන වර්ධනය වීමට එකී වියළි කාලගුණික තත්ත්වයන් සැලකිය ලෙස බලපෑමක් ඇති කෙරිණි.

සමාගමේ රබර් නිෂ්පාදනය නොවෙනස්ව පැවතිණි. ආයතනයේ රබර් නිෂ්පාදිතය පෙර වසරට වඩා කිලෝ ග්‍රෑම් 192 කින් අඩුවීම තුළින් 0.18 ක පසුබෑමක් සටහන් කෙරිණි.

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පළාත් ඇස්තමේන්තු වලට අනුව සුළු අපනයන භෝග නිෂ්පාදනය 2020 වසරේ දී වර්ධනයක් සටහන් කරමින් 23.3 ක වර්ධනයක් ලබා ගැනීමට හැකි වී ඇත. ඉඟුරු, සියඹලා, කුරුදු, ගම්මිරිස්, කොකෝ, කරාබු නැට් සහ පුවක් ප්‍රමාණය වසර තුල ඉහළ ගොස් සාදික්කා හා වසාවාසි ප්‍රමාණය අඩු වී ඇත. ඉඟුරු, ගම්මිරිස් සහ සියඹලා වැනි අපනයන වගා නිෂ්පාදන මත අපනයන සීමා රජය මගින්

පැනවීම නිසා එවැනි වගා වල නිරත වීමට ගොවියන් වැඩි උනන්දුවක් දක්වනු ලැබීය.

සමාගමේ අතුරු බෝග අංශය ඉතිහාසයේ ඉහළම අගය වාර්තා කරමින් සමාලෝචිත වසර තුල රු. මිලියන 41.99 දායක වී ඇත.

2020 වසරේ දී වෙනත් ආදායම් මාර්ග ද වැඩි විය. පොල් ගස් අලෙවි කිරීම මගින් රු. මිලියන 15.9 ක ආදායමක් එකතු කර දීම යනු පෙර වසරට වඩා රු. මිලියන 6.6 ක අඩු වීමකි. රබර් ගස් අලෙවිය තුලින් රු. මිලියන 3.3 ක් ලැබුන අතර ඵලදරන පෙව වත්කම් අලෙවිය තුළින් මිලියන 19.3 ක මුළු ආදායමක් උපයා ගැනීමට හැකි විය. 2020 දී පාරිභෝජ්‍ය පෙව වත්කම් මගින් රු. මිලියන 7.8 ක වඩා අධික තක්සේරු වාසියක් ලබා ගැනීමට හැකි විය. දැව මිල ගණන් වැඩිවීම නිසා මෙය සිදු වූ අතර එමගින් ශ්‍රී ලංකා දැව සංස්ථාවට තම දැව මිල ගණන් සංශෝධනය කිරීමට හේතු පාදක විය. 2020 වසරේ දී පෙර වසරට වඩා රු. මිලියන 15.5 කින් අතුරු බදු දීම් ගාස්තු ආදායම වැඩි කිරීමට සමාගමට හැකි වූ බව සඳහන් කිරීම වැදගත්ය. මෙයට හේතුව වූයේ අතිරේක භූමි ප්‍රමාණයක් පහසුම පදනම මත බාහිර වගාකරුවන්ට ලබා දීමය. ඒ යටතේ අන්නාසි, ඉඟුරු, කෝමාරිකා සහ බුලත් වැනි කෙටිකාලීන බෝග වගා කෙරිණි. මෙම පියවර දෙපාර්ශ්වයටම සතුටු විය හැකි තත්ත්වයකි. සමාගම බලාපොරොත්තු වන අන්දමට මෙය තවත් ආදායම් ඉපයීමේ මාර්ගයක් ලෙස දැකිය හැකි වන්නේ එමගින් වගාකරු වල් පැල මර්දනය සඳහා වූ වගකීම දැරීම මගින් පිරිවැය අවම කරන එක්තරා ක්‍රමවේදයකි. ඊට අමතරව විවිධ වූ භෝග වර්ග අපගේ වතුයායන් තුළ වගා කිරීම හේතු කොටගෙන ඉතාමත්ම හිතකර ක්ෂුද්‍ර ජීවී පරිසරයක්/පෙව විවිධත්වයක් නිර්මාණය කිරීම සඳහා හේතු වී ඇත. අනෙක් අතට මෙම වෑයම තුළින් වගාකරුවන්ට සැළකිය යුතු අතිරේක ආදායමක් ලබා දෙමින් රටේ දල දේශීය නිෂ්පාදනයට දායකත්වයක් ලබා දීමට අවස්ථාවක් උදා වී ඇත.

කාලගුණික වෙනස්කම් වලින් කෘෂිකාර්මික නිෂ්පාදනයන් සඳහා වන අයහපත් බලපෑම් අවම කිරීම සඳහා විවිධ උපායමාර්ගික ක්‍රමවේදයන් රැසක් අප හඳුන්වා දී ඇති අතර, ජල සම්පාදන ක්‍රමයන් ඇති කිරීම සහ පාංශු තෙතමනය සංරක්ෂණය කිරීම සඳහා පොල් ලෙලි වලවල් ඇති කිරීම ඒ අතර ප්‍රධාන වේ.

අප කාර්ය මඩුල්ල

ගුණාත්මකභාවය, ඵලදායීතාවය, ව්‍යවසායකත්වය, අගය එකතු කිරීම, ලාභදායීත්වය, පරිසර හිතකාමිබව සහ සමාජයීය වගකීම කෙරෙහි නැඹුරු වූ අවංක, දක්ෂ සහ කැපවීමෙන් යුතු සේවා බලකායක් නිර්මාණය කිරීමෙහි අවශ්‍යතාවය පිළිබඳව අපි විශ්වාසය තබමු. අපගේ සේවක මණ්ඩලය බලගන්වනු වස් දෙයාකාර ප්‍රවේශයක් අනුගමනය කරනු ලබයි. ඉන් එක් ප්‍රවේශයක් වන්නේ කාර්යසාධන දිරිදීමනා ඇතුළු සේවක මූල්‍ය ප්‍රතිලාභ සහ මනා නිල නිවාස ඇතුළු මූල්‍ය නොවන ප්‍රතිලාභයි. වසරක කාලය තුළ දී රු. මිලියන 20.4 ක වියදමින් කළමනාකාර බංගලාවක් ඇතුළුව සේවක මණ්ඩල නිල නිවාස 10 ක වැඩ කටයුතු අවසන් කිරීමට හැකි විය. ඊට අමතරව දුෂ්කර ප්‍රදේශයන්හි සේවයේ නියුක්ත කළ සේවකයන් හට විදුලිය, ජල සැපයුම් හා සනීපාරක්ෂක පහසුකම් සැපයීමට කටයුතු කරන ලද අතර විදුලි බලය නොමැති ස්ථාන සඳහා සූර්ය බලශක්ති පද්ධති හෝ භූමිතෙල් හා පොල් ලබා දීමට කටයුතු කර ඇත. දෙවැන්න ලෙස ඔවුන්ගේ දැනුම හා හැකියාව වර්ධනය කිරීම සඳහා පුහුණු සහ සේවක සංවර්ධන වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමයි. ගත වූ මූල්‍ය වර්ෂය තුලදී සියළුම සේවක මට්ටම් නියෝජනය කරන පරිදි පුහුණු වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී.

වන සංරක්ෂණය හා තිරසාර වගා කටයුතු

වගකීමෙන් යුතුව තිරසාර වගා කටයුතු සිදු කිරීම සඳහා අප කැපවී සිටින අතර සමාගම සතු හැකි සෑම භූමියකම වගා කිරීම සඳහා සමාගම කටයුතු කරයි. මීට අමතරව සංරක්ෂිත කැලෑ ආරක්ෂා කිරීම සඳහා කටයුතු කරනු ලැබේ. තිරසාර වගා කිරීම පෙන්නුම් කරන තවත් පැතිකඩක් වන්නේ ප්‍රධාන වගාව තුළ අතුරු බෝග වගා කරමින් එක් ඉඩම් ඒකකයකින් ලැබෙන නිෂ්පාදනය/අස්වැන්න උපරිම තලයකට ගෙන ඒමයි. තවද, මෙම වර්ෂය තුළ සිදු කළ වැදගත් කාර්යයක් වන්නේ සමාගමට පැවරී ඇති සියළු ඉඩම් සහ එක් එක් භෝගය වගා කර ඇති බිම් ප්‍රමාණය මැනුම් කර පැහැදිලිව හඳුනා ගැනීම සඳහා කටයුතු කිරීමයි. මෙය ප්‍රධාන කාර්ය සාධන දර්ශකවලින් යථාර්තවාදී ප්‍රතිරූපයක් පිළිබිඹුවීම සඳහා මහත් පිටුවහලක් වේ.

සාමූහික පාලන වගකීම

ක්ෂේත්‍රයේ භාවිතාවන යහපාලන පරිචයන්ට, වැවිලි ක්ෂේත්‍රයට සහ රාජ්‍ය ව්‍යවසායන්ට බලපාන නීතිරීති වලට අනුගත වෙමින් ඉතා ඉහළ ප්‍රමිතියෙන් යුත් යහපාලන ප්‍රතිපත්ති සහ ව්‍යාපාර පැවැත්මක් ලඟා කර ගැනීම සඳහා අප කැප වී සිටිමු. කෙසේ වුවද, පාලන අධිකාරීන්ගේ ක්‍රියාකාරිත්වය, සමාගමේ ශක්තිමත් මූල්‍ය තත්වය හා ධාරිතාවය උපරිම අයුරින් උකහා ගැනීමට බාධාවක් වී ඇත. මෙම තත්වය කෝප් කමිටුව, රාජ්‍ය ව්‍යවසාය අමාත්‍යාංශය හා සමඟ පැවති බොහෝ සාකච්ඡාවල දී මතු කර පෙන්වා දී ඇති නමුදු මේ සම්බන්ධයෙන් සාර්ථක විසඳුමක් මේ වනතුරුත් ලැබී නොමැත.

නියාමන බාධක නිසා ප්‍රගතිය අඩාලවීම

2005 වසරේ සිට රාජ්‍ය හිමිකාරත්වය යටතේ පවතින කුරුණෑගල වැවිලි සමාගම අදාළ රාජ්‍ය ප්‍රතිපත්ති, නීති හා රෙගුලාසි වලට අනුව තම මෙහෙයුම් කටයුතු කර ගෙන යයි. කෙසේ වුවද, කල්ගත වන අනුමත කර ගැනීමේ ක්‍රමවේදයන් නිසා කාර්යයන් කරගෙන යාමේ දී සිදු වන ප්‍රමාදවීම් පවත්නා ක්‍රමවේදය දැඩි බව අවම කිරීමට අවශ්‍යතාවය ඉස්මතු කර ඇත. විශේෂයෙන්ම ස්වාධීන තීරණ ගැනීමේ දී රාජ්‍ය ආයතන වල ස්වාධීනත්වය තහවුරු කරලීම අත්‍යාවශ්‍ය වනු ඇත.

සමාජ හා ජාතික දායකත්වය

සමාගමේ සාමාජයීය හා ජාතික දායකත්වය උපරිම කිරීම සඳහා උපායශීලී ක්‍රමෝපායක් ලෙස සමාගමේ ඉඩම් අවට ගම්වාසීන්ට සහ වෙනත් බාහිර වගාකරුවන්ට පහසුකම් සැපයීමේ පදනම මත ලබා දේ. මෙම ක්‍රියාදාමය සමාගමට මෙන්ම බාහිර වගාකරුවන්ට වාසිදායක තත්ත්වයක් ඇති කරයි. මේ තුළින් එක් අතකින් සමාගම විසින් වල් මර්දනය කිරීම සඳහා කරනු

ලබන පිරිවැය අඩුවීමක් සිදු වන අතර අනකේ අතින් රටේ දළ දේශීය නිෂ්පාදනයට දායකත්වයක් ලබා දෙමින් වගාකරුවන්ට හොඳ ආදායමක් ලබා ගැනීමටත් අවස්ථාවක් උදා වී ඇත. සමාගමේ අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා ඉහළ කළමනාකාරිත්ව ක්‍රමවේදයන් අනුගමනය කරනු ලබන අතර, එය පසුගිය වසර ගණනාවක් තුළ සමාගම අත්පත් කරගත් ජාතික මෙන්ම ජාත්‍යන්තර ජයග්‍රහණයන් තිුන් ඇගයීමට ලක් ව ඇත. අපගේ මූල්‍ය මෙන්ම මෙහෙයුම් ප්‍රගතිය මෙම කළමනාකාරිත්ව ක්‍රමවේදයන්ගේ සාර්ථකභාවයට සාක්ෂි දරණ අතර කුරුණෑගල වැවිලි සමාගම දිවයිනේ සාර්ථක කෘෂි ව්‍යවසායන් අතර පෙරමුණේ සිටීමට හේතු වී ඇත. මෙම තත්ත්වය ගිණිකොනදිග ආසියාවේ "ආදර්ශමත්ම වැවිලි සමාගම" බවට පත්වීමේ දක්වා යන ගමනේ සාර්ථක සන්ධිස්ථානයක් සනිටුහන් කර ඇත.

සුභවාදී අනාගත දර්ශනය

ඉදිරියේදී ඇති විය හැකි ඕනෑම අහිතකර අවස්ථාවකට මුහුණ දීමට සමාගමට ඇති හැකියාව පිළිබඳව වූ විශ්වාසය තුල ඉදිරි අනාගතය පිළිබඳව ඉතා සුභදායී ලෙස බැලීමට අපට හැකි වී තිබේ. ඉදිරියේදී කාබනික පොල්තෙල් නිෂ්පාදනය වැනි සමාගමේ නිෂ්පාදනයන්ට අගය එකතු කිරීමට හැකි අවස්ථාවන් වෙත යොමු වීමට හා පරිසර හිතකාමී සංචාරක ව්‍යාපාරය වැනි වෙනත් ආදායම් ප්‍රභවයන් කෙරෙහි යොමු වීමට සමාගම බලාපොරොත්තු වේ. එමෙන්ම සමාගමේ විවිධාංගීකරණ ක්‍රියාදාමය තවදුරටත් පුළුල් කරමින් සාර්ථක ස්ථායී ඉදිරි ගමනක් සනිටුහන් කිරීමට බලාපොරොත්තු වන අතර, ඒ සඳහා රාජ්‍ය පුද්ගලික ව්‍යාපාර රාමුවක් තුළින් බාධක ජය ගැනීමට බලාපොරොත්තු වේ.

තුති පිදුම

ගරු වැවිලි කර්මාන්ත අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරන මැතිතුමා, පොල් කිතුල් තල් සහ වගා ප්‍රවර්ධන සහ සම්බන්ධිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන සහ අපනයන විවිධාංගිකරණ පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ගරු අරුන්දික ප්‍රනාන්දු මැතිතුමා වෙත කෘතවේදය පල කිරීමට මා මෙය අවස්ථාවක් කර ගනිමි.

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් රවින්ද්‍ර හේවාවිතාරණ මහතාටත් පොල්, කිතුල් තල් සහ වගා ප්‍රවර්ධන සහ සම්බන්ධිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන සහ අපනයන විවිධාංගිකරණ පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් තිස්ස හේවාවිතාන මහතාටත් මාගේ අවංක ස්තුතිය පුද කර සිටින අතරම තම පූර්ණ සහය හා සහයෝගය අපට පල කළ වෙනත් නිලධාරීන් හට අප ස්තුතිය පිරිනමමු.

අධ්‍යක්ෂ මණ්ඩලයට සම්බන්ධ සියළු කාර්ය සාර්ථකව කරගෙනයාම සඳහා උනන්දුවෙන් සහභාගී වූ සහ නිරතුරුව මා හට ලබා දුන් දැවැන්ත සහාය වෙනුවෙන් හිටපු සභාපතිනි ඒ.වී.කේ. මාධවී හේරත් මහත්මියට සහ මගේ හිතවත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට මාගේ අවංක ස්තුතිය පල කරමි.

එමෙන්ම සමාලෝචිත වසර තුල කළමනාකරන මඩුල්ල ඇතුළු සමස්ත සේවක පිරිසගේ නොමද සහයෝගය සහ කැපවීම සඳහා මාගේ ස්තුතිය එක් කරන අතර ඉදිරියේදී ද ඔබ සියළු දෙනාගේ සහාය මා අපේක්ෂා කරමි. අවසාන වශයෙන් අප සමාගම කෙරෙහි විශ්වාසය තැබූ සමාගම කෙරෙහි උනන්දුවක් දක්වන සියළු පාර්ශ්ව වෙත ස්තුතිවන්ත වන අතර ඔබ සියළු දෙනාගේ අඛණ්ඩ සහයෝගය හා අනුග්‍රහය ඉදිරි අනාගතයේ දීද, මා අපේක්ෂා කරමි.

ආර්.පී.පී. රාජපක්ෂ
සභාපති

ප්‍රධාන විධායක නිලධාරී සමාලෝචනය



2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කිරීමට ලැබීම වෙනුවෙන් කුරුණෑගල වැවිලි සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස මා සතුටු වෙමි.

අපගේ වගා සඳහා නිවරදව්‍ය කෘෂිකාර්මික උපක්‍රම යන අපගේ සංකල්පය සමඟ සමාගම පැහැදිලි සාර්ථකත්වයක් දෙසට ගෙන ගිය තවත් ඵලදායී වසරක් අප අවසන් කර ඇති බව දැනුම් දෙන්නේ සතුටිනි. සමාලෝචිත වසර යනු බොහෝ රටවල ස්වභාවික ආපදා, භෞමික දේශපාලනික ගැටුම් සහ තියුණු දේශපාලන බෙදීම් වලින් පිරුණු අභියෝගාත්මක එකකි.

උක්ත සඳහන් බාධා වීම් වලට අමතරව කුරුණෑගල වැවිලි සමාගම ගතහොත් 2020 වසර යනු සන්ධිස්ථානයකට ළඟා වූ අපූර්වත්වයෙන් යුතු වසරකි. මෙමගින් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම විවිධාංගීකරණය කළ පොල් නිෂ්පාදන සමාගම බවට පත්වීමේ ඉලක්කය වෙත ළඟා වීමට අප කැපවූ කාලයකි. අග්නිදිග ආසියානු කලාපයේ ආදර්ශමත් වැවිලි සහ කෘෂි ව්‍යාපාරික කළමනාකරණ සමාගම පත්වන අප දැක්මට අනුව 2016, 2017, 2018 හා 2019 වසර වල ජාත්‍යන්තර ගම්මිරිස් ප්‍රජා වාර්ෂික උළෙලවල් වල හොඳම ගම්මිරිස් වවන්නා සඳහා වූ ජාත්‍යන්තර සම්මාන දිනා ගැනීම මගින් මෙම ඉලක්කයට ලඟා වීමට අපට හැකි විය.

පොල් අංශය

සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළ දී පෙර වසරේ ලත් ගෙඩි මිලියන 16.3 ට සාපේක්ෂව පොල් ගෙඩි මිලියන 11.4 ක අස්වැන්නක් නෙලා ගැනීමට අප සමාගමට හැකි විය. මෙමගින් සියයට 30 ක පසුබැස්මක් පෙන්නුම් කෙරේ. වියළි කෘෂි දේශගුණික කලාපය තුළ පිහිටි කුරුණෑගල වැවිලි සමාගමේ වතුවල දේශගුණික වෙනස්කම් පොල් අස්වැන්න අඩුවීමෙහිලා වැඩි බලපෑමක් එක් කිරීමට හේතු විය. කෙසේ වුවද, අනුගමනය කළ සාර්ථක කෘෂි විද්‍යාත්මක භාවිතයන් තුළින් නියඟයේ බලපෑම යම් තරමකට පාලනය කර ගැනීමට හැකි විය. ගතවූ වසර කිහිපය තුළ සාර්ථක අස්වනු ලබා දෙන මනා කාෂිකාර්මික හා ක්ෂේත්‍ර කළමනාකරණ ක්‍රමවේද අඛණ්ඩව කර ගෙන යාමට සමාගමට හැකි විය.

යටි වගා සහ පාළු සිටුවීම් ඉතාමත් සාර්ථකව සිදු කරන අතර, එය සමාලෝචිත වර්ෂය අවසානයේ අක්කරයට පොල් ගස් ගණන 57 දක්වා වර්ධනය කර ගැනීම සඳහා හේතු වී ඇත. මෙම සමබර තත්වය ඉදිරි වසර වල ඉතා ඉහළ පොල් අස්වැන්නක් ලැබීමට තහවුරු කෙරේ.

රබර් අංශය

ශ්‍රී ලංකාවේ රබර් නිෂ්පාදිතය වසර 2020 දී සියයට 4.6 කින් වර්ධනය වීම සඳහා ආකර්ෂණීය වෙළඳපොල මිල ගණන් සහ වසරේ දෙවන භාගයේදී පැවති කාලගුණික තත්වයන් බලපානු ලැබීය. කොවිඩ් 19 වසංගතයේ පළමු රැල්ල අවස්ථාවේ කිරි ලබා ගැනීමට හැකි වූ අඩු දින ගණන සහ රබර් වගා කරන ප්‍රදේශවල පැවති වියළි කාලගුණික තත්ත්වය නිසා 2020 පළමු කාර්තුවේ දී රබර් නිෂ්පාදිතය සියයට 10.1 කින් අඩු වුවද, නිෂ්පාදනය කළ සමස්ත රබර් නිෂ්පාදිතය කිලෝ මිලියන 4.6 ක පමණ සිට 39.1 දක්වා වැඩි විය. කෙසේ වුවද 2020 වසරේ දී කොවිඩ් 19 වසංගත බලපෑම මගින් සමාගමේ රබර් නිෂ්පාදනය 0.18 කින් පමණක් අඩු වූ අතර ඵල නොදරන හා පැරණි රබර් ගස් ගලවා ඉවත් කිරීම අඛණ්ඩව සිදු කෙරේ.

වෙනත් භෝග

2005 වසරේ සිටම කුරුණෑගල වැවිලි සමාගම අතුරු බෝග වගා කිරීම සාර්ථකව සිදු කරමින් එම වසරේදී හෙක්ටයාර 59.28 ක් වූ අතුරු බෝග වගා වපසරිය 2020 වන විට හෙක්ටයාර 654.15 දක්වා වර්ධනය කිරීමට හැකි විය. කුරුණෑගල වියළි කලාපීය වතු වල කජු, කුරුදු, ඩ්‍රැගන් ෆෘට්, අඹ සහ අලිගැටපේර වගා කළ අතර ගම්පහ තෙත් කලාපය තුල රඹුටන් හා දූරියන් සාර්ථකව වගා කෙරිණි. වෙනත් බෝග වර්ග ද ගතවූ වසර කිහිපය තුළ සැලකිය යුතු වර්ධනයක් අත් කර ගෙන තිබේ. වෙනත් බෝග වලින් රු. මිලියන 44.14 ක ආදායමක් නෙලා ගැනීම කුරුණෑගල වැවිලි සමාගමට හැකි විය.

උපායමාර්ගය හා අනාගතය

මූල්‍යමය ප්‍රතිඵලයන් කෙරෙහි පමණක් නොව, අඛණ්ඩව පාලන ක්‍රමවේදයන් වල මනා වර්ධනයක් ඇති කිරීම මෙන්ම එම ක්‍රමවේදයන් මනා ශික්ෂණයකින් යුතුව යොදා ගැනීම අභියෝග ජය ගැනීම සඳහා හේතු වූ ප්‍රධානම කාරණා බව මාගේ විශ්වාසයයි. එමෙන්ම, අපගේ ප්‍රධාන ව්‍යාපාරය කෙරෙහි දැඩි හා විශේෂ අවධානයක් යොමු කරන අතරතුර අප සතු ශක්තීන් වටිනාකම් දාමය සහ අප යෙදී සිටින සියළු ව්‍යාපාර අංශ වල

අපගේ තරඟකාරී ස්ථානය යළි යලිත් ඇගයීමට ලක් කරමින් දිගුකාලීන තිරසාර සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා ඇති විකල්ප ක්‍රමවේදයන් කෙරෙහි අවධානය යොමු කිරීම අපගේ ප්‍රතිපත්තියයි.

පසුගිය වසරේ දී ආරම්භ කළ පෞද්ගලික - රාජ්‍ය හවුල් ව්‍යාපාර යෝජනා ක්‍රම කෙරෙහි තවදුරටත් යොමු වීමට සමාගම බලාපොරොත්තු වේ. මෙම ක්‍රමවේදය තුළින් පරිසර හිතෛෂී කෘෂිකාර්මික සංචාරක කර්මාන්තය සහ පරිසරයට හානි නොවන වෙනත් ව්‍යාපෘති යෝජනා කෙරෙහි අවධානය යොමු කරන අතර, ඒ තුළින් පාරිසරික වෙනස්වීම් තුළින් සමාගමේ ලාභදායිත්වය කෙරෙහි වන බලපෑමට එරෙහිව කටයුතු කිරීමට උත්සාහ ගනී. වැඩිවන සේවක පිරිවැය වැවිලි ක්ෂේත්‍රය තුළ ඇති ප්‍රබල අභියෝගයක් වන අතර එයට පිළියමක් ලෙස සමාගමේ පිරිවැය සහ සේවකයන්හට ලැබෙන ප්‍රතිලාභ අතර මනා තුලනයක් ඇති වන පරිදි වූ වැටුප් ආකෘතියක් සැකසීම සඳහා කටයුතු කර ඇත. සෘජු අලවිය මඟින් විකුණුම් ප්‍රවර්ධනය සඳහා වෙනස් වූ අලෙවි උපාය මාර්ගික ක්‍රමවේදයන් සැකසීම සඳහා කටයුතු කර ඇත. පොල් යටි වගා ඇති කිරීමට සමගාමීව බෝග විවිධාංගීකරණය කෙරෙහි යොමුවීම තිරසාර සංවර්ධනය සඳහා අප අනුගමනය කරන තවත් එක් උපාය මාර්ගික ක්‍රමවේදයකි. ලෝක වෙළඳපොල තත්ත්වයන් හා අප වැවිලි සමාගමේ අභිවෘද්ධිය සැලකිල්ලට ගෙන වෙනත් වගාවන් සඳහා නුසුදුසු බිම් කොටස් වල බද්ධ වරකා පැල සිටුවීමේ නියමු ව්‍යාපෘතියක් ද ආරම්භ කර ඇත. එසේම පරිසර හිතකාමී කෘෂිකාර්මික සංචාරක කර්මාන්තය වැනි වෙනත් විකල්ප ව්‍යාපාරික අවස්ථාවන් කෙරෙහි ද නුදුරේදීම යොමු වීමට බලාපොරොත්තු වේ.

පාලනය හා භාරකාරත්වය

ශක්තිමත් ආයතනික යහපාලනය තිරසාර ව්‍යාපාරයක අඩිතාලමයි. ඒ අනුව, පාලන ක්‍රියාවලිය තුළ ඉහළ ගුණාත්මක තත්ත්වයක් පවත්වාගෙනයාම සඳහා දැඩි කැපවීමෙන් කටයුතු කරන අතර එය සමාගම කෙරෙහි උනන්දුවක් දක්වන සියළු පාර්ශ්වයන් සඳහා වන අපගේ වගකීමක් ලෙස අප සළකන්නෙමු. අධ්‍යක්ෂ මණ්ඩලය, කළමනාකාරිත්වය හා ඉතා සමීපව කටයුතු කරමින් කෘෂිකර්මාන්ත මුහුණ දෙන අභියෝග ජයග්‍රහණය කිරීම සඳහා සමාගමට ඇති අවදානම පෙරාතුව හඳුනා ගැනීම, විශ්ලේෂණය හා කළමනාකරණය කරනු ලැබේ.

අනාගත දැක්ම

දිගුකාලීන තිරසාර සංවර්ධන උපාය මාර්ගික ක්‍රමෝපාය අනුව යමින් අඛණ්ඩ සංවර්ධනයක් කරා ගමන් කිරීම හා ඒ තුළින් පොල් අංශය තවදුරටත් සංවර්ධනය කිරීම සහ ඊට සමගාමීව බෝග විවිධාංගීකරණය හා අගය එකතු කිරීම මුල් කරගත් ව්‍යාපාරික රටාවකට යොමුවීම හා ඒ තුළින් ප්‍රාථමික භාණ්ඩ නිෂ්පාදක තත්වයෙන් අගය එකතු කළ භාණ්ඩ නිෂ්පාදකයෙකු බවට පත්වීම අපගේ අභිලාෂයයි.

ඉදිරි අනාගතය වඩාත් සුභදායී එකක් වනු ඇතැයි මා සිතමි. දේශීය පොල් කර්මාන්තය යථා තත්ත්වයට පත්වීම මන්දගාමී ස්වරූපයක් ගනු ලැබුව ද දේශීය පොල් කර්මාන්තය තුළ පොල් සඳහා ඇති ඉල්ලුමෙහි යම් වර්ධනයක් පෙන්නුම් කෙරේ. අනාගත ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අපට යම් කාලයක් ගත වනු ඇත. රබර් කර්මාන්තය ද පසුගිය වසර හතක පසුබැස්ම අවසන් කොට 2021 වසරේ දී නැවත යහපත් තත්ත්වයකට පත් වෙතැයි මම විශ්වාස කරමි. තිරසාර සාර්ථකත්වයක් උදෙසා පොල් හා රබර් යන ප්‍රධාන අංශ දෙකම අඛණ්ඩව ඉදිරියට ගෙන යමින් එම අංශ ඉතා ඉහළ තලයට ගෙන එන අතරතුර ජනිත වන්නා වූ නව අවස්ථා උපරිම අයුරින් ප්‍රයෝජනයට ගැනීම සඳහා කැපවීමෙන් අප කටයුතු කරනු ලැබේ. මේ තුළින් සමාගම කෙරෙහි උනන්දුවක් දක්වන සියළු පාර්ශ්වකරුවන්ගේ සිය වටිනාකම ඉහළ නැංවීම අපගේ අභිලාෂයයි. පරිසර හිතකාමී සංචාරක ව්‍යාපාරය සඳහා මූලික අඩිතාලම සැකසීමට අප ක්‍රියා කරමින් සිටින අතර කුරුණෑගල වැවිලි සමාගමට පමණක් නොව සමස්ථ ශ්‍රී ලංකාවටම විශාල ප්‍රතිලාභයක් ගෙන දෙනු ඇතැයි අපි විශ්වාස කරමු. ඒ හේතුව නිසා අපගේ ඉදිරි ගමනේදී අපගේ ව්‍යාපාරික අංශ නිරතුරුව නියම ලෙස ස්ථානගත කර තිබීම වෙනුවෙන් අප පූර්ණව කැපව සිටින්නෙමු. එතුලින් අවස්ථා ඇති කරමින් දිගුකාලීන ප්‍රතිඵල ලබා දීම තුළින් ව්‍යාපාරයේ නිරත සියලු උනන්දුවක් දක්වන්නන් හට වටිනාකම් ජනනය කිරීමට හැකි වනු ඇත. ඒ අතරතුර වසර ගණනාවක් පුරා අපට සාර්ථකත්වයට පත් කිරීමට හැකිවූ ප්‍රධාන ප්‍රතිපත්ති අප අඛණ්ඩව ආරක්ෂා කරන්නෙමු. මින් අදහස් කරන්නේ කාර්යක්ෂමතාවය කෙරෙහි අඛණ්ඩ අවධානය යොමුව තිබීමත් වටිනාකම් නිර්මාණයේදී ඉදිරියෙන්ම නව්‍යකරණය තුළ අඛණ්ඩව රැඳී සිටීමයි.

අපගේ පාරිසරික සංචාරක කර්මාන්තය හා කෘෂි සංචාරක ව්‍යාපෘති වල මූලික අඩිතාලම දැමීමට අප බලාපොරොත්තු වන අතර එතුළින් සමාගමට පමණක් නොව දිවයිනේ සමස්ත ආර්ථිකයටම අතිමහත් ප්‍රතිලාභ අත්වන බව අප දැන සිටිමු. මේ සඳහා අප සතුව සැළසුම් සහ වෙනත් පාරිසරික පියවර රැසක් තිබෙන අතර ඉදිරි වසරේදී ප්‍රතිඵල අත් කර දෙනු ඇතැයි අප විශ්වාස කරන්නෙමු. අප සමාගමක් ලෙස අපගේ සමස්ත වගා කටයුතු වලදී සහ වෙනත් අපේ ඉදිරි ප්‍රධාන කටයුතුවලදී නිරවද්‍ය කෘෂිකාර්මික ක්‍රමවේද අනුගමනය කරමින් අපගේ සම්පත් වලින් උපරිම ඵලයක් ලබා ගැනීම සඳහා කටයුතු කෙරේ. අග්නිදිග ආසියාවේ සහ නිරිතදිග ආසියානු කලාපයේ වැවිලි නිෂ්පාදනයේ ශ්‍රී ලංකාව ඉදිරියෙන් තැබීම සහතික කරමින් සමස්ත වැවිලි කර්මාන්ත තුළ අපෙගේ දැනුම බෙදා හදා ගැනීමට අප අපේක්ෂා කරන්නෙමු.

සිරස් අනුකලනය

සිරස් අනුකලනය යනු බාහිර කොන්ත්‍රාත්කරුවන් හෝ සැපයුම්කරුවන් පිළිබඳ විශ්වාසය නොතබා තම නිෂ්පාදන ක්‍රියාවලියේ විවිධ අවස්ථා වල සෘජු හිමිකාරත්වය ලබා ගැනීම මඟින් කුරුණෑගල වැවිලි සමාගමට තම මෙහෙයුම් සක්‍රිය කර ගැනීමට මග සකසන ක්‍රමවේදයකි.

සිරස් අනුකලනය යනු කෘෂි වෙළඳපොල ව්‍යුහයට හා තරඟකාරිත්වයට බලපෑම් කරන තීරණාත්මක සාධක වලින් එකකි. පෙරගාමී හා පසුගාමී ඒකාබද්ධතාවය යනු සිරස් අනුකලනය යටතේ තිබෙන ප්‍රධාන ධාරාවන්ය. පෙරගාමී

ඒකාබද්ධතාවය යනුවෙන් හැඳින්වෙන්නේ නිෂ්පාදන නිමි බව දෙසට කෘෂිකාර්මික නිෂ්පාදන ව්‍යාප්තවීම වන අතර බෙදාහැරීම මගින් නිමි නිෂ්පාදන වල ප්‍රමාණය අප පුළුල් කරමින් අලෙවිකරණයට පිවිස සිටී. නිෂ්පාදන සිරස් තුළ වූ මූලික විෂයයන් වලින් යෙදවුම් භාවිතා කරන පූර්වගාමී අදියර දෙසට යොමුවීම පසුගාමී ඒකාබද්ධතාවය යනුවෙන් හඳුන්වයි. සිරස් අනුකලනයේ මට්ටම පුද්ගල ව්‍යාපාර වල සිට එක් එක් ක්ෂේත්‍රය අතර වෙනස් වේ. දේශීය හා විදේශීය වෙළඳපොලවල් දෙකේම ආයතනික තරගකාරිත්වය වැඩි කිරීමට වෙළඳපොල සම්බන්ධීකරණය සිදු කිරීම සඳහා සිරස් අනුකලනය ගනුදෙනු සමාග්‍රහනය කළ යුතුව ඇත. සමාලෝචිත වර්ෂය තුළ වටිනාකම් එකතු කළ නිෂ්පාදන ප්‍රමාණය පුළුල් කිරීමට පෙරගාමී ඒකාබද්ධ ක්‍රමවේද පිළිබඳව කුරුණෑගල වැවිලි සමාගම අවධානය යොමු කර ඇත.

අපගේ සමස්ත වැවිලි වර්ග තුළ සහ වෙනත් වැදගත් මැදිහත්වීම් පුරා නිවැරදි වගා ක්‍රමවේදය ක්‍රියාවට නැංවීම මගින් අපගේ සම්පත්වලින් වැඩි ප්‍රමාණයක් යොදා ගැනීමට අප කටයුතු කරමින් සිටිමු. තවද, අග්නිදිග ආසියාවේ සහ අග්නිදිග ආසියානු කලාප වල වැවිලි නිෂ්පාදනය උපරිමයට ශ්‍රී ලංකාව තුළ ගෙන එමින් සමස්ත වැවිලි ක්ෂේත්‍රය සමග අපගේ දැනුම බෙදා හදා ගැනීමට අප බලාපොරොත්තු වෙමු.

ඇගයීම හා තුති පිදීම

ගරු වැවිලි කර්මාන්ත අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමා, පොල් කිතුල් තල් සහ වගා ප්‍රවර්ධන සහ සම්බන්ධිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන සහ අපනයන විවිධාංගිකරණ පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ගරු අරුන්දික ප්‍රනාන්දු මැතිතුමා වෙත කෘතවේදය පල කිරීමට මා මෙය අවස්ථාවක් කර ගනිමි. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් රවින්ද්‍ර හේවාවිතාර මහතාටත් රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් තිස්ස හේවාවිතාන මහතාටත් මාගේ අවංක ස්තුතිය පුද කර සිටින අතරම තම පූර්ණ සහාය හා සහයෝගය අපට පල කළ අමාත්‍යාංශයේ වෙනත් නිලධාරීන් හට අප ස්තුතිය පිරිනමමි.

අපව ධෛර්යමත්ව මෙහෙයවනු ලැබූ අපගේ සභාපතිවරයා වන ආර්.පී.ජී. රාජපක්ෂ මහතාට, තම වටිනා යෙදවුම්, උනන්දුව හා සහාය සැම අවස්ථාවකදීම දක්වමින් කටයුතු කළ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මාගේ අවංක ස්තුතිය පුද කරමි. අවසන් වශයෙන් කුරුණෑගල වැවිලි සමාගමේ ලේකම්වරු ලෙස කටයුතු කරන සීමා. කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් ආයතනය හා වසර තුළදී විවිධාකාරව සමාගමේ සාර්ථකත්වයට උර දුන් අපගේ වෙනත් සියළුම උනන්දුවක් දක්වන්නන් හට ද මාගේ ස්තුතිය පිරිනමමි.

තවද, සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම තම සුවිශේෂී ජයග්‍රහණ අඛණ්ඩව අත්පත් කර ගැනීම සඳහා කැපවීම දායකත්වය හා යටහත්බව සහිතව වැඩ කරමින් අපගේ කාර්යක්ෂම ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව කණ්ඩායමට, පළාත් වතු අධිකාරිවරුන් සහ සියළුම සේවකයන් හට මාගේ කෘතවේදිත්වය පල කරමි.

Samarakoon

එස්.එම්.එම්. සමරකෝන්
ප්‍රධාන විධායක නිලධාරී



ආර්.පී.පී. රාජපක්ෂ මහතා
සභාපති

රාජපක්ෂ මහතා 2021 ජූලි 09 වන දින සීමා. කුරුණෑගල වැවිලි සමාගමේ සභාපතිවරයා ලෙස පත් විය. තම ව්‍යාපාරික කළමනාකරණය (මූල්‍ය) පිළිබඳ උසස් උපාධිය 2012 දී "සදර්න් ක්වීන්ලන්ඩ්" විශ්ව විද්‍යාලයෙන් ලබා ගෙන ඇත. රාජපක්ෂ මහතා ව්‍යාපාර හා මූල්‍ය පරිපාලනය පිළිබඳ තම පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (2006/7) වික්සත් රාජධානියේ ක්‍රෑන්ෆීල්ඩ් කළමනාකරණය සඳහා වූ විශ්ව විද්‍යාලයෙන් දිනා ගෙන ඇත. තවද ගිණුම්කරණය) මූල්‍ය (ICASL) පිළිබඳ උසස් ඩිප්ලෝමාව (2005/6) සහ වරලත් ගණකාධිකරණ - අන්තර්කාලීන සහතිකය (2003) ලබා ගත් අයෙකි. තවද, MS ඔෆිස් පිළිබඳ පරිගණක පුහුණු පාඨමාලා සහ කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය (ලංකා කොමර්ෂල් බැංකුව) මගින් පැවැත්වූ "වික්සෙල් යෙදවුම" මෙන්ම ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨය මගින් පැවැත්වූ පරිඝණක දැනුවත් කිරීමේ වැඩසටහන රාජපක්ෂ මහතා අවසන් කර ඇත. අලෙවි සහ අලෙවි කිරීමේ සංගමය (වික්සත් රාජධානිය) යටතේ ණය කළමනාකරණ සඳහා ව්‍යවසායක ප්‍රවේශය දේශීය ආයතනය වැඩමුළුවට සහභාගි වී ඇත. එමෙන්ම වෝවික් විශ්ව විද්‍යාලයේ සන්නිවේදනය සඳහා ඉංග්‍රීසි දෙවන තලයේ සහතිකලාභියෙකි.

1996 වසරේ දී සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ගිණුම් ලිපිකරුවෙකු (2 වන ශ්‍රේණිය) තම වෘත්තීය ගමන ඇරඹූ රාජපක්ෂ මහතා 2008 වසරේ දී ගණකාධිකාරි - ණය පාලන ලෙස උසස්වීම් ලබා ඇත. වසර 2011 සිට 2012 දක්වා තම පවුලේ පිරිස සමඟ පිලිපීනය බලා ගිය අතර ඒ මහතාගේ භාර්යාව අධ්‍යයන කටයුතු වලත් රාජපක්ෂ මහතා පුද්ගලික ආචාර්යවරයෙකු ලෙස ස්වයං රැකියාවක නිරත විය. වසර 2012 සිට 2016 දක්වා සීමා. ප්‍රොමෝ ටීවිස් පුද්. සමාගමේ ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරවරයෙකු ලෙසත් 2016 සිට 2018 දක්වා ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරයෙකු ලෙස සිංගප්පුරුවේ සීමා.කීත් මෝටන් සිකියුරිටි ආයතනයේ නියුක්ත විය. 2018 දී ඉරෂ්මා ෆැබ්රික් ප්‍රින්ටිං සොලුයුෂන් ආයතනය අරඹමින් එහි සමාරම්භකයා හා හිමිකරු බවට පත්විය. 2020 නොවැම්බර් 01 දින සිට වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යවරයාගේ උපදේශකයා ලෙස ඔහු පත් කෙරිණි.



ඩබ්ලිව්.ඩී.ආර්. ක්‍රිශාන්ත මහතා
අධ්‍යක්ෂ - භාණ්ඩාගාර නියෝජිත

2020 ජනවාරි මස 11 වන සිට ක්‍රියාත්මක වන පරිදි සීමා. කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂ/භාණ්ඩාගාර නියෝජිතයා ලෙස පත් කර ඇති ක්‍රිශාන්ත මහතා මහා භාණ්ඩාගාරයේ අධ්‍යක්ෂ ධුරයක් හොබවමින් අභ්‍යන්තර සංචිත ණය කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ධුරයේ වගකීම දරයි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාරික සංඛ්‍යාලේඛන (විශේෂ) උපාධිය 1999 දී සපුරා ඇති ඒ මහතා ජාත්‍යන්තර හා සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ තම පශ්චාත් උපාධිය 1999 දී කැන්බෙරා හි ඕස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලයෙන් (ANU) දිනා 2013 වසරේ දී තම මූල්‍ය ආර්ථික විද්‍යා උපාධිය කොළඹ විශ්ව විද්‍යාලයෙන් ලබා ගෙන ඇත.

මහා භාණ්ඩාගාරයේ ජාතික සැළසුම් සංවර්ධන අංශයේ සහකාර අධ්‍යක්ෂවරයෙකු ලෙස 2002 සිට 2010 කටයුතු කළ ක්‍රිශාන්ත මහතා අනතුරුව 2011 සිට 2013 දක්වා නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවා උසස්වීමක් ලබා 2013 සිට මේ දක්වාම එහි බාහිර සංචිත කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ධුරය හොබවයි. ලංකා විදුලිබල මණ්ඩලයේ උප ආයතනයක් වන සීමාසහිත ලංකා ට්‍රාන්ස්පෝමර්ස් සමාගමේ (LTL) 2015 සිට 2019 දක්වාත් 2016 සිට 2019 දක්වා දේශීය වෛද්‍ය ආයතනයේ (IIM) මහාභාණ්ඩාර නියෝජිත ලෙස අධ්‍යක්ෂ මණ්ඩලවල කටයුතු කර ඇත. මීට අමතරව, රාජ්‍ය හිමිකම ඇති ආයතන ගණනාවක මහාභාණ්ඩාගාර නියෝජිත ලෙස අධ්‍යක්ෂ මණ්ඩලවල තම දායකත්වය 2003 සිට ලබා දී ඇත.



එම්.කේ.පී. රුක්මණී මිය
අධ්‍යක්ෂ

එම්.කේ.පී. රුක්මණී මිය සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂවරියක ලෙස 2021 ජූලි 21 දින සිට පත් කෙරිණි. රුක්මණී මිය පොල්, කිතුල්, තල්, හා රබර් වගා ප්‍රවර්ධන සහ ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී ලෙස කටයුතු කරයි.

උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (HNDA) ධාරිනියක වන රුක්මණී මිය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ (CA) මධ්‍ය තලය සහ ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ (AAT) අවසන් අදියර ද සමත්ව සිටී. 2005 වසරේ දී ගිණුම්කරණ සේවයට එක් වෙමින් තම වෘත්තිය දිවියට පිවිසි ඇය පළමුවන පංතියට උසස්වීම ලැබුවේ 2015 වසරේ දීය. ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ බදුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයේ, ඌව පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ඌව පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ගණකාධිකාරී ලෙස කටයුතු කර ඇති ඇය, දිවුලපිටිය හා ඉමදූව ප්‍රාදේශීය ලේකම් ලෙස සේවය කර ඇත.



එච්.ඒ. නදීක හෙට්ටිආරච්චි මහතා
අධ්‍යක්ෂ

නදීක හෙට්ටිආරච්චි මහතා සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස 2020 ජනවාරි 15 දින සිට පත් විය. ඖෂධ නිෂ්පාදන තොග හා සිල්ලර ව්‍යාපාරයක් වන එන් එස් ෆාමසිටිකල් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ ලෙස නදීක මහතා කටයුතු කරයි. කළමනාකරණ අත්දැකීම් වලින් පිරිපුන් ඒ මහතා සමාගමට සුවිශේෂී දායකත්වයක් දීමට උපරිම හැකියාවන් ඇති බැවින් හොඳම ආයතනයක් බවට පත් කිරීමට උර දෙනු ඇති බවට අපගේ බලාපොරොත්තුවයි.

ශ්‍රී නිශ්ශංකමල්ල මහා විද්‍යාලයේ අධ්‍යාපනය ලබා ශ්‍රී ලංකා කැළණිය විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාරික කළමනාකරණ උපාධි පාඨමාලාවට ඇතුළත් ව 2005 දී උපාධිය සම්පූර්ණ කර ගෙන ඇත. අනතුරුව සීමා. වයඹ ඩයග්නෝස්ටික් මෙඩිකල් ලැබරේටරි (පුද්.) සමාගමේ මහජන සම්බන්ධතා කළමනාකරු ලෙස සේවය කර වෙළඳ අමාත්‍යාංශය යටතේ ඇති පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ විමර්ශන නිලධාරී (දෙවන ශ්‍රේණිය) ලෙස රාජකාරියේ නිරතව සිටි අයෙකි.

කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අනුර ප්‍රියදර්ශන යාපා සහ අමාත්‍ය ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු යන අමාත්‍යවරුන්ගේ සම්බන්ධීකරණ ලේකම් ලෙස කටයුතු කර ඇති ඒ මහතා කුරුණෑගල ප්‍රදේශයේ ප්‍රමුඛ ව්‍යාපාරිකයෙකි.



ඩබ්ලිව්.ඒ.ජේ.ජී.ඩී. විජේසිංහ මහතා
අධ්‍යක්ෂ

විජේසිංහ මහතා සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස 2020 ජනවාරි 15 දින සිට කටයුතු කර ඇත. තොරතුරු තාක්ෂණය පිළිබඳ හසල දැනුමක් ඇති ඒ මහතා ව්‍යවසායකයෙකු ලෙස ජ්‍යේෂ්ඨ කළමනාකරණ තලයෙන් පුළුල් අත්දැකීම් ලැබූවෙකි.

කුරුණෑගල මලියදේව විදුහලේ සිප්සතර ලබමින් උසස් පෙල විභාගය සඳහා 2002 වසරේ දී පෙනී සිට ඇත. ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ දී තොරතුරු තාක්ෂණ උපාධිය සාර්ථකව දිනා ගෙන ඇති ඒ මහතා කුරුණෑගල දේශප්‍රිය සමූහ ව්‍යාපාරයේ කළමනාකාර අධ්‍යක්ෂ ලෙස දැනට කටයුතු කරයි.



එච්.සී.එම්.එම්. කුලසේකර මහතා
අධ්‍යක්ෂ

කුලසේකර මහතා සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස 2020 පෙබරවාරි 05 දින සිට කටයුතු කෙරිණි. කුරුණෑගල ශාන්ත ආනා විදුහලේත් මීගමුවේ ශාන්ත මේරි විදුහලේත් අධ්‍යාපනය හදාරා ඇති ඒ මහතා මනා අත්දැකීම් සහිත ව්‍යාපාරිකයෙකි.

තම උසස් පෙළ විභාගය අවසන් කර තම පවුලේ ව්‍යාපාර වලට සම්බන්ධ විය. ඒ මහතා රථවාහන හා අමතර කොටස් ආනයනය හා අලෙවිකරණ මොහු වෙළඳ සමාගමේ අධ්‍යක්ෂවරයෙකි.



තමින්ද එදිරිවික්‍රමසූරිය මහතා
අධ්‍යක්ෂ

කොළඹ ශාන්ත පීතර විදුහලෙන් සිප් සතර ලැබූ වික්‍රමසූරිය මහතා තම ජීවිකාව ලෙස ව්‍යාපාරිකයෙකු ලෙස කටයුතු කරයි. සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස 2021 වසරේ දී ඔහුව පත් කර ඇත.

ඊට අමතරව වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මහතාගේ සම්බන්ධීකරණ ලේකම් ලෙස රාජකාරියේ නියුතු මේ මහතා සීමා. ඔටෝ ලංකා (පුද්.) සමාගමේ, තමින්ද ඉදිකිරීම් සමාගමේ සහ කිතුල මෝටර්ස් හි අධ්‍යක්ෂ ලෙස තම ව්‍යාපාර වල නිරතව සිටී.

ක්‍රීඩා ලෝලියෙකු වන ඔහු බැඩ්මින්ටන් ක්‍රීඩාව කෙරෙහි විශේෂ උනන්දුවක් දක්වන්නෙකි.



ප්‍රධාන විධායක නිලධාරි
ආචාර්ය එස්.එම්.එම්. සමරකෝන් මහතා
PHD, M. Sc. (Agric.Econ.)
B. Sc. (Agriculture) Hons.



නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
ඒ.එම්.එස්.බී. අත්තනායක මහතා
M.Sc. Agriculture
B.Sc. Agriculture



කළමනාකරු - මූල්‍ය
ඩී.අයි.කේ. දිසානායක මහතා
B.B. Mgt. (Human Resource)
(Special),
CBA,



කළමනාකරු - මානව සම්පත් හා පරිපාලන
අයි.ඒ. ගුණවර්ධන මහතා
B.B. Mgt. (Human Resource) Hons.
PG Dip M (SL)



කළමනාකරු - වතු අධීක්ෂණ
සහ සම්බන්ධීකරණ
එස්.එම්.ආර්.පී. සත්කුමාර මහතා
B. Sc. (Agricultural Sciences)
Specializing Plantation Management



කළමනාකරු - අලෙවි
ජේ.කේ.ජේ.පී. ජයවර්ධන මහතා
M.Sc. (Agricultural Extension)
B. Sc. (Agriculture)



කළමනාකරු - විගණන
එම්.කේ.එන්. අබේදීර මහතා
Bachelor of Commerce (Special)
CBA

වතු අධිකාරිවරු



ජී.කේ.ඒ. ජයවර්ධන මහතා



කේ.එල්.එච්.සී. පෙරේරා මහතා
Dip. In Animal Husbandry



ආර්.එම්.ජී.යූ. ප්‍රසාන්ත මහතා
B.V.Sc. Registered Veterinary Surgeon & Practitioner



එම්.ටී.ජේ. පෙරේරා මහතා
B.Sc. (Agriculture) (Special) Hons



ජේ.එම්.ඒ.ඒ. මුනසිංහ මහතා
NDT in Technology (Agriculture)
B.Sc. Plantation Management



ඩබ්.එම්.ජී.කේ.බී. වීරසිංහ මහතා
B.Sc. Plantation Management
MBA



එස්.එල්.පී. විතානගේ මහතා
B.Sc. Plantation Management

- වැවිලි ක්ෂේත්‍රය සම්බන්ධ සමාගමක් ලෙස අප තිරසාරත්වය අර්ථ දක්වන්නේ ආර්ථික, සමාජයීය සහ පාරිසරික වශයෙන් ඒකාබද්ධ වූ ක්‍රියා පිළිවෙතක් මගින් වර්ධනයක් අත්පත් කර ගැනීමයි. ආර්ථික තිරසාරත්වය බවට මූලිකවම පරිවර්තනය වන්නේ සමාගමේ මූල්‍ය තිරසාරත්වයයි. ඒ මගින් ජාතියට රජයට හා සේවකයන්ට ආර්ථික ප්‍රතිලාභ අත්විම සහතික කෙරේ. කෘෂිකර්මය මත පදනම් වූ ක්‍රියාදාමයන් තුළ අපගේ මූල්‍ය තිරසාරත්වය පාරිසාරික තිරසාරත්වය සමඟ බැඳී පවතී. ඒ නිසාම අපගේ ව්‍යාපාරික කටයුතු වලට උපකාරී වන ස්වභාවික පරිසරය හා පාරිසරික පද්ධති සංරක්ෂණයට අප බැඳී සිටිමු. මෙය අර්ථ දැක්වෙන්නේ තිරසාර භූමි සහ ජල පරිහරණය සහ ස්වභාවික සම්පත් ආරක්ෂා කරමින් තිරසාර කෘෂිකාර්මික පිළිවෙත් සිදු කිරීම යනුවෙනි. මීට අමතරව සමාජීය තිරසාරත්වය සහතික කරනු සඳහා අපගේ වතු ආශ්‍රිතව වෙසෙන ජනයා සමඟ අන්‍යෝන්‍ය සම්බන්ධතා පැවැත්වීම මගින් ඔවුන්ද අපගේ ව්‍යාපාරික කටයුතු වල වැදගත් පාර්ශ්වකරුවන් බවට පත් කර ගෙන ඇත්තෙමු. රාජ්‍ය ආයතනයක් ලෙස සමස්ථ පොදු ජනයාට අපගේ වගකිව යුතු බව පිළිබඳව මනාව දැනුවත්ව සිටින්නෙමු. විනිවිදභාවයෙන් යුත් ක්‍රියාපිළිවෙත් අනුමනය කිරීම, නීතිපතා අධීක්ෂණය හා ඇගයීම් සිදු කිරීම සහ නිසි වාර්තා කිරීමේ පිළිවෙත් මගින් දූෂණ හා වැරදි ක්‍රියාවන් නැති කිරීම මගින් යහපාලනයක් ඇති කිරීමට අප කැපව සිටින්නෙමු.

තිරසාර කෘෂිකාර්මික පිළිවෙත්

- අපගේ සියළුම වතු යායන් තුළ භූමියේ ඵලදායීතාවය වැඩි කිරීම, බෝග විවිධාංගීකරණය සහ යටි වගා ඇති කිරීම තුළින් තිරසාර කෘෂිකාර්මික කළමනාකරණ පිළිවෙතක් ක්‍රියාත්මක කර ඇත. අක්කරයකට වගා කළ හැකි උපරිම පොල් ගස් ප්‍රමාණය ස්ථාපිත කිරීමේ ප්‍රතිපත්තිය සාර්ථක කර ගැනීම අප විසින් අතිවිශාල ප්‍රයත්නයක් දරා ඇත. සුදුසු සියළුම ඉඩම් හඳුනාගෙන මේ වන විට යටි වගා සිදු කර ඇත. 2020 වසර අවසානයේ යටි වගා සහිත අක්කර ප්‍රමාණය මේරූ පොල් වගා වපසරියෙන් 23% (හෙක්ටයාර් 857.98) ලෙස වාර්තා වූ අතර එම වසර තුළ රු. මිලියන 103 ක් නොමේරූ පොල් යටි වගා සඳහා යොදවා තිබේ. අක්කරයකට සිටුවන ගස් ප්‍රමාණයේ මෙම වර්ධනය සමාගමේ අනාගත පොල් ඵලදාව වැඩි වීමට නිසැකව හේතු වන අතර එතුළින් සමාගමේ තිරසාරත්වය වඩාත් ශක්තිමත් වනු ඇත. සී සෑම, රසායනික පොහොර භාවිතය අවම කරමින් කාබනික පොහොර භාවිතය වැඩි කිරීම, බෑවුම් සහිත ඉඩම් සඳහා වගා තාක්ෂණය යොදා ගැනීම, ආවරණ භෝග වගා ව්‍යාප්තිය, සමෝච්ඡ කානු කැපීම වැනි සාධනීය කෘෂිකාර්මික පිළිවෙත් මගින් අපගේ ඉඩම්වල ඵලදායීත්වයේ තිරසාර වර්ධනය සහතික කර ඇත. කාබනික පොහොර, පසේ සාරවත්බව, තෙතමනය රඳා පවත්වා ගැනීමේ හැකියාව, පාංශු වයනය, පසේ ව්‍යුහය සහ ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරිත්වය වර්ධනය කිරීම සඳහා හේතු කාරක වේ. මෙකී සාධනීය පාංශු සාධක මනා කෘෂිකාර්මික ක්‍රමවේදයන් සහ අපගේ ඉඩම් වල තිරසාරත්වය වැඩි කිරීමට හේතු වේ.

වගාවන් සඳහා කෘතීම රසායන ද්‍රව්‍ය භාවිතාව අවම කිරීම

- පාරිසරික සුරක්ෂිතතාවය පිළිබඳව සමාගම උනන්දු වෙමින් රසායනික වල් නාශක, කෘමිනාශක සහ දිලීර නාශක සහ රසායනික පොහොර භාවිතාව අවම කර ඇති අතර, ඒ සඳහා විකල්පයක් ලෙස ජෛව විද්‍යාත්මක හා යාන්ත්‍රික පාලන ක්‍රමයන් යොදා ගැනීමට සහ කාබනික පෙහොර භාවිතාව වැඩි කිරීම වැනි ක්‍රමෝපායන් යොදා ගැනීමට පියවර ගෙන ඇත.

ජෛව විද්‍යාත්මක පාලනය

- පොල් වගාවල සිටින සාමාන්‍ය මයිටා පාලනය කිරීම සඳහා විලෝපිත මයිටාවන් යොදා ගැනීම - විලෝපිත මයිටාවන් නිපදවීම කටුගම්පල පිහිටි අංග සම්පූර්ණ විද්‍යාගාරය තුළ සිදු වේ. මෙම පාරිසරික හිතකාමී ක්‍රමවේදය මගින් අතිසාර්ථක ප්‍රතිඵල අත් කර ගැනීමට හැකි වී ඇත.

- පළතුරු වගා වලට හානි ගෙන දෙන පළතුරු මැස්සන් සහ පොල් වගාවට තර්ජනයක් වී ඇති රතු කුරුමිණියන් පාලනය කිරීම සඳහා පෙරමෝන් උගුල් භාවිතය.

- කජු වගාවට හානි කරන හෙලෝපෙල්ටිස් මදුරුවා පාලනය කිරීමට දිමියන් යොදා ගැනීම (සොලෙනොපිසිස් වර්ග)

යාන්ත්‍රික පාලනය

- වර්තමානය වන විට විවිධ අවස්ථාවල දී වල්නාශකයක් ලෙස ග්ලයිපොසෙට් භාවිත කිරීම පිළිබඳව සමාජ කථිකාවතකට ලක් වී ඇති අතර රජය ඒවා භාවිතය තහනම් කිරීමට තීරණයක් ගෙන ඇත. වල් පැල මර්ධනයට විකල්පයක් ලෙස පහත දැක්වෙන ක්‍රම අප අත්හදා බලමින් හා තක්සේරුවට ලක් කරමින් සිටී.

- පස පෙරලීම, කැට පොඩි කිරීම හා වල් කැපීම සඳහා යන්ත්‍ර භාවිතය
- තණකොල උලා කෑමට ඉඩදීම
- ආවරණ බෝග වගා කිරීම
- පොහොර කවයන්ට වසුන් යෙදීම

කාබනික පොහොර භාවිතය

- සමාගම කාබනික පොහොර භාවිත කිරීම මගින් රසායනික පොහොර භාවිතාව අඩු කිරීමට සාධනීය පියවර ගෙන ඇත. අපගේ වගාවන් තුළ රසායන ද්‍රව්‍ය භාවිත අවම කිරීම

සඳහා රසායන ද්‍රව්‍ය භාවිතය හා පරිහරණය කිරීම මනාව අධීක්ෂණය කරනු ලැබේ. ක්ෂේත්‍ර මට්ටමේ රසායනික ද්‍රව්‍ය ඉසීම සහ භාවිත කිරීමේ යෙදී සිටින සේවකයන් එහිදී අනුගමනය කළ යුතු ආරක්ෂිත ක්‍රමවේදයන් පිළිබඳව මනාව දැනුවත් කිරීමට සමාගම කටයුතු කරයි.

ජෛව විවිධත්වය

- අප සතු සියළු වතුවල ජෛව විවිධත්වය වර්ධනය කිරීමට අප සක්‍රියව කටයුතු කරන්නෙමු. අතුරු බෝග හා දැව සඳහා සුදුසු වර්ගවලට උචිත භූමි ප්‍රමාණ ඉදිරියේ දී ව්‍යාප්ත කරලීමට හා වත්මන් භූමි ප්‍රමාණය හඳුනා ගැනීමට යන දෙකටම අදාළ තක්සේරු අප සාර්ථකව සිදු කර ඇත්තෙමු. සමාගම වටිනාකම්න් යුත් දැව ගස් පාරිභෝජ්‍ය ජෛව වත්කමක් ලෙස හඳුනා ගෙන ඇත. මේරූ දැව ගස් හෙලීම පරිසර අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, අදාළ අමාත්‍යාංශ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යන ආයතන වලින් අවශ්‍ය අනුමැති ලබා ගැනීමෙන් අනතුරුව සිදු කෙරේ. තිරසාරත්වය සුරක්ෂිත කරනු වස් හෙලනු ලබන දැව ගස් සඳහා නැවත දැවමය වටිනාකමක් සහිත ගස් ක්‍රමානුකූලව ස්ථාපිත කිරීමට සමාගම කටයුතු කර ඇත.

සේවක ප්‍රතිලාභ හා උනන්දු කරවීම්

- සමාගමේ සේවකයන් සඳහා ආරක්ෂිත සිත් ඇදගන්නා සුළු සහ ඵලදායී පරිසරයක් නිර්මාණය කිරීමේ වැදගත්කම අප විසින් මනාව අවබෝධ කර ගෙන සිටී. වඩාත් වටිනාම සම්පත් වන්නේ සුදුසුකම්ලත් අත්දැකීම් බහුල වෘත්තිය නිපුනතාවයකින් අපගේ සේවකයන් බව අප විශ්වාස කරන්නෙමු. ඉහළ මට්ටමේ වෘත්තීයවේදිත්වයක් සහ දැනුමක් නොමැතිව අපගේ වැවිලි කර්මාන්තය ලාභදායී අයුරින් මෙහෙයවීම කළ නොහැකි බව පැහැදිලිය. අදාළ කුසලතා හා දැනුමෙන් සන්නද්ධ මානව ප්‍රාග්ධන පදනමක් සකසා පවත්වා ගෙන යාමට සමාගම නිරතුරුව උත්සුක වේ. 2020 වසර අවසානය වන විට සමාගමේ සමස්ත ශ්‍රම බලකාය 1,135 කි.

- කාර්යසාධන පාදක දිරිදීමනා ගෙවීම

  2005 වසරේ සිට ආරම්භ කළ කාර්යසාධනය මත පදනම් වූ දිරිදීමනා ගෙවීම අඛණ්ඩව සිදු කරන අතර, එතුළින් අප සේවකයන් මනා කාර්යසාධනයක් පෙරලා ලබා දීමට උත්තේජනයක් සැපයේ. 2020 වසරේ දී රු. මිලියන 36 ක මුදලක් කාර්යසාධන පදනම් වූ දිරිදීමනා ගෙවීමට මූල්‍ය ප්‍රකාශණවල වෙන් කර ඇත. 2019 වසරේ දී එය රු. මිලියන 20 ක් විය. මෙම ප්‍රතිපාදන ප්‍රමාණය සලසා ඇත්තේ මාසිකව වැටුප් ලබන සේවකයන්ගේ මාස දෙකක් සේවක අර්ථ සාධක අරමුදලට සමාන මුදලක් සහ දෛනික වැටුප් ලබන සේවකයන්ට දිරි දීමනා ලෙස රු. 15,500/- ගෙවීම සඳහාය.

අප කාර්ය මණ්ඩලයට ලැබෙන වෙනත් ප්‍රතිලාභ:

- අඩු පොලී අනුපාත යටතේ වූ ආපදා ණය පහසුකම
- පාසැල් පොත් හා ඇඳුම් සඳහා පොලී රහිත ණය
- ගෙඩියකට රුපියලක නාමික වටිනාකම මත පාරිභෝජනය සඳහා සීමිත පොල් ප්‍රමාණයක් සියලු සේවකයන් සඳහා සැපයීම
- වැටෙන පොල් ඇහිදීම සහ මුරකරුවන්ගේ මාසික පැමිණීම මත දිරි දීමනා ගෙවීම
- විදුලි පහසුකම් නොමැති ස්ථානවල මුරකරුවන්ට භූමිතෙල් දීමනාව ලබා දීම
- සියළුම සේවකයන් සඳහා සේවක වන්දි රක්ෂණ ආවරණයක් සැපයීම
- විධායක නිලධාරීන් සඳහා රුපියල් මිලියනයක පුද්ගල අනතුරු රක්ෂණාවරණයක් දීම
- එක් එක් විධායක නිලධාරි පවුල් ඒකකය සඳහා රුපියල් 400,000/- ක සෞඛ්‍ය රක්ෂණ ආවරණයක්
- කාර්ය මණ්ඩල සේවකයන්ගේ උසස් අධ්‍යාපනය වෙනුවෙන් මූල්‍යාධාර සැපයීම
- සේවක දරුවන් සඳහා උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ලබා දීම
- ලබා නොගත් ලෙඩ නිවාඩු වෙනුවට මසක වැටුපට සමාන මුදල ගෙවීම

නේවාසික පහසුකම්

- ගත වූ වසර කිහිපය පුරා අපගේ වතුයායන් හි පිහිටි නිවාස වල තත්ත්වය වැඩිදියුණු කිරීමට අප දැඩි උත්සාහයක් ගන්නා ලදී. නේවාසික සේවකයන් පිළිබඳව සමාගම නිතර උනන්දුවෙන් පසුවෙමින් විදුලිය සහ සනීපාරක්ෂක පහසුකම් සහිත වඩා කදිම නිල නිවාස ලබා දී ඇත. අදාළ වසර තුළදී ජලය, විදුලිය හා සනීපාරක්ෂක වැනි මූලික පහසුකම් සහිතව කළමනාකරු නිල නිවසක් ඇතුළුව සේවක නිල නිවාස දහයක් (10) ඉදි කර ඇත.

සේවක පුහුණුව හා සංවර්ධනය

- ඵලදායිතාව වැඩිදියුණු කරලීම තහවුරු කිරීම වස් අපගේ කාර්ය මණ්ඩලයට අවශ්‍ය නිපුණතාවය, දැනුම සහ ආකල්ප සංවර්ධනය සඳහා සමාගම අඛණ්ඩව ආයෝජනයන් සිදු කරයි. අඛණ්ඩ අධ්‍යයනය මෙන්ම පුද්ගල සංවර්ධනය ඉලක්ක කර ගනිමින් විවිධ සේවස්ථ බාහිර පුහුණු වැඩසටහන් රාශියක් ලබා දීමට සමාගම කටයුතු කර ඇත. ඊට අමතරව අපගේ සේවකයන්ගේ ඩිප්ලෝමා, උපාධි සහ පශ්චාත් උපාධි වැඩසටහන් රාශියක් සමාගම තම අනුග්‍රහය සපයා ඇත. ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සඳහා රැකියාස්ථ පුහුණුව අඛණ්ඩව ලබා දෙන අතර කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ වෘත්තීය නිපුණයන් සමඟ විශේෂ පුහුණු වැඩසටහන් කිහිපයක් අතිරේක වශයෙන් පවත්වන ලදී.

- සේවකයන් සමඟ දිගුකාලීන සබඳතා ඇති කර ගැනීමට විවිධ සේවක ක්‍රියාකාරකම් සංවිධානය

කුරුණෑගල වැවිලි සමාගම හා සමාජයීය සබඳතා

තම ඉඩම් වල අසල්වැසි ගොවීන්ගේ කිරි ගවයන්ට තණකොල උලාකෑම සඳහා සහ තම සතුන් බැඳීමට අදාළ පහසුකම් කුරුණෑගල වැවිලි සමාගම අඛණ්ඩව සහාය දී ඇත. එමගින් සමාගමට කාබනික පොහොර ලබා ගැනීමට මෙන්ම වගා තුළ ඇති වල් මර්දනයට රුකුලක් වී ඇත. මෙම වැඩපිළිවෙල ජාතික කිරි නිෂ්පාදනය වැඩි කිරීමට හා සමස්තයක් වශයෙන් කිරි ගව ගහනය වැඩිවීම කෙරෙහි දායක වී ඇත. අසල්වැසි ගොවීන්ට ආර්ථික වටිනාකමකින් යුතු වූ අර්ධ වාර්ෂික බෝග වර්ග වගා කිරීම සඳහා ද අප පහසුකම් ලබා දී ඇත. එමගින් ඔවුන්ගේ පවුල්වල ආදායම වැඩි වී ඇති අතර ජාතික කෘෂි නිෂ්පාදනය වර්ධනය කිරීමටත් වතුයාය භූමියේ ජෛව හා පාරිසරික සමබරතාවය වඩාත් දියුණු වීම සඳහාත් හේතු වී ඇත. මෙම යාන්ත්‍රණය තුළින් වගා කිරීම සම්බන්ධ සාම්ප්‍රදායික දැනුම සතු දක්ෂ ශ්‍රමිකයන් හඳුනා ගෙන ඔවුන් සමාගමේ සේවක මණ්ඩලය තුළට අවශෝෂණය කර ගැනීමේ අවකාශය ද උදා වී ඇත. සමාගම විසින් වාර්ෂිකව මහනුවර ශ්‍රී දළදා පෙරහැර, විවිධ අවට පිහිටි විහාරස්ථාන සහ දේවාලවල පෙරහැර සඳහා කොප්පරා සැපයීම ද සිදු කරයි. ආගමික ස්ථාන හා පාසැල් ඉදිකිරීම්/ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අවශ්‍ය දැව ලබා ගැනීමට කරනු ලබන ඉල්ලීම් සළකා සමාගම අනුග්‍රාහකත්වය ලබා දීමට කටයුතු කෙරේ. තිරසාරත්වයේ වටිනාකම් අපගේ මෙහෙයුම් ක්‍රියාවලිය සමඟ බැඳී පවතී. නිසි කළමනාකරිත්වයෙන් යුත් ව්‍යාපාරයක් සතුව ආර්ථික, සමාජයීය හා පාරිසරික තිරසාරත්වයක් තුළ අපගේ කටයුතු සිදු විය යුතුය. කුරුණෑගල වැවිලි සමාගම වැවිලි සමාගමක් ලෙස ආර්ථික වශයෙන් ලාභදායී කෘෂිකාර්මික කටයුතුවල නියැලී සිටිමින් පරිසරය රැක ගනිමින් ජෛව විවිධත්වය වර්ධනයට දායක වෙමින් සහ සේවකයන්ගේ සමස්ථයක් ලෙස ජාතියේත් යහපැවැත්ම සහතික කරමින් තම ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලැබේ.

අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණය මනා කළමනාකාරිත්වයේ හා පාලනයේ අත්‍යාවශ්‍ය අංගයක් ලෙස කුරුණෑගල වැවිලි සමාගම පිලි ගනී. එබැවින් වැවිලි ක්ෂේත්‍රයට විශේෂිත අතිරේක අවදානම් මෙන්ම ඇතැම් පොදු අවදානම් හඳුනා ගැනීමට උත්සාහයක් ගෙන ඇත. විශේෂිත අවදානම් අතර ප්‍රධාන කොටම වගාවන් හා රබර් පොල් සහ වෙනත් අතුරුභෝග සැකසීමට අදාළව සහ සමාගම කටයුතු කරන මූල්‍යමය වටපිටාව තිබේ. එබැවින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය හා මෙහෙයුම් පාලන ක්‍රමවේද ඇති කිරීම සහතික කරමින් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුව සමග එක්ව ව්‍යාපාර අවදානම් කළමනාකරණය කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ. අභ්‍යන්තර විගණකවරුන් හා කළමනාකරණ කමිටුව කලින් කළ පද්ධති යෝග්‍යතාවය විල්ල වී ඇති අවදානම් පිළිබඳව සහ පසුව ඇති වන අවදානම් සහගතබව දුරු කිරීමටත් කොටස්කරුවන්ගේ ආයෝජන හා වත්කම් ආරක්ෂා කිරීම සඳහා දර්ශනය වන අවදානම් පරීක්ෂාවට ලක් කෙරේ.

අවදානම් ස්වභාවය

ක්‍රමයක් තුළ පහත දැක්වෙන අවශ්‍යතා සපිරෙන විස්තීරණ අවදානම් කළමනාකරන පද්ධතියක් ඇති කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය තම ස්ථාවරය සහ මනාව සැකසූ පොදු ප්‍රවේශය පැහැදිලිව ප්‍රකාශ කර ඇත. තිරණ ගැනීමේ දී පොදු උනන්දුවක් දක්වන පිරිසගේ මතය පොදුවේ සැළකිල්ලට ගෙන සම්මත ප්‍රතිපත්ති කෙරෙහි කළමනාකාරිත්වය තම අවධානය යොමු කරවයි. නායකත්වයේ ප්‍රතිපත්ති සමඟ පූර්ණව එකඟ වෙමින් කාර්ය මණ්ඩලය පවා මෙම සම්මත ප්‍රතිපත්ති පිළිබඳ අවබෝධයෙන් සිටින අතර, ඒ අනුව ඉදිරියට යාමට කැපව සිටී.

අවදානම් හඳුනා ගැනීම

සේවකයන් අතර ප්‍රමාණවත් අවදානම් දැනුවත්බව ඇති කර ගනිමින් අවදානම් සමාගම තුළම අවදානම් වටහා ගැනීමක් සිදු කිරීමට සමාගමේ ඉහළම කළමනාකාරිත්වය ඇප කැපව සිටී. අභ්‍යන්තර අවදානම් හඳුනා ගැනීමට සමාගම ගන්නා ප්‍රයත්නයන්ට පසුව සිදුවන දෑ පිළිබඳ අවධානයෙන් පසුවීමටත් එහිදී මෙහෙයුම් තලයේ කාර්ය මණ්ඩලය තම අදාළ වෘත්තිය ක්ෂේත්‍ර වල ඇති වන අවදානම් හඳුනා ගැනීමට උනන්දු කෙරේ. ඉහළ කළමනාකාරිත්වය ද බාහිර අවදානම් හඳුනා ගන්නා අතරතුර බාහිරව සිදු වන දෑ පිළිබඳව අවධානයෙන් පසු වේ. මෙම හඳුනාගත් අවදානම් සමාගම වැඩිදුරටත් වර්ගීකරණය කරමින් ඒවායින් සමහරක් සෑම ආයතනයකටම පොදු වන අතර හා ඇතැම් ඒවා සක්‍රිය පාලනය ඇති කිරීමේ දී වැවිලි ක්ෂේත්‍රයට විශේෂිත වේ.

මෙහෙයුම් අවදානම්

අපගේ ප්‍රධාන භෝගය වන පොල් සමාගමේ ප්‍රමුඛතම ආදායම් මාර්ගය වේ. ජාතික නිෂ්පාදනයෙන් 70% කට අධික ප්‍රමාණයක් දේශීය වශයෙන් පරිභෝජනය කෙරෙන අතර කර්මාන්ත අංශය සඳහා ඉතිරි වනුයේ 30% ට වඩා අඩු ප්‍රමාණයකි. මෙමගින් වෙළඳපොල අස්ථාවර තත්ත්වයන් නිර්මාණය කරමින් ඉහළ ඵලදා තත්වයන් සැමවිටම පහළ වාර්ෂික පිරිවැටුමකට මග පාදයි. කෙසේ වුවද, උසස් තත්ත්වයේ පොල් නිෂ්පාදනය සහ ප්‍රතික්ෂේපවීම් අවම වීම මගින් කුරුණෑගල වැවිලි සමාගම පොල් සංවර්ධන අධිකාරිය මගින් පවත්වනු ලබන පොල් වෙන්දේසි වලදී ඉහළ ශුද්ධ අලෙවි සාමාන්‍යයක් වාර්තා කිරීමට හැකි වී ඇත. මෙමගින් අනෙක් අතට මිලදී ගන්නන්ගේ විශ්වාසය දිනා ගැනීමට හැකි වී ඇත. වෙළඳපොල තුළ ඉහළ තරඟකාරිත්වයක් ඇති කිරීම උදෙසා සමාගම මගින් දේශීය ගැනුම්කාර පදනමක් ගොඩ නැගීමට කටයුතු කර ඇති අතර එමගින් අස්වැන්න අධික සමයන් හි දී අදාළ පොල් තොග අලෙවි කිරීම පහසු වී ඇත.

මෙහෙයුම් අවදානම්

අපගේ ප්‍රධාන භෝගය වන පොල් සමාගමේ ප්‍රමුඛතම ආදායම් මාර්ගය වේ. ජාතික නිෂ්පාදනයෙන් 70% කට අධික ප්‍රමාණයක් දේශීය වශයෙන් පරිභෝජනය කෙරෙන අතර කර්මාන්ත අංශය සඳහා ඉතිරි වනුයේ 30% ට වඩා අඩු ප්‍රමාණයකි. මෙමගින් වෙළඳපොල අස්ථාවර තත්ත්වයන් නිර්මාණය කරමින් ඉහළ ඵලදා තත්වයන් සැමවිටම පහළ වාර්ෂික පිරිවැටුමකට මග පාදයි. කෙසේ වුවද, උසස් තත්ත්වයේ පොල් නිෂ්පාදනය සහ ප්‍රතික්ෂේපවීම් අවම වීම මගින් කුරුණෑගල වැවිලි සමාගම පොල් සංවර්ධන අධිකාරිය මගින් පවත්වනු ලබන පොල් වෙන්දේසි වලදී ඉහළ ශුද්ධ අලෙවි සාමාන්‍යයක් වාර්තා කිරීමට හැකි වී ඇත. මෙමගින් අනෙක් අතට මිළ දී ගන්නන්ගේ විශ්වාසය දිනා ගැනීමට හැකි වී ඇත. වෙළඳපොල තුළ ඉහළ තරඟකාරිත්වයක් ඇති කිරීම උදෙසා සමාගම මගින් දේශීය ගැනුම්කාර පදනමක් ගොඩ නැගීමට කටයුතු කර ඇති අතර එමගින් අස්වැන්න අධික සමයන් හිදි අදාළ පොල් තොග අලෙවි කිරීම පහසු වී ඇත.

පොල් ගඩබා කරන ස්ථාන වෙත පහසු පිවිසුමක් ලබා දීම, පොල් ලෙලි ගසන්නන් හට නේවාසික පහසුකම් සැපයීම සහ වතු තුළ අභ්‍යන්තර ප්‍රවාහන පහසුකම් සැපයීම සහ පොල් පැටවීමේ වේලාවන් පහසු පරිදි යොදා ගැනීම මගින් සමාගම එහි ගැණුම්කරුවන්ට හිතකර පරිසරයක් ඇති කිරීමට කටයුතු කර ඇත. ගතවූ වසර තුළ තිබූ දැඩි කාලගුණික තත්ත්වයන් මගින් පොල් ඇතුළු සියළුම කෘෂිකාර්මික බෝග වලට දැඩි බලපෑමක් විල්ල විය. අයහපත් කාලගුණික තත්ත්වයන් නිසා අස්වනු නෙලීම් හා වෙනත් කෘෂිකාර්මික කටයුතු වලට බාධා විල්ල විණි. අයහපත් කාලගුණික තත්ත්වයන්ට ආරක්ෂණ පියවරක් ලෙස සමාගම විසින් වැස්ම යෙදීම, පොල් ලෙලි වැළලීම්, මතු පිට බෝග වගාව, පස බුරුල් කිරීම්, අගල් සැකසීම්, පසේ තෙතමනය රඳවා ගැනීමට හා පස සංරක්ෂණය සඳහා කාබනික පොහොර භාවිතය වැනි කෘෂිකාර්මික ක්‍රමවේද කිහිපයක් අනුගමනය කරන ලදී. මෙම ක්‍රියාමාර්ග මගින් අත්දුටු ප්‍රතිඵල ලබා දී ඇති බැවින් කාලගුණික වෙනස්කම් වලින් වන අයහපත් බලපෑමෙන් රබර් වගාව ආරක්ෂා කර ගැනීම සඳහා ඒ සමාන ක්‍රියාදාමයන් සමාගම ක්‍රියාවට නංවා ඇත. මේවා අතර දැඩි කාලගුණික තත්ත්වයන් නිසා නිෂ්පාදන අවම කිරීම වැළැක්වීමේ අරමුණින් රබර් ගස් සඳහා RRI නිර්දේශිත වැසුම් හා වැසි ආරක්ෂණ සැලකේ.

පලිබෝධ හා රෝග

පොල් මයිටාවන් (Aceria guerreronis, Plessispa and Weligama Wilt) යනාදී මෑත කාලයේ දී වර්ධනය වූ රෝග හා පලිබෝධ පැවති කෘමි, පලිබෝධ සහ රෝග කාණ්ඩ සමඟ වික්ව උසස් තත්වයෙන් යතු පොල් ගස් වලට දැඩි හානියක් හා විනාශයක් වල්ල කර ඇත. පොල් මයිටා උවදුර පරිසර හිතකාමී විලෝපිතයෙකු හදුන්වාදීම මඟින් පෙව ක්‍රම භාවිතා කර සාර්ථකව මැඩ ගැනීමට හැකි වී ඇත. පොල් පර්යේෂණ ආයතනයේ මඟපෙන්වීම යටතේ කුරුණෑගල වැවිලි සමාගම විසින් ආයතනික රසායනාගාරයේ දී විලෝපිත මයිටා බෝ කර අපගේ වගාවන්වල සහ අසල්වාසී පොල් වගා වලට සාධාරණ මිලකට අලෙවි කරමින් භාවිත කෙරේ. අත්දැකීම් ලත් ක්ෂේත්‍ර නිලධාරීන් විසින් ආසාදිත ගස් කල්වේලා ඇතිව හදුනා ගැනීම මඟින් අපගේ වගාවන් වල සිටින පලිබෝධ හා රෝග සියල්ල පාලනය කර, නැති කර දීමට හැකි විය. පොල් පර්යේෂණ ආයතනය හා වික්ව සමාගම විසින් ක්ෂේත්‍ර නිලධාරීන් නිතිපතා පුහුණුවීම් වලට යොමු කිරීම මඟින් ඔවුනගේ දැනුම අඛණ්ඩව යාවත්කාලීන කර තබා ගැනේ.

භෝග ආරක්ෂාව

පොල් යනු ඉවුම් පිහිම් කටයුතුවලදී වැඩිම ඉල්ලුමක් සහිත ද්‍රව්‍යයක් බැවින් සොරා ගැනීමට ලක්වීමේ අවදානම ඉතාමත් ඉහළය. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණනාවක් පුරා කුඩා හුදකලා වතු විසිරී තිබීම නිසා පොල් ආරක්ෂා කර ගැනීම නිරතුරුවම ගැටළුවක් වී ඇත. එබැවින් සොරා ගැනීම අවම කිරීම සඳහා වගාවන්ට ඉහළ ආරක්ෂාවක් සැපයෙන සුපුරුදු නොවන ක්‍රියාමාර්ග ගත යුතුව ඇත. සොරකම් කිරීම අවම කිරීමේ පියවරක් ලෙස මාස දෙකකට වරක් සිදු කරන සාමාන්‍ය නෙලීම වෙනුවට වැටෙන ප්‍රමාණය සියයට අනූවකින් අවම කරමින් මාසිකව අස්වැන්න නෙලිමක් සමාගම හඳුන්වා දී ඇත. වතු වටා ඇති වැටවල් ශක්තිමත් කිරීම මඟින් මෙම ක්‍රමයට වැඩි අනුබලයක් සපයා ඇත. මීට අමතරව අධීක්ෂකයන්, සහකාර අධීක්ෂකයන්, ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය හා අභ්‍යන්තර විගණන නිලධාරීන් විසින් සමීපව අධීක්ෂණය හා නියාමනය කිරීම සොරකම් කිරීම අවම කිරීමට හේතු වී ඇත. වැටෙන ගෙඩි අසුලන සහ පොල් ගොඩවල් වලට ආරක්ෂාව සපයන මුරකරුවන්ට දිරි දීමනා ගෙවීම මඟින් ද උනන්දු කිරීමක් සකසා ඇත. ස්වභාවික උවදුරු, ගිනි, සොරකම් කිරීම හා හදිසි තත්ත්වයන් මඟින් වන අනතුරුදායක තත්ත්වයන් පහ කර ගැනීම සහ මාර්ගස්ථ භෝග වලට රක්ෂණ ක්‍රමයක් සමාගම සකසා ඇත.

කම්කරු හිඟය

පුහුණුව ලත් සේවක පිරිසක් අස්වනු නෙලීම, පොල් ලෙලි ගැසීම හා මැදීම යන කර්මාන්තයේ අත්‍යාවශ්‍ය සාධකයකි. එසේ වුවද, ගත වූ වසර කිහිපය පුරාම සමාගමේ කළමනාකාරිත්වය මුහුණ දුන් පීඩාකාරී ගැටලුව වූයේ පුහුණු පොල් වතු කම්කරුවන්ගේ මද බවයි. මේ නිසා පොල් වතුවල විදිනෙදා කළමණාකරණ කටයුතු දැඩි ලෙස අඩාල වී ඇත. තේ හා රබර් වතුවල මෙන් පොල් වගාව හා සම්බන්ධව නේවාසික ශ්‍රමික පිරිසක් නොමැති බැවින් අසල්වාසී ගම්මාන වල සිටින කම්කරුවන්ගේ සේවය ලබා ගැනීමට සමාගමට සිදු ව ඇත. ඒ හේතුකොට ගෙන ශ්‍රමය භාවිතය අවම කර වැවිලි නඩත්තු කාර්යක්ෂමව කරගෙන යාම සඳහා විකල්ප විසඳුමක් ලෙස රසායනික වල්පැල නැසීම ඇතුළුව වල්පැල නෙලිම, අඟල් තැනිම සහ පොහොර යෙදීම සඳහා යන්ත්‍ර භාවිතා කිරීමට සමාගම කටයුතු කර ඇත. අපගේ ශ්‍රම බලකායෙන් උපරිම සේවයක් අප බලාපොරොත්තු වන අතරතුර සුදුසු යන්ත්‍රකරණය තුලින් ඉතාමත් ඉහළ ධාරිතාවයක් ලබා ගැනීමට ද අපට හැකි විය. නොමිලේ නේවාසික පහසුකම් සහ විදුලිය ජලය සැපයීම සහ සහන මිලට පොල් ලබාදීම වැනි පහසුකම් ලබා දෙමින් සේවක පිරිස් රඳවා ගැනීමට විවිධ පියවර සමාගම විසින් ගෙන ඇත. මීට අමතරව, කාර්යසාධනය මත පදනම්ව දිරි දීමනා ගෙවූ අතර බෝනස් ගෙවීම, දරුවන් හට ශිෂ්‍යත්ව ප්‍රදානය, අත්‍යාවශ්‍ය උවමනාකම් සඳහා විවිධ ණය පහසුකම්, කාර්ය මණ්ඩලය සඳහා ආපදා ණය, ව්‍යවස්ථාපිත හිඟ මුදල් කලට වේලාවට ගෙවීම, වෘත්තීමය පුහුණුව ලබාදීම්, හිතකාමී හා ප්‍රසන්න සේවා වටපිටාවක් සැකසීම වැනි වෙනත් පහසුකම් ඇති කර දෙන ලදී.

ඉඩම් පවරා ගැනීමේ අවදානම

ජාතික අවශ්‍යතා, පොදු උවමනාකම් හා ව්‍යවස්ථාපිත ඉල්ලීම් සඳහා ඵලදායී ඉඩම් පවරා ගැනීමේ අවදානමට සමාගම දැඩි ලෙස පාත්‍ර වී ඇත. සමාගම පිහිටුවනු ලැබූ වසර වන 1992 වන විට මුලින්ම පවරා ගත් ඉඩම් ප්‍රමාණයෙන් සියයට විස්සක් කුරුණෑගල වැවිලි සමාගමට අහිමි වී ඇති බව සඳහන් කළ යුතුමය.

වෘත්තීය සමිති, සමාජ හා පාරිසරික වෙනස්කම්

සමාගමේ කාර්මික සංහිදියාවේ ඇති වැදගත්කම අවබෝධ කර ගනිමින් වෘත්තීය සමිති හා කුරුණෑගල වැවිලි සමාගම ද සාමාජිකත්වය දරණ ලංකා හාම්පුතුන්ගේ සංගමය සමඟ සාමූහික ගිවිසුමකට එළැඹුනි. එහි ප්‍රතිඵලයක් ලෙස වැටුප්, ව්‍යවස්ථාපිත ගෙවීම් අප්‍රමාදව ගෙවීමටත් සේවක රක්ෂණ වන්දි සහ කම්කරු ආරවුල් වලට අදාළ ක්ෂේත්‍ර කෙරේ නිසි අවධානය යොමු කෙරේ. මෙවැනි ප්‍රවේශ මඟින් සමාගම තුළ කාර්මික සාමය ශක්තිමත් කිරීමට රුකුලක් වී ඇත.

අවදානම් අධීක්ෂණය හා සමාලෝචනය

අභ්‍යන්තර සහ බාහිර වෙනස්කම් වලට අනුරූපීව අභ්‍යන්තර පාලන ක්‍රමවල පවතින දුර්වලතා හඳුනා ගැනීමේ අරමුණින් අවදානම් කළමනාකරණ ක්‍රම වල පැවැත්ම හා ක්‍රියාකාරිත්වය කාලානුරූපීව ඇගයීමට ලක් කෙරේ. අධීක්ෂණ කටයුතු පවත්වා ගෙන යාම හෝ වෙනමම ඇගයීමට ලක් කිරීම හෝ ඉහළ කළමනාකාරිත්වයේ සහ විගණන කමිටුවේ වගකීමකි. අපගේ අභ්‍යන්තර විගණන කණ්ඩායම නිරන්තරව වතුයායන් වල ක්‍රියාකාරිත්වය විමර්ශනය කරමින් විගණනයේ යෙදෙන අතර, එමගින් සොයා ගනු ලබන විශේෂ අවධානයක් යොමු කළ යුතු කරුණු විගණන කමිටුවේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුවේ අවධානයට යොමු කෙරේ. එහිදී හඳුනා ගනු ලබන තොරතුරු සහ ගත යුතු ක්‍රියාමාර්ග අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් වගකිව යුතු සමාගමේ විවිධ පාර්ශ්වයන් වෙත සන්නිවේදන කෙරේ.

සාමූහික පාලන ප්‍රකාශය

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය අවංකත්වය, ආයතනික මධ්‍යස්ථබව, විනිවිදභාවය හා වගකීම්සහගතබව යන ප්‍රතිපත්ති තුල ක්‍රියාත්මක වේ. මෙය සමාගම සහ සමාගම කෙරේ උනන්දුවක් දක්වන පිරිස් සමඟ මෙන්ම සමාගම ක්‍රියාත්මක වන ව්‍යාපාරික පරිසරය සමඟ ප්‍රබල සම්බන්ධතාවයක් ඇති කිරීමට හේතු වී ඇත. සමාගමේ කටයුතු ආචාර ධර්ම වලට අනුකූලව සමාගම කෙරෙහි උනන්දුවක් දක්වන සෑම පාර්ශ්වයකගේම සුභසිද්ධිය උපරිම වන අයුරින් කර ගෙන යනු ලැබේ. ව්‍යවස්ථාපිත අවශ්‍යතා සහ ආයතනික ස්ථායීබව මෙන්ම ව්‍යාපාරික වටිනාකම් වර්ධනය වන අයුරින් සකස් කර ඇති ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි, ක්‍රියා පිළිවෙත්, නිවැරදි ව්‍යුහයන් සහ තොරතුරු උක්ත සඳහන් සම්බන්ධකම් වඩා සවිමත් කිරීම සඳහා හේතු වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ කාර්යසාධනය සඳහා අවසාන වශයෙන් වගකිව යුතු වන අතර ආයතනික පාලන ක්‍රමවේදයේ හදවත ලෙස ක්‍රියා කරයි.

වගකීම

ප්‍රධාන ප්‍රතිපත්ති හා උපායශීලි අරමුණු සැකසීම හා ඒවා ක්‍රියාවට නැංවීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමයි. සමාගමේ මූල්‍ය තොරතුරු වල විශ්වාසනීයත්වය සහ අභ්‍යන්තර පාලන පද්ධතීන්හි සාර්ථකත්වය සඳහා ද අවසන් වගකීම දරන්නා වන්නේ එහි අධ්‍යක්ෂ මණ්ඩලයයි.

සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩලය සභාපතිතුමා ඇතුළුව පත්කළ විධායක නොවන අධ්‍යක්ෂවරුන් හත් දෙනෙකුගෙන් සමන්විත වේ. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වසර තුළදී පහත අයුරින් වෙනස් කෙරිනි.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසිකව පැවැත්වේ. සමාගමේ උපාය මාර්ගික මෙහෙයවීම, වාර්ෂික අයවැය විමර්ශනය, සියළු කාර්යන්හි ප්‍රගතිය සහ ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් වැඩසටහන් සමාලෝචනය මෙම රැස්වීම් වලදී සිදු කෙරේ. එක් එක් රැස්වීම පැවැත්වීමට පෙර අදාළ ලේඛන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වෙත ලබා දේ. 2020 වසර තුලදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 11 පහත පරිදි පැවැත්විණි.

358 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2020 පෙබරවාරි 13
359 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2020 පෙබරවාරි 29
360 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2020 මාර්තු 30
361 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2020 මැයි 13
362 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2020 ජූනි 30
363 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2020 ජූලි 20
364 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2020 අගෝස්තු 20
365 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2020 සැප්තැම්බර් 30
366 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2020 ඔක්තෝබර් 29
367 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2020 දෙසැම්බර් 02
368 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම - 2020 දෙසැම්බර් 24

වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය

නම	තනතුර	පත්කළ දිනය
ආර්.පී.පී. රාජපක්ෂ මයා	සභාපති	2021.07.09
ඒ.වී.කේ. මාධවී හේරත් මිය (2019.12.31 අධ්‍යක්ෂ මණ්ඩලට පත්ව 2021.07.08 ඉල්ලා අස්වූ)	සභාපති (2019.12.13 සිට 2021.07.08 තෙක්)	2019.12.31
බී.විල්.ඒ.ජේ. ධර්මකීර්ති මයා (2020.02.05 අධ්‍යක්ෂ මණ්ඩලට පත්ව 2021.07.21 ඉල්ලා අස්වූ)	අධ්‍යක්ෂ	2020.02.05
ඩබ්ලිව්.ඩී.ආර්. ක්‍රිශාන්ත මයා	අධ්‍යක්ෂ - භාණ්ඩාගාර නියෝජිත	2020.01.11
එච්.ඒ. නදීක හෙට්ටිආරච්චි මයා	අධ්‍යක්ෂ	2020.01.15
ඩබ්ලිව්.ඒ.ජේ.ජී.ඩී. විජේසිංහ මයා	අධ්‍යක්ෂ	2020.01.15
එස්.ඊ. ඩයස් රත්නායක මයා	අධ්‍යක්ෂ	2020.01.15
එච්.සී.එම්.එම්. කුලසේකර මයා	අධ්‍යක්ෂ	2020.02.05
එම්.කේ.පී. රුක්මණි මිය	අධ්‍යක්ෂ	2021.07.21
ටී. එදිරිවික්‍රමසූරිය මයා	අධ්‍යක්ෂ	2021.08.16

2020 වසරේ දී මෙම රැස්වීම් වලදී අධ්‍යක්ෂ මණ්ඩලයේ සහභාගිත්වය පහත පරිදි වේ.

	13.02.2020	29.02.2020	30.03.2020	13.05.2020	30.06.2020	20.07.2020	20.08.2020	30.09.2020	29.10.2020	02.12.2020	24.12.2020	Attendance
ඒ.වී.කේ. මාධවී හේරත් මිය- සභාපති	√	√	√	√	√	√	√	√	√	√	√	11/11
බී.එල්.ඒ.ජේ. ධර්මකීර්ති මයා	√	√	√	√	√	√	x	x	x	x	x	06/11
ඩබ්ලිව්.ඩී.ආර්. ක්‍රිශාන්ත මයා - භාණ්ඩාගාර නියෝජිත	√	√	√	√	√	√	√	√	√	√	√	11/11
එච්.ඒ. නදීක හෙට්ටිආරච්චි මයා	√	√	√	√	√	√	√	√	√	√	√	11/11
ඩබ්ලිව්.ඒ.ජේ.ජී.ඩී. විජේසිංහ මයා	√	√	√	√	√	√	√	√	√	√	√	11/11
එස්.ඊ. ඩයස් රත්නායක මයා	√	X	x	√	x	x	x	x	x	x	x	02/11
එච්.සී.එම්.එම්. කුලසේකර මයා	x	√	√	√	√	√	√	√	√	√	√	10/11

නීතිමය විධිවිධානයන්ට අනුකූලවීම

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සෑමවිටකදීම සාංගමික සංස්ථාපත්‍රය සහ සාංගමික ව්‍යවස්ථාවලිය හා රාජ්‍ය ව්‍යාපාර සඳහා බලපවත්වන අනෙකුත් නීති රීති හා රෙගුලාසි වලට අනුව කටයුතු කිරීමට සෑම උත්සාහයක්ම ගනී. සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කර ඇති බවත් 2007 අංක 7 දරණ සමාගම් පනතේ විධිවිධාන වලට අනුකූල වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වේ.

විගණන කමිටු වාර්තාව

විගණන කමිටුවේ සාමාජිකයන් සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කෙරෙන අතර එය විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. විගණන කමිටු රැස්වීම් අවශ්‍ය පරිදි මහා භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ. සභාපති, ප්‍රධාන විධායක නිලධාරී සහ වෙනත් විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු මෙම විගණන කමිටු රැස්වීම් වලට සහභාගී වේ. තවද, ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් හා කළමනාකරුවන්, පළාත් වතු අධිකාරීවරුන් සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු ආරාධිතව රැස්වීම් වලට කලින් කල සහභාගී වන අතර රැස්වීම් සම්බන්ධීකරණය සමාගමේ විගණන කළමනාකරු විසින් සිදු කෙරේ. 2020 වසර තුළ විගණන කමිටු රැස්වීම් 04 ක් පැවති අතර ඒවායේ සහභාගිත්වය පහත දක්වා ඇත.

වත්මන් විගණන කමිටු වර්ෂය - 2020/2021

නම	අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කළ දිනය
ඩබ්ලිව්.ඩී.ආර්. ක්‍රිශාන්ත මයා විගණක කමිටු සභාපති අධ්‍යක්ෂ - භාණ්ඩාගාර නියෝජිත	11.01.2020
එච්.ඒ.එන්. හෙට්ටිආරච්චි මයා - අධ්‍යක්ෂ	15.01.2019
එම්.කේ.පී. රුක්මණි මිය - අධ්‍යක්ෂ	21.07.2021

විගණක කමිටු රැස්වීම් - 2020 වසර

නම	12/03/2020	29/06/2020	17/08/2020	09/12/2020
ඩබ්ලිව්.ඩී.ආර්. ක්‍රිශාන්ත මයා විගණක කමිටු සභාපති අධ්‍යක්ෂ - භාණ්ඩාගාර නියෝජිත	√	√	√	√
බී.එල්.ඒ.ජේ. ධර්මකීර්ති මයා -අධ්‍යක්ෂ අතිරේක ලේකම්, වැවිලි කර්මාන්ත හා අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශය. (05.02.2020 දින මණ්ඩලයට පත්කළ හා 21.07.2021 ඉල්ලා අස්වූ)	√	√	√	x
එච්.ඒ.එන්. හෙට්ටිආරච්චි මයා - අධ්‍යක්ෂ	√	√	√	√

විගණන කමිටුවේ ප්‍රධාන කාර්යභාරය හා වගකීම වන්නේ සමාගමේ මූල්‍ය ප්‍රකාශන හා මූල්‍ය දැන්වීමේ ක්‍රියාදාමයේ ප්‍රමිතිය හා පූර්ණත්වය සාර්ථකව පවත්වාගෙන යාම සඳහා අධීක්ෂණය සිදු කිරීමයි. මූල්‍ය ප්‍රකාශන වල තොරතුරු ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති වලට අනුව ප්‍රමාණාත්මකව සැකසීම හා ඉදිරිපත් කිරීම මෙහි කර්තව්‍යයකි. තවද, අභ්‍යන්තර පාලන හා අවදානම් කිරීමේ ක්‍රම සෑහීමකට පත් වන ලෙස හා නෛතිකව සිදු කිරීමයි. කලින් කල මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන චක්‍රලේඛ හා මාර්ගෝපදේශ ඇතුළුව ව්‍යස්ථාපිත අවශ්‍යතා වලට අනුව මෙය සිදු කෙරේ.

මූල්‍ය වර්ෂයේ ප්‍රගතිය

අභ්‍යන්තර විගණන කමිටු සභාපතිවරයා විසින් විගණන කමිටුවේ අවධානයට යොමු කරන කරුණු දීර්ඝව සාකච්ජා කර සමාලෝචිත කාලය තුල පැවැත්වෙන රැස්වීම් වලදී නිර්දේශිත අදාළ විසදුම් දීර්ඝව සාකච්ජාවට බදුන් කෙරේ. විගණන කමිටු වල කටයුතු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිතිපතා යවා අවශ්‍ය අනුමැතින් හා ක්‍රියාත්මකවීම් සිදු කෙරේ. විගණනයේ විෂයපථය විමර්ශනයට හා අධ්‍යයනයට ලක් කරනු ලබන විගණන කමිටුව තම අරමුණ හා සක්‍රියතාවය වර්ධන වර මතුවන තත්ත්වයන් තුළ සොයා බැලේ. අනාගත දැක්මක් සහිතව සමාගමේ මෙහෙයුම් කමිටුව මගින් සමාලෝචනය කෙරේ. මතුවන ගැටුළු මෙන්ම අභ්‍යන්තර පාලන වල අදාළත්වයට අදාළව කළමනාකාරිත්වය විසින් ගන්නා පියවර අංශ ප්‍රධානීන්/ වතු අධිකාරිවරුන් සමඟ වික්ව සමාලෝචනයට ලක් කර සාකච්ජා කර රැස්වීම් වලදී ම අවශ්‍ය නිවැරදි කිරීමේ පියවර ගනු ලැබේ.

2019 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගනකාධිපතිවරයාගේ වාර්තාව සමඟ අදාළ කරුණු පිළිබඳව කළමනාකාරිත්වයේ අදහස් කළමනාකාරිත්වය මෙන්ම විගණකවරු සමඟ සාකච්ජා කර වැඩිදුරටත් විමර්ශනය කෙරේ. එහිදී විගණකවරුන් විසින් පෙන්වා දෙන කරුණු වලට කඩිනම් පිළිතුරු සැපයේ. අභ්‍යන්තර විගණන අංශය මගින් හදුනා ගනු ලබන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අඩුපාඩු ප්‍රධාන විධායක නිලධාරි සහ වතු අධිකාරීන් සමඟ සාකච්ජා කරනු ලබන අතර වැදගත් ක්ෂේත්‍ර කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩල අවධානය යොමු කිරීමට කටයුතු කරේ.

අභ්‍යන්තර විගණන අංශය ලබා දෙන සේවාව සහ සමාගමේ අවශ්‍යතා හා අපේක්ෂා මුදුන්පත් කර ගැනීමට කරන උත්සාහය ස්තුති පූර්වකව සඳහන් කිරීමට විගණන කමිටුව කැමති වේ. විගණන කමිටු සාමාජිකයන් මෙන්ම වෙනත් බාහිර පාර්ශ්ව/ නිරීක්ෂකයන් විසින් ඉටු කරනු ලබන අමිල දායකත්වය දැඩි ඇගයීමකින් යුතුව පිළිගන්නා අතර, මූල්‍ය කටයුතුවලදී ඔවුන් දක්වන හැකියාව හා අදාළ පළපුරුද්ද සමාගමේ අඛණ්ඩ ජයග්‍රහණ වලට සත්‍යවශයෙන්ම රුකුලක් වී ඇත.



ඩබ්.ඩී.ආර්. ක්‍රිශාන්ත
විගණන කමිටු සභාපති

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ සහ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන්නේ සතුටිනි.

සමාගමේ නෛතික තත්වය

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාරික ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධිවිධානයන්ට අනුකූලව 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ සීමාසහිත පොදු සමාගමක් ලෙස පිහිටුවා ඇත. එය 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති අතර නව ලියාපදිංචි අංකය PB 1319 වේ. සමාගමේ ලියාපදිංචි කාර්යාලය කුරුණෑගල, දඹුල්ල පාරේ, අංක 80 දරණ ස්ථානයේ පිහිටා ඇත. සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම තනි කොටස්කරුවෙකුගෙන් යුත් සමාගමක් වන අතර ශ්‍රී ලංකා ජනරජයේ භාණ්ඩාගාර ලේකම් එහි එකම කොටස්කරු වේ.

ප්‍රධාන කටයුතු සහ ව්‍යාපාරික ස්වභාවය

සමාගමේ ප්‍රධාන වගා කටයුතු ලෙස පොල්, රබර් සහ අනෙකුත් කෘෂි නිෂ්පාදන වගා කිරීම, නිෂ්පාදනය සහ අලෙවිය 2020 වසර තුළ අඛණ්ඩව සිදු කරන ලදී. සමාගමේ වතු ගම්පහ හා කුරුණෑගල දිස්ත්‍රික්ක තුෂ ව්‍යාප්තව ඇති අතර එම වතුයායන් අත්තනගල්ල, දඹදෙණිය, දොඩම්ගස්ලන්ද, හිරියාල, කුරුණෑගල, කටුගම්පල සහ නාරම්මල යන ප්‍රදේශ පුරා විසිරී ඇත.

ඉඩම් වපසරිය

ජාතික අවශ්‍යතාවයන් සහ ව්‍යවස්ථාපිත නිශ්චයන් සඳහා ඉඩම් නිදහස් කිරීම හේතුකොට ගෙන සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමට විශාල ඉඩම් ප්‍රමාණයක් අහිමි වී ඇත. 1992 දී සමාගම පිහිටුවන අවස්ථාවේ දී සමාගම වෙත භාර දුන් මුළු ඉඩම් ප්‍රමාණය වූ හෙක්ටයාර් 6722 න් හෙක්ටයාර් 1750.88 ක ඉඩම් ප්‍රමාණයක් මේ වන විට සමාගමට අහිමිව ගොස් ඇත. 2018 මූල්‍ය වර්ෂය අවසාන වන විට සමාගම සතුව ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 4971.12 කි.

පළාත් වතු ඉඩම් වපසරිය

	වපසරිය (හෙක්ටයාර)
අත්තනගල්ල	1114.53
දඹදෙනිය	462.18
දොඩන්ගස්ලන්ද	690.73
හිරියාල	980.21
කටුගම්පල	617.12
කුරුණැගල	555.80
නාරම්මල	550.55
	4971.12

නිෂ්පාදන සමූහය

වතුයාය හතෙහිම ප්‍රධාන භෝගය පොල් වන අතර රබර් වගාව අත්තනගල්ල හා දොඩම්ගස්ලන්ද ප්‍රදේශ වල වතුවලට පමණක් සීමා වී ඇත. භූමි හා දේශගුණික යෝග්‍යතාවය සළකා අතුරු භෝග වර්ග රාශියක් සමාගම විසින් ඇති කර නඩත්තු කෙරේ.

අඛණ්ඩ පැවැත්ම

දුරදක්නා අනාගත කාලයක් සමාගමේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව කර ගෙන යාමට අවශ්‍ය සම්පත් ප්‍රමාණවත් පරිදි සමාගම සතුව ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත් වේ. ඒ අනුව ගිණුම් වාර්තා අඛණ්ඩ පැවැත්ම සංකල්පය යටතේ පිළියෙල කර ඇත.

මූල්‍ය ප්‍රකාශන සහ විගණක වාර්තාව

2020 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා වූ නිසි ලෙස සැකසූ අධ්‍යක්ෂකවරුන් විසින් අත්සන් තැබූ මූල්‍ය ප්‍රකාශන සහ එම කාලයට අදාල විගණක වාර්තාව පිටු අංක 36 සිට 42 දක්වා ඇතුළත් කර ඇත.

ගිණුම් ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී අනුගමනය කළ ගිණුම් ප්‍රතිපත්ති මෙම වාර්තාවේ පිටු අංක 47 සිට 56 දක්වා වැඩිදුරටත් දක්වා ඇත. පෙර වසර වල සමාගම අනුගමනය කළ ගිණුම් ප්‍රතිපත්ති කිසිදු වෙනසක් නොමැතිව මේ වර්ෂයේදී ද යොදා ගෙන ඇත.

ආදායම

සමාගමේ ආදායම ගත වූ වසර වඩා 38% ක වර්ධනයක් පෙන්නුම් කෙරේ. ආදායමේ සංයුතිය පහත පරිදි වේ.

	2020 රු. මිලියන	2019 රු. මිලියන	වැඩිවීම / (අඩුවීම) %
පොල්	583	403	45
රබර්	30	29	3
අතුරු භෝග	42	44	(5)
වෙනත් මුලාශ්‍ර	30	22	36
එකතුව	**685**	**498**	**38**

බදු පෙර ලාභය සහ බදු පසු ලාභය

2020 වසරේ සමාගමේ මුළු ආදායම රු. මිලියන 685 කි (එය 2019 දී රු.මිලියන 498) ක් විය. වසරේ වෙනත් මෙහෙයුම් ආදායම රු. මිලියන 51 විය. එය 2019 දී රු. මිලියන 73 ක් විය.

2020 වසරේ සමාගමේ බදු පෙර ලාභය රු. මිලියන 214.9 (එය 2019 දී රු. මිලියන 120) කි. සමාගමේ මූල්‍ය ප්‍රතිඵලයන් විස්තීරණ ආදායම් ප්‍රකාශනය තුළ පෙන්නුම් කර ඇත.

	2020 රු. මිලියන	2019 රු. මිලියන
පොල් ලාභය	242	92
රබර් වලින් ලත් පාඩුව	(11)	(16)
වෙනත් භෝග	44	37
දළ ලාභය	275	113
සාදාරණ පෙව වත්කම් වටිනාකම	7	19
වෙනත් මෙහෙයුම් ආදායම	51	73
පරිපාලන වියදම්	(126)	(115)
මෙහෙයුම් ක්‍රියාකාරකම් ලාභය	208	91
මූල්‍ය ආදායම	36	59
මූල්‍ය වියදම	(30)	(30)
බදු පෙර ලාභය	215	120
විලම්බිත බදු	(28)	(18)
වසරේ ලාභය	**186**	**102**

පොල් අංශය

2020 වර්ෂය අවසානයේදී සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම සතුව ඇති ඵල දරන පොල් ඉඩම් වපසරිය හෙක්ටයාර් 2,794.28 ක් වන අතර අද වන විට පොල් යටි වගා ප්‍රමාණය ඵල දරන පොල් ඉඩම් වපසරියෙන් 22% (හෙක්ටයාර් 872.33) කි. අක්කරයකට පැවතිය යුතු පිළිගත් ප්‍රශස්ත පොල් ගස් සංඛ්‍යාව 60 ක් වන අතර කුරුණෑගල වැවිලි සමාගමේ පොල් වතු වල අක්කරයක ඇති ගස් සංඛ්‍යාව 57 කි. 2005 ජනවාරි 01 දින සමාගමේ කළමනාකාරිත්වය රාජ්‍ය අංශයට පවරා ගන්නා විට අක්කරයක පැවති පොල් ගස් ප්‍රමණය 50 කි. 2005 වසරේ සිට පොල් අස්වැන්නේ වර්ධනයක් පෙන්නුම් කර කළ අතර 2012 වසරේ දී ගෙඩි මිලියන 18.1 උපරිමය වාර්තා කෙරිණි. කෙසේ වුවද, 2013 වසරේ දී සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම ඇතුලුව සියළුම පොල් වගාකරුවන් තම පොල් අස්වැන්නේ විශාල පසුබෑමකට ලක් වෙමින් ගෙඩි මිලියන 13 දක්වා අඩු විය. කෙසේ වුවද 2014 වසරේ දී මිලියන 16.7 දක්වාත් 2015 දී ගෙඩි මිලියන 14.1 ක් හා 2016 දී ගෙඩි මිලියන 16.7 ක් දක්වා පොල් අස්වැන්න වැඩිවිය. කෙසේ වෙතත් සමාගමේ ඉතිහාසය තුල වාර්තා වූ අඩුම පොල් අස්වැන්න ලෙස ගෙඩි මිලියන 10.6 ක් 2017 වාර්තා වූ අතර 2019 වසරේ පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 16.3 ක් දක්වා වර්ධනය වෙමින් ගත වූ වසරට වැඩි 30% ක වර්ධනයක් අත්පත් කර ගනිමින් 2020 දී 30% ක අවම වීමක් සිදු විය.

නිෂ්පාදනය 30% කින් වර්ධනය වුවද, 2020 වසරේ ගෙඩියක ශුද්ධ අලෙවි සාමාන්‍යය රු. 49.07 ක් ලෙස ගත වූ වසරට වඩා රු. 24.46 කින් වැඩි විය. 2018 වසරේ ශුද්ධ අලෙවි සාමාන්‍යය ගෙඩියකට රු. 43.22 ක් විය. මෙම තත්ත්වය පොල් ආදායම කෙරෙහි සතුටුදායක තත්ත්වයක් ඇති කරමින් ගත වූ වසරට වඩා රු. මිලියන 179 ක වැඩිවීමක් වාර්තා විය.

රබර් අංශය

2020 වසර අවසානය වන විට සමාගම සතුව මේරූ රබර් වගා හෙක්ටයාර් 163.47 ක් සහ නොමේරූ වගා හෙක්ටයාර් 18.13 ක්

ලෙස පැවතිනි. අඩු නිමි නිෂ්පාදන තත්ත්වය තුළ රබර් වල තත්ත්වය යහපත් එකක් නොවේ. රබර් වලින් 2020 දී ලත් පාඩුව මිලියන 16.1 සිට මිලියන 10.6 දක්වා පසුබැස්මක් ඇති විය. 2018 අත්වූ පාඩුව රු. මිලියන 16.6ක් විය. මෙයට ප්‍රධාන හේතුව 2017/2018 ට සාපේක්ෂව 2020 දී කිලෝ ග්‍රෑමයට රු. 65 ක් අඩුවීමක් අඩු නිමි නිෂ්පාදන තත්ත්වය සිදු විය. මීට අමතරව සමාගමේ රබර් නිෂ්පාදනය පැරණි හෝ අඩු අස්වැන්න සහිත රබර් වගා ගලවා දැමීම සහ අයහපත් කාලගුණික තත්ත්වයන් නිසා කිරි ගන්නා දින ගණන අඩුවීම තුළ ක්‍රමිකව අඩු වී ඇත. 2020 නිෂ්පාදිතය කිලෝ ග්‍රෑම් 107,088 ක් ලෙසත් 2019 දී එය කිලෝ ග්‍රෑම් 107,280 ක් සහ 2018 දී කිලෝ ග්‍රෑම් 111,112 ක් විය. ඵලදායිත්වය අඩු රබර් ගස් වෙනුවට වැඩි අස්වැන්නක් සහිත සුළු අපනයන බෝග මගින් විවිධාංගීකරණයට ලක් වෙමින් පවති. වඩා වර්ධන හැකියාවක් හා අලෙවි ලාභදායිත්වය සැලකිල්ලට ගෙන කුරුදු හා ගම්මිරිස් වැනි බෝග කෙරේ වැඩි අවධානයක් යොමු කර ඇත. තනි බෝගයක් වගා කරන තනි භෝග වගාව සඳහා ඇතැම් ඉඩම් යොදා ගෙන ඇත.

වෙනත් භෝග

අපගේ අතුරු බෝග වගාව සමාලෝචිත වර්ෂය තුල අපගේ ආදායම සඳහා රු. මිලියන 41.9 ක දායකත්වයක් ලබා දී ඇත. සමාගම විසින් අනුගමනය කළ දූරදර්ශී උපාය මාර්ගික ක්‍රමෝපායන් මෙම අංශයේ ඉහළ සාර්ථකත්වයට හා ලාභදායිත්වයට දායක වී ඇත. මෑත අතීතයේදී මේ සම්බන්ධව ගනු ලැබූ වැදගත් උපාය මාර්ගික ක්‍රමෝපාය වලින් එකක් වූයේ සමාගමේ සමස්ථ ආදායමට 80% ක පමණ දායකත්වයක් ලබා දෙන ප්‍රධාන භෝගය වන පොල් මත ඇති පරායත්තභාවය අවම කිරීම සඳහා මහා පරිමාණයෙන් භෝග විවිධාංගීකරණය සඳහා යොමු වීමයි. එහි ප්‍රතිඵලයක් ලෙස අතුරු භෝග වලින් අතිරේක ආදායම වැඩි කරමින් ඉඩම් ඒකකයකින් ලැබෙන ආදායම ඉහළ මට්ටමකට ගෙන ඒමට හැකි වී තිබේ.

කළු ගම්මිරිස්, අඹ හා රඹුටන් වැනි අතුරු භෝග මගින් මෙම ආදායමට දැඩි දායකත්වයක් එක් කර ඇත. අතුරු භෝග ව්‍යාප්තිය මගින් ලැබෙන තවත් විශාල වාසි ඇති අතර පෙව විවිධත්වය වර්ධනය කිරීමට සාධනීය බලපෑමක් එමගින් එක් කරයි. දැනට ඇති වගා ක්‍රම අඩු පිරිවැය අලෙවි ක්‍රම වලට අනුව වැඩිදියුණු කරලීමේ දී ආර්ථිකමය වාසියක් අත් කර දෙන අතුරු භෝග අස්වැන්න බදු දීම සඳහා සමාගම කටයුතු කර ඇත. එමගින් අස්වැන්න නෙලීම, විකිණීම හා අස්වැන්න ආරක්ෂා කිරීම අදාළ බදු ගැනුම්කරු වෙත පැවරෙන අතර, එතුලින් පසු අස්වනු හානි අවදානම ද සමාගමට අවම කර ගැනීමට හැකි වී ඇත.

ප්‍රාග්ධන වියදම් සහ ආයෝජන

ප්‍රාග්ධන වැඩකටයුතු සඳහා වසර ගණනාවක් තුළ සැළකිය යුතු මුදල් ප්‍රමාණයක් සමාගම ආයෝජනය කරමින් සිටින අතර ඒ තුළ පොල් හා අතුරු භෝග ව්‍යාප්තිය හා නොමේරූ තත්වයේ වැවිලි නඩත්තුව සඳහා වේ. සමාලෝචිත මුදල් වර්ෂය තුළදී රු. මිලියන 102 ක් (2019 දී රු. මිලියන 116) සමාගමේ ස්ථාවර වත්කම් වල ආයෝජනය කර ඇති අතර ඉන් ආසන්න වශයෙන් රු. මිලියන 124 ක් (2019 දී රු. මිලියන 138) ක් නොමේරූ වැවිලි ඇති කිරීම සඳහා වියදම් කර ඇත.

මූල්‍ය තත්ව ව්‍යුහය

සමාගමේ මූල්‍ය තත්වය වසරින් වසර ශක්තිමත් වෙමින් සමාලෝචිත මූල්‍ය වසර තුළ රු. මිලියන 364 කින් වර්ධනය වී ඇත. දේපල පිරියත හා උපකරණ සඳහා රු. මිලියන 225 ක ආයෝජනයක්, රු. මිලියන 2 ක පාරිභෝජ්‍ය පෙව වත්කම් වල ශුද්ධ වර්ධනයක් සහ සමාලෝචිත වර්ෂය තුල මිලියන 122 ක තථ්‍ය වත්කම් ප්‍රමාණයක් හා රු. මිලියන 2801 ක මුළු වත්කම් ප්‍රමාණයක් තිබේ.

ද්‍රවශීලතා කළමනාකරණය

රු. මිලියන 619 ක සමාගමේ ශුද්ධ කාරක ප්‍රාග්ධනය (2019 දී රු. මිලියන 510) ප්‍රමාණයක් කෙටිකාලීන ආයෝජන වල වැඩිවීම නිසා සිදුව ඇත. 2020 තුළ රු. මිලියන 590 ක් සහ රු මිලියන 4454.9 ක් 2019 කෙටිකාලීන ආයෝජන සිදුව ඇත. 2020 දෙසැම්බර් 31 දිනට සමාගම සතුව කෙටිකාලීන ආයෝජන ලෙස රු. මිලියන 525 ක් තිබුන අතර මෙය 2019 හා සැසඳීමේ දී රු. මිලියන 430 කි. මෙම ආයෝජන තුළ රාජ්‍ය බැංකු වල කාලීන තැන්පත් පහත පරිදි වේ.

	31.12.2020 දිනට	31.12.2019 දිනට
මාස තුන තුළ කල් පිරෙන		
කාලීන තැන්පත් - ලංකා බැංකුව	30,000,000	60,200,000
කාලීන තැන්පත් - මහජන බැංකුව	-	-
කාලීන තැන්පත් - ජාතික ඉතිරි කිරීමේ බැංකුව	-	-
	30,000,000	**60,200,000**
මාස තුනකට පසුව කල් පිරෙන		
කාලීන තැන්පත් - ලංකා බැංකුව	200,000	160,000,000
කාලීන තැන්පත් - මහජන බැංකුව	495,200,000	50,000,000
කාලීන තැන්පත් - ජාතික ඉතිරි කිරීමේ බැංකුව	-	160,000,000
	495,200,000	**370,000,000**
එකතුව	**525,200,000**	**430,200,000**

ප්‍රකාශිත ප්‍රාග්ධනය

කොටස් නිකුත් කිරීමට අදාළව සමාගමට ලැබූ මුළු මුදල මෙමගින් හැඳින්වේ. 2020 දෙසැම්බර් 31 දිනට සමාගමේ සමස්ථ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. 200,000,010 ක් විය. මේ තුළ සාමාන්‍ය කොටස් 20,000,000 ක් හා ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාර ලේකම් විසින් දරන ස්වර්ණමය කොටසක් ඇතුළත්වේ. වසර තුලදී කිසිදු කොටස් වෙන් කිරීමක් සිදු ව නොමැත.

සංචිත

2020 දෙසැම්බර් 31 වන දිනට සමාගමේ සංචිත පහත පරිදි වේ.

	2020 රු. මිලියන	2019 රු. මිලියන
රඳවාගත් ලාභ	1,521	1,342
පෙව චත්කම් තක්සේරු සංචිත	375	368
පිළිඇගයුම් සංචිතය	115	-
වෙනත් සංචිත	65	68
	2,076	**1,778**

ලාභාංශ ගෙවීම

බොහෝ රාජ්‍ය ආයතන මහා භාණ්ඩාගාරයට බරක් වී ඇති අවධියක සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම ස්වයං මූල්‍ය ආයතනයක් ලෙස සාර්ථකව ක්‍රියාත්මක වීමට අමතරව ස්වර්ණමය කොටස්කරු වන මහා භාණ්ඩාරයට ලාභාංශ ද ගෙවීම තුළින් තමන්ගේ වගකීම මනා ලෙස ඉටු කර ඇත. මෙම වර්ෂය තුළද රාජ්‍ය කළමනාකාරිත්වය යටතේ ස්වයං මූල්‍ය ආයතනයක් ලෙස සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම සාර්ථකව කටයුතු කර ඇති බව අප ආඩම්බරයෙන් ප්‍රකාශ කරමු.

2005 වසරේ දී සමාගමේ කළමනාකාරිත්වය රජයට පවරා ගැනීමෙන් අනතුරුව සමාගම් ඉතිහාසයේ පළමු වරට ලාභාංශ ගෙවනු ලැබුවේ 2007 වසරේ දීය. 2007 වසරේ සිට අද දක්වා මහා භාණ්ඩාගාරය වෙත ලාභාංශයක් ලෙස ගෙවා ඇති මුළු මුදල රු. මිලියන 457.5 කි. 2020 මූල්‍ය වර්ෂය සඳහා රු. මිලියන 50 ගෙවීමට අපේක්ෂා කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලය

වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික නම් පහත දැක්වේ.

නම	පත්වූ දිනය
ආර්.පී.ජී. රාජපක්ෂ මයා - සභාපති	2021.07.09
ඒ.වී.කේ.එම්. හේරත් මිය - සභාපති (2021.07.08 ඉල්ලා අස්වූ)	2019.12.31
බී.එල්.ඒ.ජේ. ධර්මකීර්ති මයා	2020.02.05
(අධ්‍යක්ෂ - වැවිලි කර්මාන්ත අමා. අතිරේක ලේකම්) (2021.07.21 ඉල්ලා අස්වූ)	
ඩබ්ලිව්.ඩී.ආර්. ක්‍රිශාන්ත මයා - භාණ්ඩාගාර නියෝජිත	2020.01.11
එච්.ඒ. නදීක හෙට්ටිආරච්චි මයා - අධ්‍යක්ෂ	2020.01.15
ඩබ්ලිව්.ඒ.ජේ.ඩී.ජී. විජේසිංහ මයා - අධ්‍යක්ෂ	2020.01.15
එස්.ඊ. ඩයස් රත්නායක මයා - අධ්‍යක්ෂ	2020.01.15
එච්.සී.එම්.එම්. කුලසේකර මයා - අධ්‍යක්ෂ	2020.02.05
එම්.කේ.පී. රුක්මණී මිය	2021.07.21
(ප්‍රධාන ගණකාධිකාරී - පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය)	
ටී. වීදිරවික්‍රමසූරිය මයා - අධ්‍යක්ෂ	2021.08.16

අධ්‍යක්ෂවරු ගණුදෙනු කෙරෙහි ඇති සම්බන්ධය

අධ්‍යක්ෂවරුන් සෘජුව හෝ වක්‍රව හෝ සමාගමේ කොන්ත්‍රාත්වල කිසිදු ආකාරයේ සම්බන්ධයක් ඇති කර ගෙන නැත.

අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකම

සමාගමේ කිසිදු අධ්‍යක්ෂවරයෙකු හෝ තම කලාත්‍රයා සමාගමේ කිසිදු කොටස් සඳහා හිමිකම් පෑමක් නොකරයි.

විගණන කමිටුව

නම	මණ්ඩලයට පත්කළ දිනය
ඩබ්ලිව්.ඩී.ආර්. ක්‍රිශාන්ත මයා විගණන කමිටු සභාපති අධ්‍යක්ෂ - භාණ්ඩාගාර නියෝජිත	11.01.2020
බී.එල්.ඒ.ජේ. ධර්මකීර්ති මයා අධ්‍යක්ෂ - වැවිලි අමාත්‍යාංශයේ අතිරේක ලේකම්	22.02.2019
එච්.ඒ.එන්. හෙට්ටිආරච්චි මයා - අධ්‍යක්ෂ	15.01.2020

සේවා නියුක්තිය

සේවකයන්ට සැළකීමේ දී සමාගම සමානාත්මතා සංකල්පය මත ක්‍රියා කිරීමට සැම විටම ක්‍රියා කරයි. පුහුණුව, සංවර්ධනය සහ උසස්වීම ආදියේ දී සැමවිටම පදනම් කර ගන්නේ කුසලතාවයයි. එමෙන්ම ජාතිය, ආගම, දේශපාලනික මතවාද, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, විවාහක අවිවාහක බව හෝ ශාරීරික දුර්වලතා පිළිබඳව වෙනස්කම් නොදක්වා සැමටම සමාන අවස්ථාවක් ලබා දීමට කටයුතු කෙරේ.

ව්‍යවස්ථාපිත ගෙවීම්

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සිය උපරිම දැනුම අනුව සමාගම විසින් මූල්‍ය වාර්තා ඉදිරිපත් කරන දිනට ගෙවීමට නියමිත සියළු බදු සහ සමාගමේ සේවකයන් සඳහා ගෙවිය යුතු ගෙවීම් සහ අනෙකුත් පිළිගත් ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවා අවසන් කර ඇති බවට හෝ ගෙවීම් සිදු කිරීම සඳහා ප්‍රතිපාදන සළසා ඇති බවට අධ්‍යක්ෂවරුන් සහතික වේ.

මූල්‍ය වාර්තා ඉදිරිපත් කරන දිනට පසු සිදුවීම්

මෙම වාර්තාවේ අනාවරණය කර ඇති සිදුවීම් හැර මූල්‍ය වාර්තා ඉදිරිපත් කරන දිනයේ සිට මෙම වාර්තාව ඉදිරිපත් කරන දිනය දක්වා ගිණුම් ප්‍රකාශන කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් ඇති කෙරෙන වෙනත් කිසිදු සිදුවීමක් ඇති වී නොමැත.

විගණකවරු

2020 වසරේ ගිණුම් විගණනය විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත.

මූල්‍ය ප්‍රකාශන

2020 දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021 පෙබරවාරි 25 දින අනුමත කර ඇත.

මූල්‍ය ප්‍රකාශන සීමා. කුරුණෑගල වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කිරීම සඳහා ඒ.වී.කේ. මාධවී හේරත් (සභාපති) සහ ඩබ්ලිව්.ඩී.ආර්. ක්‍රිශාන්ත මහතා (අධ්‍යක්ෂ/ භාණ්ඩාගාර නියෝජිත) වෙත බලය පවරා ඇත.

වාර්ෂික මහා සභා රැස්වීම

වාර්ෂික මහා සභා රැස්වීම කොළඹ තාජ් සමුද්‍රා හෝටලය, ගාලුමුවදොර පාර දරණ ස්ථානයේ පිහිටි 2022 ජනවාරි 27 දින පෙ.ව. 11.30 ට පැවැත්වේ. වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ දැන්වීම මේ සමඟ අමුණා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කළේ,

ආර්.පී.පී. රාජපක්ෂ
සභාපති

ඩබ්ලිව්.ඩී.ආර්. ක්‍රිශාන්ත
අධ්‍යක්ෂ

කෝපරේට් ඇඩ්වයිසර් සවර්සස් (පුද්.) සමාගම
ලේකම්වරු - කුරුණෑගල වැවිලි සමාගම
2022 ජනවාරි 11 දින

අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශ සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පහත ප්‍රකාශයෙහි දක්වා ඇත. 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන වලට අනුව පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ විගණකවරුන්ගේ වගකීම විගණකවරුන්ගේ වාර්තාවේ දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කරුණු:

මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ ලාභ/ අලාභ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස පිළිබිඹු වන අයුරින් සකස් කළ විස්තීරණ ආදායම් ප්‍රකාශය සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන වලට අනුව මූල්‍ය වර්ෂය අවසානයේ දී සමාගමේ මූල්‍ය තත්ත්වය සත්‍ය හා සාධාරණ අයුරින් සකස් කරන ලද මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය. අධ්‍යක්ෂවරුන් මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී පහත දැක්වෙන කරුණු තහවුරු කළ යුතුව ඇත.

- අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගෙන ඒවා අඛණ්ඩව හා සංගතභාවයෙන් යුතුව යොදා ගැනීමටත් යම් බැහැරවීමක් සිදුවී ඇත්නම් ඒවා සවිස්තරාත්මකව අනාවරණය කිරීමට කටයුතු කිරීම
- අදාළ සියළුම ගිණුම් ප්‍රමිති අනුගමනය කර ඇති බව.
- නිශ්චයන් හා ඇස්තමේන්තු සාධාරණ හා විචක්ෂණශීලී ඒවා වීම.

මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගනෙ යාම සඳහා ප්‍රමාණවත් සම්පත් සමාගම සතුව ඇති බව සහ මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී අඛණ්ඩබව රඳවා ගැනීමට වග බලා ගැනීම ද අධ්‍යක්ෂවරුන්ට පැවරේ.

තවද සාධාරණ නිරවද්‍යතාවයකින් යුතුව ප්‍රමාණවත් තරම් ගිණුම් වාර්තා පවත්වා ගෙන යාමත්, සමාගමේ මූල්‍ය තත්ත්වය යහපත් මට්ටමකට ගෙන යාමටත් මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධානයන්ට අනුකූලව ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය බැඳී සිටී. සමාගම සතු වත්කම් ආරක්ෂා කිරීමටත් වංචා හා වෙනත් අක්‍රමිකතා හඳුනාගෙන ඒවා වැලැක්වීම පිණිස සුදුසු අභ්‍යන්තර පාලනයන් පවත්වාගෙන යාම අධ්‍යක්ෂ මණ්ඩලයේ ද වගකීමකි.

මූල්‍ය ප්‍රකාශ සකසා අවශ්‍ය පියවර ගැනීමට විගණකවරුන්ට සියළු පහසුකම් සැපයීම සහ තම විගණන මතය ලබා දීම සඳහා අවශ්‍ය කරන සියළු තක්සේරු පිළි ගැනීමට අධ්‍යක්ෂවරුන් බැඳී සිටී. සමාගම් පනත අනුව අධ්‍යක්ෂවරුන් විසින් සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම් වාර්තාව අදාල රැස්වීම් පැවැත්වෙන දිනට අවම වශයෙන් රාජකාරී දින 15 කට පෙරාතුව සියළු කොටස් හිමිකරුවන් වෙත යැවිය යුතු වේ. මෙම ප්‍රකාශන වල දක්වා ඇති සියළු වගකීම් ඉටු කරනු ලැබ ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

අනුකූලතා වාර්තාව

අධ්‍යක්ෂවරුන් විසින් ස්වකීය උපරිම දැනුම අනුව සමාගම විසින් ගෙවිය යුතු සියළු බදු, තීරු බදු සහ එහි සේවකයන් වෙත ගෙවිය යුතු සියළු ව්‍යවස්ථාපිත ගෙවීම් ගිණුම් වාර්තා ඉදිරිපත් කරන දිනය වන විට ගෙවනු ලබන ඇති බව හෝ ගෙවීම සඳහා ගිණුම් තුළ අවශ්‍ය වෙන්කිරීම් කර ඇති බව තහවුරු කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි

සීමා. කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පුද්.) සමාගම
ලේකම්වරු - සීමා. කුරුණෑගල වැවිලි සමාගම, කුරුණෑගල
2022 ජනවාරි 11 වන දින.

සභාපති

කුරුණෑගල ප්ලාන්ටේෂන්ස් ලිමිටඩ්

කුරුණෑගල ප්ලාන්ටේෂන්ස් ලිමිටඩ්හි 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

කුරුණෑගල ප්ලාන්ටේෂන්ස් ලිමිටඩ්හි 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපළ පිරියත උපකරණ යටතේ දැක්වෙන රු.මිලියන 139 ක කල් බදු ඉඩම්වලට අදාළ පිඹුරුපත් සමාගම සතුව නොතිබුණි. ඒ හේතුවෙන් ඉඩම් සම්බන්ධයෙන් සමාගමට ඇති නෛතික අයිතිය සහ නිරවුල්තාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ආ) කුරුණෑගල වැවිලි සමාගමට වගා කටයුතු සඳහා බදු දී තිබුණු ඉඩම් වලින් රජයේ විවිධ අරමුණු සඳහා නිදහස් කරන ලද හෙක්ටයාර් 1,751 ක ඉඩම්වලට අදාළව මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු කල්බදු කුලිය 2009 වර්ෂයේ සිට නතර කිරීමට සමාගම ගෙන තිබුණු තීරණයට, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ හෝ භාණ්ඩාගාරයේ අනුමැතිය ලැබී නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ගෙවා නොමැති කල්බදු කුලිය වන රු.මිලියන 221 ක මුදල සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කර නොතිබුණි.

(ඇ) 1992 වර්ෂයේ ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් සමාගමට ලබා දුන් ඉඩම්වලින් සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.මිලියන 67 ක් වටිනා ඉඩම් හෙක්ටයාර් 1751 ක් රජයේ සහ විවිධ පොදු අවශ්‍යතා සඳහා නිදහස්කර තිබුණද , එම නිදහස් කළ ඉඩම් පිළිබඳව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඈ) පොත්අගය රු.11,923,616 ක් වූ මෝටර් වාහන 160 ක් සමාලෝචිත වර්ෂයේදී රු.127,803,190 ක අගයකට ප්‍රත්‍යාගණනය කර තිබුණද, දේපළ පිරියත හා උපකරණ සම්බන්ධයෙන් වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක. 16 හි 73 (e) ඡේදය අනුව එම ප්‍රත්‍යාගණිත වටිනාකම සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපළ පිරියත හා උපකරණ ශේෂය තුළ වෙන් කර අනාවරණය කර නොතිබුණු අතර, ප්‍රමිතයේ 77 ඡේදය අනුව ප්‍රත්‍යාගණනය සම්බන්ධයෙන් සිදු කළයුතු හෙළිදරව් කිරීම්ද මූල්‍ය ප්‍රකාශනවල සිදු කර නොතිබුණි.

(ඉ) දේපළ පිරියත හා උපකරණ සම්බන්ධයෙන් වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි ඡේද අංක. 51 හා 61 ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විට සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති පිරිවැය රු.3,113,150 ක් වටිනා පරිඝණක, රු. 8,591,207 ක් වූ උපකරණ සහ රු.2,351,155 ක් වූ ගෘහභාණ්ඩ යන වත්කම් සමාගම විසින් තවදුරටත් භාවිතා කළද, එම ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක. 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ණයගැතියන් සඳහා බොල් ණය හා අඩමාණ ණය වෙන් කිරීම් වෙනුවෙන් සමාගම අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කර නොතිබුණි.

(උ) ව්‍යාපාරික ලාභය මත බදු වගකීම රු.7,616,547 ක් හා ආයෝජන ආදායම මත බදු වගකීම රු.14,308,673 ක් වශයෙන් එකතුව රු.21,925,220 ක වගකීමක් මූල්‍ය ප්‍රකාශනවල නොදැක්වීම හේතුවෙන් වර්ෂයේ බදු වලට පසු ලාභය රු. 21,925,220 කින් අධිගණනය වී තිබුණු අතර, එම ප්‍රමාණයෙන් ජංගම වගකීම් ඌන ගණනය වී තිබුණි.

(ඌ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 4 වන උපලේඛන 1 (1) අනුව ගොඩනැගිලි සඳහා ප්‍රාග්ධන දීමනාව වසර 20 ක් ලෙස ගණනය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ සමාගම විසින් මිලදී ගත් රු.33,385,858 ක ගොඩනැගිලි සඳහා ප්‍රාග්ධන දීමනාව ගණනය කිරීමේ දෝෂයක් හේතුවෙන් එය එක් වසරක් ලෙස සැලකීම නිසා රු.4,440,319 කින් විලම්භිත බදු වගකිම වැඩි වී තිබූ අතර බදු වලට පසු ලාභයද එම වටිනාකමින් අඩු වී තිබුණි.

(එ) ආදායම් බදු සම්බන්ධයෙන් වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක. 12 හි 61A ඡේදය ප්‍රකාරව ලාභයට හෝ අලාභයට පරිබාහිරව හඳුනාගන්නා අයිතමයන්ට අදාළ විලම්භිත බදු , ලාභය/ අලාභයට පරිබාහිරව හඳුනා ගත යුතු වුවත් එසේ සිදුකර නොතිබූ අතර ප්‍රමිතයේ 62 (a) ඡේදය අනුව දේපළ ප්‍රත්‍යාගණනයෙන් සිදුවන ධාරණ අගයන්ගේ වෙනස්වීම් මත ඇතිවන විලම්භිත බදු අනෙකුත් විස්තිර්ණ ආදායම් යටතේ හඳුනාගත යුතු වුවත්, සමාගම සමාලෝචිත වර්ෂයේ සිදුකළ මෝටර් රථ ප්‍රත්‍යාගණනය මත ඇතිවන සමස්ත බලපෑම වන රු.16,767,677ක වටිනාකම විලම්භිත බදු වගකීම්, විලම්භිත බදු වියදම් සහ අනෙකුත් විස්තිර්ණ ආදායම් යටතේ හඳුනා ගැනිමකින් තොරව, රු.1,179,555 ක් විලම්භිත බදු වත්කමක් ලෙස හඳුනාගැනීම හේතුවෙන් විස්තිර්ණ ආදායම් රු.16,223,140 කින් හා වසරේ ලාභය රු. 1,724,092 කින් වැඩි වී විලම්භිත බදු වගකීම රු.17,947,232 අඩු වී තිබුණි. තවද මෙම බලපෑම ප්‍රත්‍යාගණන සංචිතයට ගැලපිය යුතු වුවත් සමාගම විසින් එසේ සිදු කර නොතිබුණි.

(ඒ) සමාගමේ බදු සඳහා වූ සංශෝධිත ලාභය වූ රු.54,403,910 ක වටිනාකමින් සියයට 14 ක් එනම් රු.17,616,548 ක් විලම්භිත බදු වගකීමක් ලෙස හඳුනාගැනීම හේතුවෙන් එම වටිනාකමින් සමාගමේ විලම්භිත බදු වගකීම් වැඩියෙන් සහ වසරේ බදු පසු ලාභය අඩුවෙන් පෙන්නුම් කර තිබුණු අතර, සමාගමේ පෙර වර්ෂවලින් ඉදිරියට ගෙන ආ බදු අලාභ වූ රු.89,503,736 ක් මෙම විලම්භිත බදු වගකීම ගණනයේදී විලම්භිත බදු වත්කමක් ලෙස යොදා නොගැනීම හේතුවෙන් රු. 12,530,523 කින් විලම්භිත බදු වගකීම වැඩියෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සමාගමේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ

යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, මූල්‍ය ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

2.1.1 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) (ඈ) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ දැක්වෙන 1.2 (අ) (ආ) (ඇ), 2.2.2(අ) (ආ) (ඇ) යන ඡේදවල දැක්වෙන නිරීක්ෂනයන් හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2. අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	විස්තරය
(අ)	1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 02 ඡේදය	චක්‍රලේඛයේ කිසිදු විධිවිධානයක් සැලසී නොතිබියදී සමාගම විසින් සමාගමේ මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් 09 දෙනෙකු සඳහා එක් අයෙකුට මසකට රු.10,000 බැගින් එකතුව රු.මිලියන 1.08 ක ගැලපුම් දීමනාව යනුවෙන් දීමනාවක් සහ විධායක මට්ටමේ නිලධාරීන් වෙත සමාලෝචිත වර්ෂයේදී වෛද්‍යාධාර දීමනා ලෙස රු.1,418,894 ක් ගෙවා තිබුණි.
(ආ)	2009 මැයි 29 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 01 ඡේදය	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ හෝ මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදීද සමාගමේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ සහ මාණ්ඩලික නිලධාරීන් 09 දෙනෙකු සඳහා වතු කම්කරුවන් සේවයේ යොදවා ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු රු.මිලියන 5.4 ක සේවක වැටුප්, එසේ කම්කරුවන් සේවයේ යොදවා නොගෙන මුදල් බවට පරිවර්තනය කළ හැකි සේවක දීමනා ලෙස අදාළ නිලධාරීන් වෙත ගෙවා තිබුණි.
(ඇ)	2015 මැයි 25 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 02 ඡේදය	නිල වාහන හිමිකම් නොමැති ප්‍රධාන කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරීන් පස් දෙනෙකුට නිල වාහන පහසුකම් ලබා දී තිබුණු අතර, එම වාහන සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 1.02 ක ඉන්ධන වියදමක්ද දරා තිබුණි.

2.2.3. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා	සටහන	2020 රු.	2019 රු.
ආදායම	4	685,267,268	498,675,657
විකුණුම් පිරිවැය	5	(409,477,281)	(385,717,645)
දල ලාභය		275,789,987	112,958,012
ලාභ /(පාඩු) - සාධාරණ අගෙව වත්කම් වටිනාකම	16.2	7,800,153	19,801,889
වෙනත් මෙහෙයුම් ආදායම	6	51,118,052	73,492,888
පරිපාලන සහ අලෙවි වියදම්	7	(126,086,981)	(115,247,075)
ලාභය - මෙහෙයුම් ක්‍රියාකාරකම්		**208,621,211**	**91,005,713**
ශුද්ධ මූල්‍ය ආදායම / (වියදම්)	8	6,325,540	29,165,193
බදු පෙර ලාභය		**214,946,751**	**120,170,906**
ආදායම් බදු වියදම	9	(28,312,387)	(18,132,567)
වසර තුළ ලාභය		**186,634,364**	**102,038,339**
වෙනත් සම්පූර්ණ ආදායම			
ස්ථිර වත්කම් නැවත තක්සේරුව		(2,733,269)	2,900,441
ප්‍රතිඅගයුම් සංචිතය		115,879,574	-
එකතුව - වසරේ සම්පූර්ණ ආදායම		**299,780,669**	**104,938,780**
කොටසක ඉපැයුම	**10**	**9.33**	**5.10**

ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවලම කොටසකි.

මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට	සටහන	2020 රු.	2019 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
බදු අයිතිය යටතේ ඇති ඉඩම්	11	63,988,435	66,609,849
නිශ්චල කල්බදු වත්කම් (හිස් ඉඩම් හැර)	12	17,033,916	20,539,864
දේපල, පිරියත සහ උපකරණ	13	1,751,813,564	1,506,431,377
පාරිභෝජ්‍ය පෙව විද්‍යාත්මක වත්කම්	14	211,139,706	209,633,348
වෙනත් මූල්‍ය වත්කම්	15	11,023,123	10,152,846
		2,054,998,744	1,813,367,284
ජංගම වත්කම්			
ඵලදරන පෙව විද්‍යාත්මක වත්කම් වල නිෂ්පාදිතය	16.1	19,613,444	13,954,054
තොග	16.3	43,002,315	51,597,548
තැන්පත්	17	879,700	1,086,700
පූර්ව ගෙවීම්	18	1,808,745	1,961,862
පූර්ව ගෙවූ වියදම - කෙටි කාලීන ව්‍යාපෘති	19	8,075,010	3,479,044
වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ	20	63,838,696	78,879,164
බදු අධි ගෙවීම්		9,066,720	9,060,199
වෙනත් මූල්‍ය වත්කම්	15	9,772,910	9,322,065
කෙටි කාලීන ආයෝජන	21	525,200,000	430,200,000
මුදල් හා බැංකු ශේෂය	22	65,632,685	24,952,228
		746,890,225	624,492,865
මුළු වත්කම්		**2,801,888,968**	**2,437,860,149**
සමකොටස් හා බැරකම්			
ප්‍රාග්ධනය හා සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	23	200,000,010	200,000,010
රඳවාගත් ඉපයීම්		1,521,567,946	1,342,271,311
පෙවවිද්‍යාත්මක වත්කම් තක්සේරු සංචිතය		375,691,316	368,353,586
ප්‍රත්‍යාගණන සංචිතය වාහන		115,879,574	-
වෙනත් සංචිත		65,486,351	68,219,620
		2,278,625,196	1,978,844,527
ජංගම නොවන බැරකම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැදීම්	24	90,476,078	79,007,165
ශුද්ධ බැරකම - බදු හිමියාට	25	83,650,434	87,215,638
විලම්බිත බදු බැරකම	26	221,255,796	192,943,409
		395,382,308	359,166,212
ජංගම බැරකම්			
ශුද්ධ බැරකම - බදුකරුට	25	3,565,204	3,565,204
ලද අත්තිකාරම්	27	3,938,052	5,244,537
ආදායම් බදු - ගෙවිය යුතු		-	-
වෙලඳ හා වෙනත් ගෙවිය යුතු දෑ	28	120,378,208	91,039,669
		127,881,464	99,849,410
මුළු සමකොටස් හා බැරකම්		**2,801,888,968**	**2,437,860,149**

ගිනුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි කොටසක් වේ.
ගිණුම්කරණ ප්‍රතිපත්ති 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන වලට අනුකූලව සකසා ඇත.

ඩී.අරියරත්න දිසානායක
කළමනාකරු - මූල්‍ය

එස්.එම්.එම්. සමරකෝන්
ප්‍රධාන විධායක නිලධාරී

මෙම මූල්‍යප්‍රකාශන සැකසීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමකි.
සීමා. කුරුණෑගල වැව්ලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ ඒ වෙනුවෙන් අනුමත කර අත්සන් තබන ලදී.

ඒ.වී.කේ. මාධවී හෙරත්
සභාපති
කුරුණෑගල, 2021පෙබරවාරි 25

ඩබ්ලිව්.ඩී.අමල් ක්‍රිශාන්ත
අධ්‍යක්ෂ/ භාණ්ඩාගාර නියෝජිත

දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා	ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.	දැව සංචිතය රු.	වෙනත් සංචිත රු.	තක්සේරු සංචිතය රු.	රඳවාගත් ඉපැයුම් රු.	මුළු සම කොටස් රු.
ශේෂය - 2019 ජනවාරි 01 දිනට	**200,000,010**	**348,089,274**	**65,319,178**	**-**	**1,387,997,284**	**2,001,405,746**
ශුද්ධ ලාභය - 2019 වසරේ					102,038,339	102,038,339
වෙනත් සම්පූර්ණ ආදායම			2,900,441			2,900,441
මාරු කළා - පෙර විද්‍යාත්මක වත්කම් සංචිතය		19,801,889			(19,801,889)	-
සමකොටස් - 2016/2017/2018				-	(127,500,000)	(127,500,000)
ශේෂය - 2019 දෙසැම්බර් 31 දිනට	**200,000,010**	**367,891,163**	**68,219,619**	**-**	**1,342,733,735**	**1,978,844,526**
ශුද්ධ ලාභය - 2020 වසර					186,634,364	186,634,364
වෙනත් සම්පූර්ණ ආදායම			(2,733,269)		-	(2,733,269)
ප්‍රතිඇගයුම් සංචිතය				115,879,574		115,879,574
මාරු කළා - පෙර විද්‍යාත්මක වත්කම් සංචිතය		7,800,153			(7,800,153)	-
සමකොටස්						-
ශේෂය - 2020 දෙසැම්බර් 31 දිනට	**200,000,010**	**375,691,316**	**65,486,350**	**115,879,574**	**1,521,567,946**	**2,278,625,196**

ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවලම කොටසකි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා	2020 රු.	2019 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් වූ මූල්‍ය ප්‍රවාහ		
ආදායම් බදු වියදම් වලට පෙර ලාභය	214,946,751	120,170,906
පහත පරිදි ගැලපුම් කර ඇත		
ක්ෂය සහ ක්‍රමක්ෂය	54,558,205	51,641,458
ප්‍රතිපාදන - විශ්‍රාම පාරිතෝෂික බැදීම්	18,260,157	16,329,411
පාඩුව - වගා හානි	-	-
නොමේරූ වගා මාරු කිරීම් වියදමට	-	-
ප්‍රතිඅඟයුම් සංචිත - වාහන	115,879,574	-
ලාභය - දේපල, පිරියත සහ උපකරණ ඉවත් කිරීම්	(56,700)	
ලාභය - ඵලදරණ වගා අලෙවිය	(19,318,559)	(35,952,689)
සාධාරණ අගයන් වෙනස්වීමේ වාසි (පිරිවැය අඩු කොට විකිණීම)		
- පාරිභෝජ්‍ය ජෛව විද්‍යාත්මක වත්කම්	(7,800,153)	(26,137,021)
ශුද්ධ මුදල් ආදායම	**(6,325,540)**	**(29,165,193)**
කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර ලාභය	370,143,734	96,886,872
කාරක ප්‍රාග්ධන වෙනස්කම්		
තොග	8,595,233	(5,060,908)
තැන්පත්	207,000	80,000
අත්තිකාරම්	146,595	1,013,958
වෙලඳ හා වෙනත් ලැබීමට නියමිත දෑ	11,451,048	(14,427,332)
පූර්ව ගෙවූ වියදම් - කෙටි කාලීන ව්‍යාපෘති	(4,595,966)	1,337,594
ලත් අත්තිකාරම්	(1,306,485)	(1,784,088)
වෙළඳ හා වෙනත් ගෙවීමට ඇති දෑ	29,338,539	(21,782,587)
ඉපයූ මුදල් - මෙහෙයුම්	**413,979,699**	**56,263,509**
විශ්‍රාම පාරිතෝෂික වියදම් ගෙවීම	(9,524,514)	(11,336,914)
ගෙවූ ආදායම් බදු	-	(7,702,574)
ගෙවූ රඳවා ගැනීමේ බදු	-	(3,573,098)
ආර්ථික සේවා ගාස්තු ගෙවනලද	-	-
ශුද්ධ මුදල් - මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උපයාගත්	**404,455,185**	**33,650,923**
ආයෝජන ක්‍රියාකාරකම් තුළින් වූ මූල්‍ය ප්‍රවාහ		
දේපල, පිරියත හා උපකරණ වලට අමතරව	(305,939,924)	(204,733,176)
පාරිභෝජ්‍ය ජෛවිද්‍යාත්මක වත්කම් වලට අමතරව	11,484,928	(198,189)
දේපල, පිරියත හා උපකරණ වලින් ලත් මුදල්	-	-
ඵල දරන වැවිනි - පොල් සහ රබර් ගස් ඉවත් කිරීමෙන් ලත් මුදල	19,344,212	36,555,424
පාරිභෝජ්‍ය ජෛවිද්‍යාත්මක වත්කම් අලෙවියෙන් ල් මුදල	1,307,420	9,115,271
ශුද්ධ ආයෝජන - කාලීන තැන්පත්	(125,200,000)	165,200,000
ලත් පොලී මුදල	39,169,757	70,184,174
ශුද්ධ මුදල් ගලන - ආයෝජන ක්‍රියාකාරකම් වලට යොදාගත්	**(359,833,608)**	**76,123,504**
මුදල් ගලන - මූල්‍ය ක්‍රියාකාරකම් මඟින්		
කල්බදු කුලී ගෙවනලද	(32,820,000)	(31,794,000)
කෙටිකාලීන ණය ගැනීම්වල පොලී	-	(258,586)
කාර්ය මණ්ඩල ණය	(13,142,350)	(14,927,000)
කාර්ය මණ්ඩල ණය අයකර ගැනීම්	11,821,228	14,635,739
ගෙවූ සම කොටස්	-	(127,500,000)
ශුද්ධ මුදල් ගලන - මූල්‍ය ක්‍රියාකාරකම් වලට භාවිත	**(34,141,122)**	**(159,843,847)**
වැඩිවීම/(අඩුවීම) - මුදල් හා මුදල් වලට සමාන දෑ	**10,480,456**	**(50,069,421)**
මුදල් හා මුදල් වලට සමාන දෑ - වසරාරම්භක	85,152,228	135,221,649
මුදල් හා මුදල් වලට සමාන දෑ- කාලවසාන (**A** සටහන)	95,632,685	85,152,228

සටහන - A

මුදල් හා මුදල් වලට සමාන දෑ - දිනට	31.12.2020 Rs.	31.12.2019 Rs.
මාස තුනකින් කල් පිරෙන කාලීන තැන්පත්		
ලංකා බැංකුව	30,000,000	60,200,000
මහජන බැංකුව	-	-
ජාතික ඉතිරි කිරීමේ බැංකුව	-	-
භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිලදී ගැනීම	47,000,000	13,000,000
බැංකුගත මුදල්	14,879,925	8,497,433
අතැති මුදල්	3,743,433	3,443,889
තැපැල් ගාස්තු/ මුද්දර	9,327	10,906
	95,632,685	**85,152,228**

ගිණුම් ප්‍රතිපත්ති

01. පොදු

1.1 ආයතනයේ නෛතික ස්වභාවය

සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගම (KPL) 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හා රජයට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධිවිධානයන්ට අනුකූලව 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ පිහිට වූ සීමිත පොදු සමාගමක් වන අතර, එය 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ එය නැවත ලියාපදිංචි කර ඇත. සමාගමේ ලියාපදිංචි කාර්යාලය කුරුණෑගල, දඹුලු පාරේ, අංක 80 දරණ ස්ථානයේ පිහිටා ඇත.

තනි කොටස්කාර සමාගමක් වන මෙම සමාගමේ තනි කොටස්කරු ශ්‍රී ලංකා රජයේ මහා භාණ්ඩාගාරයයි.

1.2 ප්‍රධාන කටයුතු සහ ව්‍යාපාර ස්වභාවය

අදාළ වර්ෂයේ දී සමාගමේ ප්‍රධාන කටයුතු ලෙස පොල්, රබර් සහ වෙනත් කෘෂි නිෂ්පාදන වගා කිරීම, නිෂ්පාදනය සහ විකිණීම සිදු කෙරිණි. සමාගමේ පහත විස්තර කර ඇති පරිදි වතු යායන් 8 ක ඇති අතර ඒවා කුරුණෑගල, ගම්පහ හා අනුරාධපුර දිස්ත්‍රික්කයන්හි ව්‍යාප්තව ඇත.

අත්තනගල්ල	දඹදෙණිය
දොඩන්ගස්ලන්ද	කුරුණෑගල
කටුගම්පල	නාරම්මල
හිරියාල	

02. සැකසීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශනය

විස්තීරණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් වලින් සමන්විත මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ නියමයන්ට අනුව ඉදිරිපත් කර ඇත.

2.2 අඛණ්ඩ පැවැත්ම

අධ්‍යක්ෂවරුන් විසින් සමාගමේ අඛණ්ඩ පැවැත්ම තබා ගැනීමේ සක්‍යතාවය පිළිබඳ තක්සේරුවක් සිදු කරන ලද අතර, ව්‍යාපාර කටයුතු අත්හිටුවීමේ හෝ අහවර කිරීමේ අභිලාෂයක් නොමැති බව තහවුරු ව ඇත.

2.3 ඉදිරිපත් කිරීමේ පදනම

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයන්හි දැක්වෙන පහත අයිතමයන් හැර සියළුම ප්‍රමාණාත්මක අයිතමයන් ඓතිහාසික පිරිවැයට පෙන්නුම් කරන අතර මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත සකස් කර ඇත.

- ජනවසම/ ශ්‍රී.ලං.රා.වැ.සං. හිස් බදු ඉඩම් හිමිකම ප්‍රත්‍යාගණනිත අගයන්ට දක්වා ඇත. - සටහන් අංක 11.
- පරිභෝජ්‍ය පෙව වත්කම් විකිණුම් පිරිවැය අඩු කර සාධාරණ අගය මත තක්සේරු කර ඇත - සටහන් අංක 14
- විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් ආයුෂනක තක්සේරුවක් හදුනා ගෙන ඇත (ශ්‍රී ලංකා ප්‍රමිති අංක 19) - සටහන් අංක 24
- පෙව වත්කම් වලින් නෙලාගත් කෘෂිභෝග අස්වැන්න ශුද්ධ උපලබ්ධික අගය මත තක්සේරු කර ඇත. ශුද්ධ උපලබ්ධිත අගය, ඇස්තමේන්තු විකුණුම් මිලෙන් ඇස්තමේන්තුගත විකුණුම් වියදම් අඩු කිරීමෙන් ගණනය කර ඇත.

මූල්‍ය ප්‍රකාශයන්හි උද්ධමන සාධකයන් සඳහා කිසිදු ගැලපුමක් සිදු කර නොමැත.

2.4 ව්‍යවහාරික හා ඉදිරිපත් කරන මුදල් වර්ගය

මූල්‍ය ප්‍රකාශයන් සමාගමේ ව්‍යාවහාරික මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත. සියළු මූල්‍ය අයිතමයන් ආසන්නතම රුපියලට වටිනාකම් කර ඇත.

2.5 ඇස්තමේන්තු හා නිශ්චයන් භාවිතය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS/LKAS) අනුකූලව මූල්‍ය ප්‍රකාශ සැකසීමේ දී වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් වලට අදාලව නිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් යොදා ගැනීම අවශ්‍ය වේ.

අදාළ නිශ්චයන් සහ ඇස්තමේන්තු තත්ත්වයන් තුළ සාධාරණ යැයි හැගෙන පූර්ව අත්දැකීම්, ප්‍රවනතා සහ වෙනත් සාධක මත පදනම් වේ. ඒ අනුව සැබෑ ප්‍රතිඵල අදාළ නිශ්චයන් සහ ඇස්තමේන්තු වලින් වෙනස් විය හැක.

වලංගුභාවය තහවුරු කර ගැනීම උදෙසා අදාළ ඇස්තමේන්තු සහ උපකල්පනයන් නිරන්තර සමාලෝචනයට ලක් කෙරේ. ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම අදාළ සංශෝධනය සිදු කරන කාල පරිච්ඡේදයට හා ඉදිරියට බලපාන පරිදි හදුනා ගැනේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී යොදාගත්, මූල්‍ය ප්‍රකාශන සඳහා ප්‍රමාණාත්මක බලපෑමක් ඇති කරන අගයන් සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්ති ආශ්‍රිත නිශ්චයන් පහත දැක්වෙන සටහන් වල ඇතුළත් වේ.

සටහන 12 - නිශ්චල කල්බදු වත්කම්

(හිස් ඉඩම්ව බදු හිමිකම හැර)

සටහන 14 - පාරිභෝජ්‍ය පෙව වත්කම්

සටහන 24 - නිර්ණායකළ විශ්‍රාම ප්‍රතිලාභ වගකීම

සටහන 26 - විලම්බිත බදුකරණය

2.6 සංසන්දනාත්මක තොරතුරු

වඩාත් සාධාරණ ඉදිරිපත් කිරීමක් සඳහා ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ඉදිරිපත් කිරීම් සහ වර්ගීකරණයන් සමඟ සැසඳෙන පරිදි, පෙර වසර වල මූල්‍ය ප්‍රකාශනයන්හි ඉදිරිපත් කිරීම් සහ වර්ගීකරණයන් සංශෝධනය කර ඉදිරිපත් කර ඇත.

03. ප්‍රධාන ගිණුම් ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශයන් සැකසීමේ දී යොදා ගනු ලැබූ ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ. මෙම ප්‍රතිපත්ති ප්‍රකාශ කර දක්වා නොමැති වුවද සියළුම වසර වලදී නිරතුරුව අනුගමනය කර ඇත.

3.1 වත්කම් හා ඒවා තක්සේරු පදනම

මූල්‍ය ප්‍රකාශයන්හි ජංගම වත්කම් වශයෙන් වර්ග කොට ඇත්තේ සමාගමේ සාමාන්‍ය ව්‍යාපාර මෙහෙයුම් චක්‍රය තුළ උපලබ්ධි වන

හෝ වාර්තා කරන දින සිට වසරක් තුළ උපලබ්ධි වන වත්කම්ය. ජංගම වත්කම් හැර වෙනත් වත්කම් වනුයේ සමාගම විසින් වාර්තා කරන දින සිට වසරකට වඩා වැඩි කාලයක් පවත්වාගෙන යාමට අදහස් කරන වත්කම් වේ.

3.1.1 දේපල, පිරියත හා උපකරණ

3.1.1.1 හඳුනා ගැනීම හා ගණනය

දේපල, පිරියත හා උපකරණ දක්වා ඇත්තේ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත අපහායන අලාභ අඩු කිරීමෙන් පසුවය. මෙම අරමුණ සඳහා වූ පිරිවැය අදාල වත්කම අපේක්ෂිත ක්‍රියාකාරී මට්ටමට හෝ භාවිතයට ගෙන ඒමට වැය කරන සෘජු වියදම් ඇතුලත් කොට ඉදිරිපත් කෙරේ.

සමාගම විසින් ඉදිකරන ලද වත්කම්වල පිරිවැය අමුද්‍රව්‍ය, සෘජු ශ්‍රමය සහ වෙනත් සෘජු වියදම් වලින් යුක්ත වේ. මෙහිදී යම් පවත්නා වත්කමක් ඉවත් කිරීම සම්බන්ධයෙන් දරනු ලබන යම් පිරිවැයක් වේනම් එයද නව වත්කමේ පිරිවැය ගණනය කිරීමේදී එකතු කරනු ලැබේ. නොනිමි ප්‍රාග්ධන වැඩ අදාළ වත්කම පළමුවෙන් භාවිතා කරන මෙහොතේ දී නියමිත වත්කම ගිණුම් වෙත මාරු කෙරේ. වෙනස් වූ ආර්ථික ඵලදායී ජීව කාලයක් ඇති දේපල, පිරියත හා උපකරණ වෙත වෙනම අයිතම වශයෙන් පෙන්නුම් කෙරේ. මාර්ග ඉදිකිරීම සහ වෙනත් ප්‍රධාන පෙළේ යටිතල පහසුකම් සංවර්ධනයන් ය.

දේපල පිරියත හා උපකරණ ඉවත් කිරීමෙන් ලැබෙන ලාභ හෝ අලාභ අදාල දේපල සහ පිරියත වල ධාරණ වටිනාකම සහ ඒවා ඉවත් කිරීමෙන් ලැබෙන ආදායමෙහි අන්තරය වශයෙන් සැළකෙන අතර ඒවා විස්තීරණ ආදායම් ප්‍රකාශනයෙහි වෙනත් ආදායම් යටතේ දැක්වේ.

3.1.1.2 පසුකාලීන වියදම්

පවත්නා දේපල, පිරියත සහ උපකරණ මත සිදු කරන ලද වියදමක ප්‍රතිඵල ලෙස ආරම්භයේ දී එම වත්කම් වලින් තක්සේරු කරන ලද අනාගත ආර්ථික ප්‍රතිලාභ ප්‍රමාණය ඉක්මවා ප්‍රතිලාභ ලබා දෙනු ඇතැයි අපේක්ෂිත කල්හි හා එම වියදම සාධාරණව හඳුනා ගත හැකි විටෙක එම වියදම් ප්‍රාග්ධනිත කෙරේ. වත්කමෙහි පවත්වා වර්තමාන වටිනාකම ඉවත් කරනු ලැබේ.

දේපල, පිරියත හා උපකරණ වඳිනෙදා නඩත්තු කිරීමේ පිරිවැය විස්තීරණ මූල්‍ය ප්‍රකාශනයේ වියදම් ලෙස හඳුනා ගැනේ. ප්‍රත්‍යාගණිත වත්කමක් ඉවත් කරන අවස්ථාවක, ප්‍රත්‍යාගණන අතිරික්ත සංචිතයේ ඇතුලත්වන මුදල රැඳවූ ඉපැයීම් වලට මාරුවේ.

3.1.1.3 වටිනාකම ඉවත් කිරීම

දේපල, පිරියත හා උපකරණ ඉවත් කිරීමේ දී හෝ එමගින් අනාගත ආර්ථික ප්‍රතිලාභ තවදුරටත් නොලැබෙන කළ එහි පවතින වටිනාකම ඉවත් කෙරේ. අදාළ ඉවත් කිරීමෙන් ලැබෙන ලාභ හෝ අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ වෙනත් ආදායම් යටතේ හඳුනා ගැනේ.

3.1.1.4 ණය පිරිවැය

කිසියම් වත්කමක් අත්පත් කර ගැනීමේ දී, ඉදි කිරීමේ දී හෝ නිෂ්පාදනයේ දී එම කටයුත්ත සඳහා ගනු ලබන ණය මුදලකට අදාළ ණය පිරිවැය පහත කරුණු වලට යටත්ව ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. අදාළ වත්කම අපේක්ෂිත කාර්ය සඳහා යොදා ගන්නා තෙක් එම කාලයට අදාළ ණය පිරිවැය පමණක් එම වත්කමේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කෙරේ. ප්‍රාග්ධනීකරණය සඳහා සුදුසුකම් ලබන ණය පිරිවැය ප්‍රමාණය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 23 ට අනුව තීරණය කෙරේ.

ප්‍රාග්ධනිත නොකළ ණය පිරිවැය ඒවා සිදු වූ කාලයට අදාළ වියදමක් ලෙස ගැනෙන අතර විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ඇතුලත් වේ.

3.1.1.5 ක්ෂයවීම් හා ක්‍රමක්ෂය

ක්ෂයවීම් ගණනය කරනුයේ වත්කමේ පිරිවැය, හෝ පිරිවැය වෙනුවට වියදම් කළ වෙනත් මුදල, වත්කමක ක්ෂය කළ හැකි වටිනාකම මත පදනම්වය. ක්ෂයවීම් එක් එක් වත්කමේ ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය මත සරල මාර්ග ක්‍රමය යටතේ සිදු කෙරේ. බදු පදනමට ලබා ගත් වත්කමක් අදාළ බදු කාලය පරිච්ඡේදය හෝ අදාළ වත්කමේ ඵලදායී ජීව කාලය යන දෙකෙන් වඩාත් කෙටි කාලය තුල ක්‍රමක්ෂය කෙරේ. කල්බදු කාලය අවසානයේ සමාගමට හිමිකාරත්වය අත් වන තත්වය තුල කල්බදු දේපල කල් බදුකාල සීමාව හා ඒවායේ ඵලදායී ජීව කාලය යන දෙකෙන් අඩු එකට ක්ෂය කෙරේ. ඉඩම් ක්ෂය නොකෙරේ.

තථ්‍ය හා සංසන්දනාත්මක කාල සීමාවන් හි ඇස්තමේන්තුගත ජීව කාලය පහත දක්වා ඇත.

වත්කම් වර්ගය	වසර
ගොඩනැගිලි	40
විදුලි සැපයුම්	40
සූර්ය බලශක්ති පද්ධති	10
ලිං	40
වැට ඉදිකිරීම්	03
රථවාහන	05
යන්ත්‍ර	13 1/3
ලී බඩු හා සවිකිරීම්	10
උපකරණ	08
වාරි සම්පාදන	08
පරිඝනක	05
ඉඩම් සංවර්ධන	05

2018 වසර ද ඇතුළත්ව සමාගම විසින් සිදු කළ ක්ෂය කිරීම් පහත දක්වා ඇත. කිසියම් වත්කමක් ක්ෂය කිරීම එය භාවිතාවට ගනු ලබන අවස්ථාවේ සිට ඇරඹෙන අතර අදාල වත්කම විකිණීම සඳහා හදුනාගත් අවස්ථාවේ දී හෝ එම වත්කම භාවිතයට ගැනීම අත්හරින දිනයේ දී අවසන් වේ. එවැනි වත්කමක් ඉවත් කරන අවස්ථාවකදී එකී වත්කම ඉවත් කරන පූර්ණ වර්ෂය තුල ක්ෂය කිරීම් අදාළ කෙරේ.

කෙසේ වුවද, ශ්‍රීලංගිප්‍ර 16 ට අනුව වත්කමක ක්ෂයවීම එය භාවිතායට ගන්නා දින සිට අදාළ වන බැවින් 2019 වසරේ මිලදී ගත් වත්කම්වල ක්ෂයවීම් අවශ්‍ය පරිදි සිදු කර ඇත.

3.1.1.6 ඉඩම් සංවර්ධන පිරිවැය

මාර්ග, පාලම් හා පොකුණු ඉදිකිරීම් වැනි ඉඩම් සංවර්ධනය සඳහා සමාගම කළ වියදම් 2018 වන තුරු ක්ෂය නොකළද එම වසරේ සිට ඉදිරියට එවැනි පිරිවැය ක්ෂය කර ඇත. 2018 වසරට පෙර කළ පිරිවැය ඉතිරි ඵලදායී ජීව කාලයට ක්ෂය කර තිබේ.

වත්කමක් අලෙවිය සඳහා තැබෙන අවස්ථාවක වත්කමක ක්ෂය නතර වන අතර උක්ත ක්ෂය ප්‍රතිපත්තියට යටත්ව එය පිළි නොගැනේ. ක්ෂය ක්‍රමය, ඵලදායී ජීව කාලය සහ අඩුවන වටිනාකම් අදාල පරිදි එක් එක් මූල්‍ය වසර අවසානයේ සමාලෝචනය කර ගලපා ගැනීම සිදුවේ.

කල්බදු වත්කම් පහත කාල වලට අදාළව සමාන මුදලකින් ක්‍රමක්ෂය කර ඇත.

වත්කම් වර්ගය	වසර
හිස් ඉඩම්	53
ගොඩනැගිලි	25
යන්ත්‍ර	15
මේරූ වගා	30
ඉඩම් සංවර්ධන පිරිවැය	30

3.1.1.7 කල්බදු වත්කම්

මූල්‍ය කල්බදු යටතේ ලබා ගෙන ඇති සමාගමට පසුව පැවරූ වත්කම් සහ කල්බදු වත්කම් වල හිමිකාරත්වයට අදාළ වන සියළු අවදානම් හා පහසුකම් ඒවා සෘජුව මිලදී ගත් ඒවා ලෙස සැලකෙන අතර ඒවායේ මූල්‍ය වටිනාකමට ප්‍රාග්ධනිත කර ඇත. මූල්‍ය කල්බදු පදනමට ලබා ගත් වත්කම් බදු කාල සීමාව හෝ අදාළ වත්කම් වල ඵලදායී ජීව කාලය යන දෙකෙන් වඩාත් කෙටි කාලය තුළ ක්‍රමක්ෂය කෙරේ. බදු හිමිකරුට ගෙවීමට ඇති ප්‍රධාන / ප්‍රාග්ධන අංග බැරකම් / බැදීම් ලෙස දක්වා ඇත.

බදු කාල සීමාව තුල හිමිකාරත්වයට අදාළ අවදානම් සහ ප්‍රතිලාභ බදු හිමියා විසින් රඳවා ගන්නා අවස්ථාවන්හි ඒවා මෙහෙයුම් කල් බදු සම්බන්ධයෙන් ගෙවනු ලබන බදු වාරික වියදමක් සේ සලකා විස්තීරණ ආදායම් ප්‍රකාශය තුල හඳුනා ගනී.

3.1.1.8 මූල්‍යමය නොවන වත්කම්වල අපහායනය

සමාගම විසින් සෑම වාර්තා කරන දිනයකදී ම වත්කමක් අපහායනය වීමට හැකියාවක් ඇත් දැයි සලකා බැලේ. එවැනි හානි විමක් පිළිබඳ සංඥාවක් හෝ පවතී නම් හෝ හානිවීම් සම්බන්ධව වාර්ෂික පරීක්ෂාවක් අවශ්‍ය වූ අවස්ථාවක සමාගම විසින් වත්කමේ ඉදිරි ආවරණ වටිනාකම පිළිබඳව තක්සේරුවක් සිදු කෙරේ.

කිසියම් වත්කමක මුදල් ප්‍රවාහයන් උත්පාදනය නොකරන්නේ නම්, අදාල වත්කමේ ආවරණය කර ගත හැකි වටිනාකම, එම ධාරණ වටිනාකමට වඩා වැඩිනම් සහ එහි සෘබෑ වටිනාකමෙන් එම වත්කම විකිණීම සඳහා දැරීමට සිදුවේ යැයි අපේක්ෂිත විකුණුම් වියදම් අඩු කර සාධාරණ අගයට වාර්තාව කරනු ලැබේ. වත්කමක ධාරන වටිනාකම එහි ආවරණය කර ගත හැකි වටිනාකම ඉක්මවා තිබෙන අවස්ථාවක අදාළ වත්කම අපහානයන් වූ බවට සැලෙකෙන අතර එහි වටිනාකම ආවරණය කර ගත හැකි අගය දක්වා අඩු කරනු ඇත.

වත්කමක සැබෑ වටිනාකම තක්සේරු කිරීමේ දී එම වත්කමේ ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහයන් බදු පෙර වට්ටම් අනුපාතයන් යොදා ගනිමින් ඒවායේ තථ්‍ය වටිනාකමට වට්ටම් ගත කෙරේ. මීට අමතරව විකිණීමේ පිරිවැය අඩුකළ සැබෑ වටිනාකම තීරණය කිරීමේ දී මෑතකාලීන ගණුදෙනු ද සැලකිල්ලට ගැනේ. එවැනි ගණුදෙනු නොමැති අවස්ථාවක උචිත තක්සේරු ආකෘතින් භාවිතාවට ගනු ලැබේ. අපහායන අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හදුනා ගැනේ. පෙර හදුනාගත් අපහායනය අලාබයක් ආපසු හරවනු ලබන්නේ අදාළ වත්කමේ ආවරණ වටිනාකම තීරණය කිරීමේ දී යොදාගත් ඇස්තමේන්තු වල වෙනසක් සිදු වුවහොත් පමණි. එවැනි ආපසු හැරවීමක මූල්‍ය බලපෑම විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

3.1.2 පෙව වත්කම්

පෙව වත්කම් මේරූ හා නොමේරූ ලෙස වර්ග කෙරේ. මේරූ පෙව වත්කම් යනු අස්වැන්න නෙලාගත හැකි තත්ත්වයට පත්වූ වගා වන අතර නොමේරූ පෙව වත්කම් යනු තවමත් අස්වැන්න නෙලා ගත නොහැකි තත්වයට පත් නොවූ වගාවන්ය. පෙව වත්කම් ඵල දරන වත්කම් හා පාරිභෝජ්‍ය පෙව වත්කම් ලෙස වැඩිදුරටත් වර්ගීකරණය කෙරේ. ඵලදරන පෙව වත්කම් වලට විකිණීමට හෝ නෙලීමට අපේක්ෂාවෙන් තබා නොමැති පොල් සහ රබර් වගා ඇතුලත් වේ. පාරිභෝජ්‍ය පෙව වත්කම් ලෙස වර්ග කරනුයේ තේක්ක, මහෝගනි, හල්මිල්ල, මිල්ල වැනි වාණිජ වටිනාකමක් ඇති වතුවල සැලසුම් සහගතව නොකළ වගා ඇතුලත් වේ.

3.1.2.1 ඵලදරණ පැල

ඵලදරන පෙව වත්කම් මනිනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය වීමේ හා අපහායනය අලාබයන් අඩු කිරීමෙන් අනතුරුව වන අතර දේපල, පිරියත හා උපකරණ සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 ට අනුව එය සිදු කෙරේ.

යම් වගාවක් වාණිජමය අස්වැන්න නෙලා ගැනීමේ තත්ත්වයට පත් වන තුරු දරනු ලබන බිම් සැකසුම් ඇතුළු වගාව ස්ථාපනය සඳහා දරනු ලබන සහ පොහොර යෙදීම් වැනි එම වගා නඩත්තුව සදහා දරනු ලබන පිරිවැය නොමේරූ වගා යටතේ වර්ග කෙරේ. මෙම නොමේරූ වගා පිරිවැය එම වගා සඳහා වන සෘජු පිරිවැය, එම වගා සෘජුව අදාල වන දිගුකාලීන ණය සඳහා වූ පොලි පිරිවැය යන පිරිවැය වල එකතුවක් ලෙස ගණනය කෙරේ. නොමේරූ තත්වයේ පැවති වගාවක් මේරූ තත්වයට පත් වූ විටක එසේ සිදුවූ වර්ෂයේ අවසානයේ එම වගාව සඳහා දරා ඇති පිරිවැය මේරූ වගා යටතට මාරු කෙරේ. මේරූ ඵලදරන පෙව වත්කම් වීවායේ ඵලදායී ජීවිත කාලය අනුව පහත පරිදි ක්ෂය කෙරේ.

වත්කම ආර්ථික ඵලදායී ජීවිත කාලය (වසර)

වර්ගය (භෝගය)	ප්‍රධාන බෝග	අතුරු බෝග	ජීවිත කාලය (වසර)
පොල්	10	NA	50
රබර්	06	NA	20
කජු	06	08	20
කුරුඳු	06	06	20
ඩ්‍රැගන් පෘට්	03	04	20
කොකෝ	05	06	20
දෙහි	05	06	20
අඹ	06	08	20
ගම්මිරිස්	06	07	20
රඹුටන්	06	08	20
කෝපි	07	08	20
පුවක්	08	10	20
දූරියන්	08	10	20
දූරියන්	08	10	20
පේර	04	06	06

යම් ඵල දරන වත්කමක සිදුවන ස්ථිර අපහායනයක් විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ සම්පූර්ණයෙන්ම හදුනා ගන්නා අතර, පාඩුව හඳුනා ගැනීමෙන් අනතුරුව එය සිදු වූ වසර තුල එවැනි වත්කම් වල ශුද්ධ ධාරන අගයන්ගෙන් අඩු කෙරේ.

ගස් ඉවත් කිරීම FIFO පදනම මත සිදු කෙරේ.

3.1.2.2 ඵල දරන වගාවල පාළු සිටුවීමේ පිරිවැය

පාළු සිටුවීමට අදාළව කරන ලද ඉඩම් සංවර්ධන පිරිවැය ප්‍රාග්ධනිත කෙරේ. එය සිදු කරන්නේ අදාළ ක්ෂේත්‍රයේ ආර්ථික ආයු කාලයේ වර්ධනයක් එය මීට පෙර තක්සේරු කළ කාර්යසාධනයට වඩා වැඩිවීමක් සිදුව ඇති අවස්ථාවක සහ මෑතකදී තක්සේරු කළ අදාළ මේරූ වගාවේ ඉතිරිව ඇති භාවිත ආර්ථික ආයුකාලය හෝ කල් ඉකුත්නොවූ කල් බදු කාලය යන දෙකෙන් එකකට වඩා අඩුවිම මත සිදු කෙරේ.

ප්‍රාග්ධනය කරනු නොලබන පාළු සිටුවීමේ පිරිවැය එය දැරූ වර්ෂයේ වියදමක් ලෙස ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

3.1.2.3 පාරිභෝජ්‍ය පෙව වත්කම්

පාරිභෝජ්‍ය පෙව වත්කම් යටතේ ගැනෙන දැව ගස් මූලික හඳුනා ගැනීමේ දී ගණනය කරන අතර එක් එක් වාර්තා කරන කාලසීමාව අවසානයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 41 අනුව විකිණුම් පිරිවැය අඩුකර සාධාරණ අගයට ගණනය කෙරේ. දැව ගස්වල සාධාරණ වටිනාකම, වත්මන් දැව මිල ගණන් සහ එම දැව ගස් පරිනත තත්වයට පත් වූ විට එම ගස් වලින් අපේක්ෂිත දැව පරිමාව සැලකිල්ලට ගනිමින් වට්ටම් කළ මුදල් ප්‍රවාහ ක්‍රමය යොදා ගෙන ගණනය කෙරේ. නොමේරූ ගස්වල පිරිවැය සාධාරණ අගයට ආසන්න අගයක් ලෙස සලකා කටයුතු කරනු ලැබේ. මෙම ගණනය කිරීම සුදුසුකම් ලත් ස්වාධීන තක්සේරුකරුවෙකු විසින් කල් පිරුණ විට සිදු කෙරේ.

පාරිභෝජ්‍ය පෙව වත්කම් මූලික හඳුනා ගැනීමේ දී හඳුනා ගනු ලබන වාසි හෝ අවාසි සහ ඉන් පසුව එම වත්කම්වල සාධාරණ අගය වෙනස්වීම හේතුකොටගෙන ඇති වන්නා වූ ලාභ හෝ අලාභ ඒවා හට ගන්නා කාල පරිච්ඡේදයට අදාළ විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ. මේ හා සම්බන්ධ සියළුම වෙනත් උපකල්පන අංක 14 දරණ සටහනේ දක්වා ඇත.

වට්ටම්කළ මුදල් ප්‍රවාහ ක්‍රමය (DCF) තුල ප්‍රධාන විචල්‍යයන්

විචල්‍ය	විස්තරය
දැව ප්‍රමාණයේ	රු.
වත්මන් වටිනාකම	උස හා වට ප්‍රමාණය භෞතිකව තහවුරු කර ගැනීමෙන් හා විවිධ භූගෝලිය ප්‍රදේශවල එක් එක් දැව වර්ගවල වර්ධනය සැළකිල්ලට ගෙන ඇස්තමේන්තු සකස් කෙරේ. මෙහිදී දැව නෙලීමට අදාළව බලාත්මක සියළුම ව්‍යවස්ථාපිත විධිවිධාන සමාගමේ වන සැළැස්ම සමඟ සැලකිල්ලට ලක් කෙරේ.
ආර්ථික ඵලදායී කාලය	එක් එක් දැව විශේෂයන් හි සාමාන්‍ය ජීවිත කාලය ආයු කාලයට අනුව තීරණය කෙරේ.
විකුණුම් මිල	රටේ පවතින වෙළඳපොල මිල ගණන් අනුව ඇස්තමේන්තු සකසේ. මෙහිදී දැව ගස් විකුණුම් තත්වයට පත් කිරීම සඳහා සම්පූර්ණ කළ යුතු සියළුම අවශ්‍යතා පිළිබඳව සැලකිලිමත් වේ.
වට්ටම් අනුපාතය	අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීම සඳහා 14% ක වට්ටම් අනුපාතය යොදා ගෙන ඇත.

3.1.2.4 හඳුනා ගැනීම හා ගණනය

සමාගම විසින් පෙව වත්කම් හඳුනා ගනු ලබන්නේ අදාළ වත්කම මගින් අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත හිමිවන බවට තහවුරුවක් පවතින්නේ නම් සහ එම වත්කම් සම්බන්ධ පාලනය සමාගම සතුව පවතින්නේ නම් පමණි. එල දරන පෙව වත්කම් එහි පිරිවැයෙන් සමුච්චිත ක්ෂයවීම් හා අපහායන අලාභ අඩු කිරීමෙන් පසු ලැබෙන වටිනාකමට ගණනය කෙරේ.

එල දරන පෙව වත්කම් පිරිවැයට සමුච්චිත ක්ෂය සහ සමුච්චිත පළුදු පාඩු නොතකා ගණනය කෙරේ. එවැන්නක් තිබෙන අවස්ථාවක දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 එනම් දේපල පිරියත හා උපකරණ වලට අදාල නියමය අදාළ කෙරේ.

පාරිබෝජ්‍ය දැව ගස් මූලික හඳුනා ගැනීමේ දී හා එක් එක් වාර්තා කරන කාල සීමාව අවසානයේ දී ගිණුම්කරණ ප්‍රමිති අංක 41 ට අනුව ඒවායේ සැබෑ අගයෙන් අලෙවි පිරිවැය අඩු කර සාධාරණ වටිනාකමට හඳුනා ගෙන වාර්තා කෙරේ. මෙම කාලසීමාව තුළ මිල තීරණය අපහසු බැවින් ලපටි පැල වල පෙව හුවමාරුවෙහි බලපෑම තිබෙන බැවින් ලපටි පැල වල (වසර 5 ට අඩු) සාධාරණ වටිනාකමේ උපරිමයට පිරිවැය සැකසේ.

3.1.3 මූල්‍ය ක්‍රමවේද

(අ) හඳුනා ගැනීම හා මූලික ගණනය

වෙළඳ ලැබීමට නියමිත දෑ ඒවා ඇතිවන තත්ත්වය තුළ මූලිකව හඳුනා ගැනේ. වෙනත් සියළුම මූල්‍ය වත්කම් හා මූල්‍යමය බැරකම් කොන්ත්‍රාත්තුමය විධිවිධාන වල සමාගම පාර්ශ්වකරුවෙකු වන අවස්ථාවක මූලිකව හඳුනා ගැනේ.

සාධාරණ නොවන අගයක් සහිත මූල්‍යමය වත්කම් හෝ මූල්‍යමය බැරකමක් විස්තීරණ ආදායම් ප්‍රකාශය හරහා ලාභ අලාභ ඔස්සේ සාධාරණ අගයට හඳුනා ගැනේ. එහිදී ඒයට අදාළ ගණුදෙනු පිරිවැය ද සැලකිල්ලට ගනු ලැබේ.

(ආ) වර්ගීකරණය හා පසුකාලීන ගණනය

මූල්‍ය වත්කම් - 2018 ජනවාරි 1 සිට අදාළවන ප්‍රතිපත්තිය

මූලික හඳුනා ගැනීම තුළ මූල්‍ය වත්කමක් ක්‍රමක්ෂිත පිරිවැය; වෙනත් විස්තීරණ ආදායම් හරහා සාධාරණ වටිනාකම FVOCI - සමකොටස් ආයෝජනය වසේ නැතහොත් FVTPL ලෙස වර්ගීකරණය කෙරේ.

ව්‍යාපාරික මොඩලයේ වෙනසින් පසුව පළමු දින්වා සිටින දිනයේදී නැවත වර්ගීකරනය කළ මූල්‍ය වත්කම් කළමනාකරණයේ දී සමාගම තම ව්‍යාපාරික මොඩලය වෙනස් කර ගන්නා තෙක් මූල්‍ය වත්කම් ඒවායේ මූලික හඳුනා ගැනීමට අනතුරුව ප්‍රතිවර්ගීකරණය නොකෙරේ.

මූල්‍ය වත්කමක් පහත දැක්වෙන කොන්දේසි දෙකම සපුරන විටක හා FVTPL වෙන් නොකරන අවස්ථාවක ක්‍රමක්ෂිත පිරිවැයට ගණනය කෙරේ.

- කොන්ත්‍රාත්තුමය මුදල් ගලන ඒකතු කර ගැනීම සඳහා වත්කම් රඳවා ගැනීමේ අරමුණින් ව්‍යාපාරික මොඩලය මත රඳවා ගැනීම; සහ
- හිඟව ඇති ප්‍රධාන මුදලට අදාළ පොලිය හා ගෙවීම අවශ්‍ය වන මුදල් ගලන වල සුවිශේෂිත දින පිළිබඳව කොන්ත්‍රාත් වගන්ති තුළ සඳහන්වීම.

පහත දැක්වෙන කොන්දේසි දෙකම සපුරන විටක හා FVTPL වෙන් නොකරන අවස්ථාවක ණය ආයෝජන FVOCI ට ගණනය කෙරේ.

- කොන්ත්‍රාත් මුදල් ගලන හා විකුණුම් මූල්‍ය වත්කම් යන දෙක මගින් ව්‍යාපාරික මොඩලයේ අරමුණ රඳා පැවතිම; සහ
- හිඟව ඇති ප්‍රධාන මුදලට අදාළ පොලිය හා ගෙවීම අවශ්‍ය වන මුදල් ගලන වල සුවිශේෂිත දින පිළිබඳව කොන්ත්‍රාත් වගන්ති තුළ සඳහන් වීම.

වෙළඳාම සඳහා තබා නොමැති සමකොටස් ආයෝජනයක් මූලිකව හඳුනා ගැනීමේ දී OCI හි ආයෝජනවල සාධාරණ

වටිනාකමේ පසුව ඇති වූ වෙනස්කම් සඳහා සමාගම අනිවාර්යෙන්ම යොමු වේ. මෙම තේරීම ආයෝජන පදනම මත සිදු කෙරේ.

ක්‍රමක්ෂිත පිරිවැයට හෝ FVOCI ගණනය කල ලෙස වර්ගීකරණය නොකල සියලු මූල්‍ය වත්කම් ඉහත විස්තර කර දක්වා ඇත. මේ තුල සියළුම ව්‍යුත්පන්න මූල්‍ය වත්කම් අඩංගු වේ. මූලික හදුනා ගැනීමේ දී වෙනත් ආකාරයකින් පැන නගින ගිණුම්කරණ නොගැලපීම ඉවත් කිරීම හෝ සැලකිය යුතු ලෙස අඩු කිරීම නම්, ක්‍රමක්ෂය කළ පිරිවැයකින් හෝ FVOCI හි FVTPI හි මැනිය යුතු අවශ්‍යතා සපුරාලන මූල්‍ය වත්කමක් සමාගම විසින් ආපසු හැරවිය නොහැකි ලෙස නම් කළ හැකිය.

මූල්‍ය වත්කම් - ව්‍යාපාරික මොඩලයේ තක්සේරුව:

ව්‍යාපාර වත්කම් කළඹ මට්ටමින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර ආකෘතියේ පරමාර්ථය සමාගම විසින් තක්සේරු කරනු ලැබේ, ඊට හේතුව මෙය ව්‍යාපාරය කළමනාකරණය කරන ආකාරය සහ කළමනාකරණයට තොරතුරු සපයන ආකාරය මනාව පිළිබිඹු කරයි. සළකා බැලූ තොරතුරු තුළ අඩංගුවන දෑ

කළඹ සඳහා ප්‍රකාශිත ප්‍රතිපත්ති සහ අරමුණු සහ එම ප්‍රතිපත්ති ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම. කළමනාකරණයේ උපායමාර්ගය කොන්ත්‍රාත් පොලී ආදායම උපයා ගැනීම, විශේෂිත පොලී අනුපාත පැතිකඩක් පවත්වා ගැනීම, මූල්‍ය වත්කම්වල කාලසීමාව අදාළ වගකීම්වල කාලයට ගැලපීම හෝ අපේක්ෂිත මුදල් ගලා ඒම හෝ වත්කම් විකිණීමෙන් මුදල් ප්‍රවාහයන් සාක්ෂාත් කර ගැනීම යන කරුණු ඇතුළත් වේ.

ව්‍යාපාර ආකෘතියේ ක්‍රියාකාරිත්වයට බලපාන අවදානම් (සහ එම ව්‍යාපාර ආකෘතිය තුළ ඇති මූල්‍ය වත්කම්) සහ එම අවදානම් කළමනාකරණය කරන ආකාරය සහ

පෙර කාලවල දී මූල්‍ය වත්කම් විකිණීමේ වාර ගණන, පරිමාව සහ වේලාව, එවැනි විකුණුම් සඳහා හේතු සහ අනාගත විකුණුම් ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන්.

හඳුනා ගැනීම සඳහා සුදුසුකම් නොලබන ගනුදෙණු වල මූල්‍ය වත්කම් තෙවන පාර්ශ්වයකට පැවරීම. මෙම අරමුණු සඳහා විකුණුම් ලෙස නොසැලකේ, සමාගමේ වත්කම් අඛණ්ඩව පිළිගැනීමට අනුකූල වේ. වෙළඳාම සඳහා තබා ඇති හෝ කළමනාකරණය කරනු ලබන සහ සාධාරණ වටිනාකමක් මත කාර්ය සාධනය ඇගයීමට ලක් කරන මූල්‍ය වත්කම් FVTPL හි මනිනු ලැබේ.

මූල්‍ය වත්කම් - කොන්ත්‍රාත්තුමය මුදල ප්‍රධාන හා පොලී ලෙස තහවුරු කර ගැනීම: 2018 ජනවාරි 1 දින සිට අදාළවන ප්‍රතිපත්තිය

මෙම තක්සේරුවේ දී, මූලික පිළිගැනීම පිළිබඳ මූල්‍ය වත්කම්වල සාධාරණ වටිනාකම ලෙස ''ප්‍රධානී අර්ථ දක්වා ඇත.'' පොලිය යන්න මුදල්වල කාල වටිනාකම ලෙස සළකා බැලීම ලෙස අර්ථ ගන්වා ඇති අතර, විශේෂිත කාල සීමාවක් තුළ ඉතිරිව ඇති ප්‍රධාන මුදල හා සම්බන්ධ ණය අවදානම හා පිරිවැය (උදා. ද්‍රවශීලතා අවදානම හා පරිපාලන වියදම්), මෙන්ම ලාභ ප්‍රමාණය සලකා බැලේ. කොන්ත්‍රාත්තුමය මුදල් ගලන යනු තනිකරම ප්‍රධාන හා පොළී ලෙස තක්සේරු කිරීමේ දී, උපකරණයේ කොන්ත්‍රාත්තුමය වගන්ති සමාගම සැලකිල්ලට ලක් කෙරේ. මේ තුළ කාලය හෝ කොන්ත්‍රාත්තුමය මුදල් ගලන ප්‍රමාණය වෙනස් කළ හැකි දැයි තක්සේරු කෙරේ.

මෙම තක්සේරුව සිදු කිරීමේ දී සමාගම අවධානයට ලක් කරන කරුණු අතර

- මුදල් ගලන වල ප්‍රමාණය හා කාලය වෙනස් කළ හැකි හදිසි අවස්ථා;
- වෙනස්විය හැකි අනුපාත අංග ඇතුළුව කොන්ත්‍රාත් කූපන් අනුපාත සීරු මාරු කරන වගන්ති;
- අංග පෙර ගෙවුම හා කල් දිගු කිරීම ; සහ
- විශේෂිත වත්කම් වලින් මුදල් ප්‍රවාහ වලට සමාගමට ඇති හිමිකම සීමා කරන වගන්ති.

පෙරගෙවුම් මුදල, මූලික හා පොලී නිර්ණායකයන් පමණක් ගෙවීමට අනුකූල වන අතර, පෙරගෙවුම් මුදල සැලකිය යුතු ලෙස නොගෙවා ඇති මූලික මුදල හා පොළිය ගෙවිය යුතු ප්‍රධාන මුදල සඳහා කැපී පෙනේ. මීට අමතරව, වට්ටම් හෝ වාරිකයකින් අත්පත් කර ගත් මූල්‍ය වත්කමක් සඳහා, ගිවිසුම්ගත සමානුපාතික මුදල සහ උපචිත (නමුත් නොගෙවූ) ගිවිසුම් පොළිය සැලකිය යුතු ලෙස නිරූපණය කරන මුදලකට පෙර ගෙවුම් ගෙවීමට අවසර දෙන හෝ අවශ්‍ය කරන ලක්ෂණයකි (ඊට සාධාරණ අමතර මූලික හඳුනාගැනීමේදී පෙර ගෙවුම් අංගයේ සාධාරණ වටිනාකම වැදගත් නොවන්නේ නම්, කලින් අවලංගු කිරීම සඳහා වන වන්දි) මෙම නිර්ණායකයට අනුකූල වේ.

මූල්‍ය වත්කම් - පසුකාලීන ගණනය සහ පාඩු හා ලාභ - 2018 ජනවාරි 1 දින සිට අදාල වන ප්‍රතිපත්තිය

FVTPL හි මූල්‍ය වත්කම්

මෙම වත්කම් පසුකාලීනව සාධාරණ අගයට ගණනය කෙරේ. කිසියම් පොලි හෝ ලාභාංශ ආදායම ඇතුළු ශුද්ධ වාසි හා අවාසි ලාභ හෝ පාඩු තුළ හදුනා ගෙන ඇත.

ක්‍රමක්ෂිත පිරිවැයට මූල්‍ය වත්කම්

මෙම වත්කම් සක්‍රිය පොලී ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂිත පිරිවැයට පසුකාලීනව ගණනය කෙරේ. පළුදු පාඩු මගින් ක්‍රමක්ෂිත පිරිවැය අවම කෙරේ. පොලී ආදායම, විදේශ විනිමය වාසි හා පාඩු සහ පළුදුවීම් ලාභ හෝ අලාභ තුළ හදුනා ගැනේ. හදුනා නොගැනීමේ වාසි හෝ අවාසි ලාභ හෝ පාඩු තුළ හදුනා ගැනේ.

FVOCI හි ණය ආයෝජන

මෙම වත්කම් පසුව සාධාරණ වටිනාකමට මනිනු ලැබේ. සක්‍රිය පොලී ක්‍රමය භාවිතා කරමින් ගණනය කරනු ලබන පොලී ආදායම, විදේශ විනිමය ලාභ සහ අලාභ හා හානිය ලාභය හෝ අලාභය ලෙස හඳුනා ගැනේ. අනෙකුත් ශුද්ධ ලාභ සහ අලාභ OCI හි හඳුනා ගෙන ඇත. හඳුනා ගැනීමේ දී, OCI හි එකතු වී ඇති වාසි සහ අලාභ ලාභ හෝ අලාභ ලෙස නැවත වර්ගීකරණය කෙරේ.

FVOCI හි සමකොටස් ආයෝජන

මෙම වත්කම් පසුව සාධාරණ වටිනාකමකින් මනිනු ලැබේ. ලාභාංශ පැහැදිලිවම ආයෝජන පිරිවැයෙන් කොටසක් අයකර ගැනීමක් නියෝජනය නොකරන්නේ නම් ලාභාංශ ලාභයේ හෝ අලාභයේ ආදායමක් ලෙස හඳුනා ගැනේ. අනෙකුත් ශුද්ධ ලාභ සහ අලාභ OCI හි හඳුනාගෙන ඇති අතර ඒවා කිසි විටෙකත් ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය නොකෙරේ.

මූල්‍ය වත්කම් - 2018 ජනවාරි 1 දිනට පෙර පැවති ප්‍රතිපත්තිය. සමාගම තම මූල්‍ය වත්කම් පහත දැක්වෙන වර්ග වලින් එකකට වර්ගීකරණය කර ඇත.

- ණය හා ලැබීමට නියමිත දෑ;
- කල් පිරීමට තබා ඇති;
- අලෙවියට තබා ඇති හා
- FVTPL දී, සහ මෙම වර්ගය තුල:
- අලෙවියට තබා ඇති
- Derrivative Hedjing Instruments
- FVTPL දී පත්කරන ලද

මූල්‍ය වත්කම් - පසුකාලීන ගණනය හා වාසි අවාසිඃ 2018 ජනවාරි 1 ට පෙර අදාළවූ ප්‍රතිපත්තිය

FVTPL හි මූල්‍ය වත්කම්

සාධාරණ අගයට ගණනය කර, පොලිය හෝ සමකොටස් ආදායම ඇතුළු එහි වෙනස්කම් ආදායම් හෝ පාඩු තුළ හඳුනා ගැනේ.

මූල්‍ය වත්කම් - කල්පිරීමට නියමිතව ඇති

සක්‍රිය පොලි ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කෙරේ.

ණය හා ලැබීමට නියමිත දෑ

සක්‍රිය පොලි ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂිත පිරිවැය ගණනය කෙරේ.

අලෙවියට තබා ඇති මූල්‍ය වත්කම්

පළුදු පාඩු, පොලී ආදායම සහ ණය උපකරණ වල විදේශ මුදල් වෙනස්කම් හැර ගණනය කළ සාධාරණ වටිනාකම හා එහි වෙනස්කම් OCI හි පිළිගෙන සාධාරණ අගය සංචිතයේ රාශිභූත කර ඇත. මෙම වත්කම පිලි නොගන්නා අවස්ථාවක, සමකොටස් වල රාශිභූත වී ඇති වාසි හෝ අවාසි ලාභ හෝ පාඩු බවට ප්‍රතිවර්ගිකරණය කර ඇත.

මූල්‍ය බැරකම් - වර්ගීකරණය, පසුකාලීන ගණනය සහ වාසි හා අවාසි

මූල්‍ය බැරකම් ක්‍රමක්ෂිත පිරිවැයට හෝ FVTPL ට ගණනය කළ සේ වර්ග කර ඇත. මූල්‍ය බැරකමක් අලෙවිය සඳහා තබා ඇති ලෙස, මූලික පිළිගැනීමේ දී වර්ග කර නැත්නම් FVTPL ලෙස වර්ග කර ඇත. මූල්‍ය වත්කම් FVTPL හිදී සාධාරණ වටිනාකමට ගණනය කර ඇති අතර පොලි වියදම ඇතුළුව ශුද්ධ වාසි හා පාඩු ලාභ හෝ අලාභ ලෙස හඳුනා ගෙන ඇත. වෙනත් මූල්‍ය බැරකම් සක්‍රිය පොලී ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂිත පිරිවැයට පසුකාලිනව ගණනය කර ඇත. පොලි වියදම හා විදේශ විනිමය වාසි හෝ අවාසි ලාභ හෝ පාඩු ලෙස හඳුනා ගෙන ඇත. පිළිනොගැනීම නිසා වන වාසි හෝ අවාසි ද ලාභ හෝ පාඩු තුළ දක්වා ඇත.

(ඇ) පිළිනොගැනීම

මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කම් වලින් ලැබෙන මුදල් ප්‍රවාහයන් සඳහා වන ගිවිසුම්ගත අයිතිවාසිකම් කල් ඉකුත් වූ විට හෝ මූල්‍ය වත්කම්වල හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස සැලකිය යුතු ගනුදෙනුවක දී ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් ලබා ගැනීමේ අයිතිය සමාගම විසින් මාරු කරනු ලැබේ. මාරු කරන ලද හෝ සමාගම විසින් හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැළකිය යුතු ලෙස මාරු නොකරන හෝ රඳවා නොගන්නා අතර එය මූල්‍ය වත්කම් පාලනය නොකරයි.

සමාගම ගණුදෙනු වලට එළැඹෙමින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හදුනා ගෙන ඇති වත්කම් මාරු කරනවා වුවද මාරු කළ වත්කම් වල අවදානම් හා ප්‍රතිඵල සියල්ල සමස්තය ලෙස හෝ කොටසක් ලෙස රඳවා ගනී. මෙම තත්ත්වයන් තුළ මාරුකළ වත්කම් හදුනා නොගැනේ.

මූල්‍ය බැදීම්

ගිවිසුම්ගත බැඳීම් නිදහස් කරන විට හෝ අවලංගු කරන විට හෝ කල් ඉකුත් වූ විට සමාගම මූල්‍ය වගකීමක් හඳුනා ගනී. සමාගම විසින් එහි කොන්දේසි වෙනස් කරන විට සහ නවීකරණය කරන ලද වගකීම්වල මුදල් ප්‍රවාහයන් සැලකිය යුතු ලෙස වෙනස් වන විට මූල්‍ය වගකීමක් අවලංගු කරයි, එම අවස්ථාවේ දී නවීකරණය කරන ලද නියමයන් මත පදනම් වූ නව මූල්‍ය වගකීමක් සාධාරණ වටිනාකමකින් හඳුනා ගැනේ.

මූල්‍ය බැරකමක් පිළිනොගන්නා අවස්ථාවකදී අවසන් ධාරණ අගය හා ගෙවූ මුදල (මාරුකළ මුදල් නොවන වත්කම් හෝ බැරකම් ඇතුළුව) අතර වෙනස ලාභ හෝ පාඩු වල හඳුනා ගැනේ.

හිලව් කිරීම

මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් හිලව් කර මූල්‍ය තත්වය ප්‍රකාශනයේ ශුද්ධ මුදල මූල්‍ය තත්ව ප්‍රකාශය දක්වා ඇත. දින වකවානු සහිතව එහි මුදල් පියවන සමාගමට දැනට ඇති නෛතික හිමිකමත් ශුද්ධ පදනම මත එම මුදල් පියවීමට අපේක්ෂා කිරීමත් හෝ වත්කම බේරා බැරකම එකවර ගෙවීමට ඇති හැකියාව එමගින් දක්වයි.

පළුදු ප්‍රතිපත්තිය ඃ 2018 ජනවාරි 1 දින සිට අදාළ වන - ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්

මූල්‍යමය උපකරණ හා කොන්ත්‍රාත් වත්කම්

වෙළඳ ලැබීමට නියමිත දෑ වලට අදාළ ලාභ ප්‍රතිපාදන සර්වකාලීන අපේක්ෂිත ණය පාඩුව (ECL) මුදලට නිතරම ගණනය කෙරේ.

මූල්‍ය වත්කමක ණය අවදානම ECLs ඇස්තමේන්තු කිරීමේ දී හා මූලික හඳුනා ගැනීමේ සිට සැලකිය යුතු ලෙස වැඩිවී ඇති විටක අදාළ වන පරිදි සාධාරණ හා උපකාරී තොරතුරු අදාල වන බවට හා අනවශ්‍ය වියදමක් හෝ වෑයමක් නොදරා ලබා ගත හැකි බවට සමාගම සලකයි. මේ තුළ සමාගමේ ඓතිහාසික අත්දැකීම මත පදනම් වූ ණය තක්සේරුව හා ඉදිරි තොරතුරු ඇතුළත් ගුණාත්මක හා ප්‍රමාණාත්මක තොරතුරු හා විමර්ශන යන දෙකම අඩංගුවේ.

මූල්‍ය වත්කමක ඇති ණය අවදානම දින 365 කට වැඩියෙන් කල් ගත ව ඇති අවස්ථාවක එය වැඩිවී ඇති බවට සමාගම සැලකේ.

පහත අවස්ථාවලදී මූල්‍ය වත්කම හිගව ඇති බවට සමාගම සැලකේ.

- සමාගම වෙතතම ණය බැදීම පූර්ණව ගෙවීමට ණයගැතියාට නොහැකි වන අවස්ථාවක, ඇපය ලබා ගැනීම (තබා ඇති විටක) වැනි ක්‍රියාමාර්ග වලට සමාගම යොමු නොවීම; නැතහොත්
- මූල්‍ය වත්කම දින 180 කට වඩා වැඩි කලක් ගතව ඇති විටක.

  යාවජීව අපේක්ෂිත ණය පාඩුව යනු මූල්‍ය උපකරණයක අපේක්ෂිත ආයු කාලය පුරා සිදු විය හැකි ආපසු නොගෙවීමේ සිදුවීම් වලින් හට ගන්නා අපේක්ෂිත ණය පාඩුව ය.

මාස 12 අපේක්ෂිත ණය පාඩුව යනු විය හැකි හිඟ ඇති වන තත්ත්වයන් තුලින් දන්වා සිටින දිනට පසුව මාස 12 ක් තුළ ඇති වන අපේක්ෂිත ණය පාඩුවේ කොටසකි.

අපේක්ෂිත ණය පාඩුව ඇස්තමේන්තු කිරීමේ දී සළකා බැලෙන උපරිම කාලසීමාව වන්නේ ණය අවදානමට සමාගම ලක් වන උපරිම කොන්ත්‍රාත්මය කාල සිමාවයි.

අපේක්ෂිත ණය අපේක්ෂිත ණය පාඩුව ගණනය කිරීම

අපේක්ෂිත ණය පාඩු යනු ණය පාඩු වල ලාභදායිත්වය බර තැබූ ඇස්තමේන්තුවකි. ණය පාඩු සියලු මුදල් හිඟ වල තථ්‍ය වටිනාකමට ගණනය කෙරේ (උදා. සමාගම ලබා ගැනිමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහ හා කොන්ත්‍රාත් වලට අදාළ මුදල් ප්‍රවාහ අතර වෙනස).

මූල්‍ය වත්කමේ සක්‍රිය පොලි අනුපාතයට අපේක්ෂිත ණය පාඩුව වට්ටම් කෙරේ.

ණය පළුදු වූ මූල්‍ය වත්කම්

එක් එක් දත්වා සිටින දිනට ක්‍රමක්ෂිත පිරිවැයට මූල්‍ය වත්කම් සමාගම තක්සේරු කිරීමට හා FVOCI හි ණය ඇප ණය පළුදු වීමට කටයුතු කෙරේ. සිදු වූ මූල්‍ය වත්කමක ඇස්තමේන්තුගත අනාගත මුදල් ගලන කෙරෙහි හානිකර බලපෑමක් ඇති වන සිදුවීම් එකක් හෝ වැඩි ප්‍රමාණයක් සිදු වන විටක මූල්‍ය වත්කමක් ණය පළුදු බවට පත් වේ.

පහත දැක්වෙන නිරීක්ෂණය කල හැකි දත්ත ඇතුළුව මූල්‍ය වත්කමක ණය පළුදුවීම් සාක්ෂි:

- ණයගැතියා හෝ නිකුත්කරන්නා ගේ ප්‍රධාන මූල්‍ය ගැටලුව;
- ගෙවීම් පැහැර හැරීමක් වැනි කොන්ත්‍රාත්තු උල්ලංඝණය කිරීමක් නැතහොත් දින 180 ට අධික හිඟ මුදලක්;
- සමාගම විසින් එය බලාපොරොත්තු නොවන කොන්දේසි මත ණයක් හෝ අත්තිකාරමක් ප්‍රතිව්‍යුහගත කිරීම;
- ණයහිමියා බංකොලොත් බවට පත්වීම හෝ වෙනත් මූල්‍ය අපසුතාවයකට පත්වීමේ හැකියාව; එසේ නැතහොත්
- මූල්‍ය අපහසුතා නිසා සක්‍රිය වෙළඳපොල නොමැතිවීම.

මූල්‍ය තත්ව ප්‍රකාශයේ අපේක්ෂිත ණය පාඩුව සඳහා ප්‍රතිපාදන සැලසීම

මූල්‍ය වත්කම සඳහා වූ පාඩු දීමනා ක්‍රමක්ෂිත පිරිවැයට ගණනය කෙරෙන අතර වත්කම් වල ධාරණ අගයෙන් අඩු කෙරේ.

ලියා හැරීම

පළුදු පාඩුව අඩුවීම පිළිබඳව හේතු පිළිබඳව සමාගමට සාධාරණ බලාපොරොත්තුවක් නොමැති අවස්ථාවක මූල්‍ය වත්කමක දළ ධාරණ අගය ලියා හැරේ. පුද්ගල ලෙස සිටින පාරිභෝගිකයන් හට සමාගම සතුව දළ ධාරණය අගය ලියා හැරෙන ප්‍රතිපත්තියක් ඇත. වී සමාන වත්කම් ආපසු ලබා ගැනීමේ ඓතිහාසික අත්දැකීම මත පදනම්ව මූල්‍ය වත්කම දින 180 ක් ගතවීම නිසාය. ආයතනික පාරිභෝගිකයන් සඳහා ආපසු ලබා ගැනීමේ සාධාරණ බලාපොරොත්තුව මත පදනම්ව ලියා හැරෙන දිනය හා මුදලට අදාළව සමාගම විසින් පුද්ගලිකව තක්සේරුවක් කිරීම මගිනි. ලියා හැරි මුදලින් කිසිදු ප්‍රධාන අය කර ගැනීමක් සමාගම අපේක්ෂා නොකෙරේ. කෙසේ වුවද ලියා හැරි මූල්‍ය වත්කම් හිඟ මුදල් නැවත අය කර ගැනීමේ සමාගමේ ක්‍රමවේදයට අනුගතව වී‍වා පොදු ක්‍රියාමාර්ග වලට යෙදවීමේ ඉඩ කඩ ඇත.

පළුදු ප්‍රතිපත්තිය : 2018 ජනවාරි මස 1 දිනට පෙර අදාළවන

මූල්‍ය වත්කම් (ලැබීමට නියමිත දෑ ඇතුළුව)

ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට සිදු නොකල මූල්‍ය වත්කමක් එක් එක් දත්වා සිටින දිනට තක්සේරු කෙරේ. වී පළුදුවීමට අදාළව පැහැදිලි සාක්ෂි තිබේ දැයි තහවුරු කර ගැනීම සඳහා ය. වත්කම මූලික හදුනා ගැනීමෙන් අනතුරුව පාඩුවීම සිදුවි ඇති බවට පැහැදිලි සාක්ෂි ඇති විටක මූල්‍ය වත්කම පළුදු ලෙස සැලකේ. එමෙන්ම විශ්වාසදායීව ඇස්තමේන්තු කළ හැකි ඇස්තමේන්තුගත අනාගත මුදල් ගලන පිළිබඳව නිශේධනීය බලපෑමක් පාඩු සිදුවීම මගින් විය හැක.

මීට අමතරව සමකොටස් තැන්පතුවක ආයෝජන සඳහා එහි සාධාරණ අගයේ ප්‍රධාන හෝ කල්ගතවූ අඩුවීම පෙන්නුම් කෙරේ.

විශේෂිත වත්කම හා සාමූහික මට්ටම යන දෙකෙහිම ලැබීමට නියමිත දැ වල පළුදුවීමේ සාක්ෂි සමාගම සැලකිමට ලක් කෙරේ. පුද්ගල ලෙස වැදගත්වන ලැබීමට නියමිත සියල්ල විශේෂිත පළුදු ලෙස තක්සේරු කෙරේ. විශේෂිතව පළුදු වූ බවට හදුනා ගැනෙන වැදගත් පුද්ගල ලැබීමට නියමිත දෑ සියල්ල හදුනා නොගත්තා වුවද පළුදු වී ඇති බවට පසුව සාමූහිකව තක්සේරු කෙරේ. පුද්ගල නොවන ලැබීමට නියමිත දෑ පළුදුවීම් සළකා සමාන අවදානම් ලක්ෂණ සැලකිල්ලට ගෙන ඒකාබද්ධව සාමූහිකව තක්සේරු කෙරේ.

සාමූහික පළුදුවීම තක්සේරු කිරීමේ දී පැහැර හැරීමේ හැකියාවේ ඓතිහාසික ප්‍රවණතා සහ සිදුවූ පාඩු මුදල, වත්මන් ආර්ථික හා ණය තත්ත්වයට ගැලපෙන ලෙස කළමනාකාරිත්වය තීරණය හා යොදා ගැනේ.

ක්‍රමක්ෂිත පිරිවැයට ගණනය කළ මූල්‍ය වත්කමට අදාළ පළුදු පාඩුවක් ධාරණ අගය සහ වත්කමක නියම සක්‍රිය පොලි අනුපාතයට වට්ටම්කළ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ වල වර්තමාන අගයේ වෙනස ලෙස ගණනය කෙරේ.

පාඩු ලාභ හෝ පාඩු ලෙස හදුනා ගන්නා අතර ලැබීමට නියමිත දෑ තුළ දීමනා ගිණුමේ සඳහන් කෙරේ. පළුදු වූ වත්කම් වල පොලිය වට්ටම් වල දිග හැරීම මගින් අඛණ්ඩව හදුනා ගැනේ. පසුව සිදුවන සිදුවීමකින් පළුදු පාඩුව අඩුවන අවස්ථාවක ලාභ හෝ පාඩු මගින් පළුදු පාඩු අඩුව පිරිමැසීම සිදු වේ.

පළුදු ප්‍රතිපත්තිය: මූල්‍ය නොවන වත්කම්

විලම්භිත බදු වත්කම් හැර සමාගමේ මූල්‍ය නොවන වත්කම් වල ධාරණ අගයන් පළුදුවීමේ ලක්ෂණ තිබේ දැයි දැන ගැනීම සඳහා එක් එක් වාර්තා කරන දිනට සමාලෝචනය කෙරේ. එවැනි සංඥාවක් ඇති වී තිබෙන අවස්ථාවක වත්කමේ අය කර ගත හැකි මුදල ඇස්තමේන්තු කෙරේ. අස්ථිර භාවිත ආයු කාලය හෝ භාවිතාව සඳහා මෙතෙක් ලබා දී නොමැති අප්‍රෂ්ඨ වත්කම් සඳහා එක් එක් වසරේ සමාන කාලයක් තුළ අය කර ගත හැකි මුදල ඇස්තමේන්තු කෙරේ.

වත්කමක අය කළ හැකි මුදල එහි භාවිත වටිනාකමට සහ සාධාරණ අගයට විකුණුම් පිරිවැයට අඩුවෙන් වැඩි අගයක් ගනි. භාවිත අගය තක්සේරු කිරීමේ දී බදු පෙර වට්ටම් අනුපාතය භාවිතා කර වී‍වායේ වත්මන් වටිනාකමට වට්ටම් කෙරේ. එතුළින් මුදල් වල කාලින වටිනාකම තථ්‍ය වෙළඳ තක්සේරු සහ වත්කමේ විශේෂිත අවදානම් හඳුනා ගැනේ. වෙන් වෙන් ලෙස පරීක්ෂා කළ නොහැකි වත්කම් පළුදු පරීක්ෂාවට ලක් කිරීමේ දී වත්කම් කුඩා කණ්ඩායම් වලට ගොනු කරන අතර වෙනත් වත්කම් වල මුදල් ගලන වල ස්වාධීන ලෙස අඛණ්ඩ භාවිතා මගින් මුදල් ගලන උත්පාදනය කෙරේ.

වත්කමක ධාරණ අගය එය ඇස්තමේන්තුගත අය කර ගත හැකි මුදල ඉක්මවන අවස්ථාවක පළුදු පාඩුව හදුනා ගැනේ. පළුදු පාඩු ලාභ හෝ පාඩු තුළ හදුනා ගැනේ.

පෙර අවස්ථාවල හදුනාගත් වෙනත් වත්කම් වලට අදාළ පළුදු පාඩු පාඩුව අඩු වී ඇති බවට හෝ තවදුරටත් නොපවතින බවට එක් එක් දත්වා සිටින දිනට තක්සේරු කෙරේ. අයවිය යුතු මුදල තීරණය කිරීමට යොදා ගන්නා ඇස්තමේන්තුවල වෙනසක් ඇති වී ඇති අවස්ථාවක පළුදු පාඩුව නැවත වෙනස් කෙරේ. වත්කමේ ධාරණ අගය ක්ෂය හෝ ක්‍රමක්ෂය ශුද්ධ මුදලට තීරණය කළ ධාරණ අගයට ඉක්ම නොයන මට්ටමකට පමණක් පළුදු පාඩුව වෙනස් කෙරේ.

මූල්‍ය අවදානම් කළමනාකරණය

ණය අවදානම

ණය අවදානම යනු කිසියම් ගනුදෙනුකරුවෙකු හෝ මූල්‍ය උපකරණයක ප්‍රතිපාර්ශ්වකරුවෙකු සිය ගිවිසුම් ගත වගකීම් ඉටු කිරීමට අපොහොසත් වීමෙන් සමාගමට අත්වන මූල්‍ය අලාභ වන

අතර මෙය මූලිකව සමාගම වෙත ගණුදෙනුකරුවන් වෙතින් ලැබිය යුතු මුදල් සහ සම්බන්ධිත පාර්ශ්වයන් ආශ්‍රිතව උද්ගත වේ. හානිකරණය සඳහා සමාගම ඉඩ හැරීමක් තබා ඇති අතර ඒ තුළින් වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ සම්බන්ධයෙන් ඇති විය හැකි අලාභයේ තක්සේරු වටිනාකම නිරූපනය වේ.

ද්‍රවශීලී අවදානම

ද්‍රවශීලතා අවදානම යනු මුදල් හෝ වෙනත් මූල්‍යමය වත්කම් යොදා ගනිමින් ස්වකීය මූල්‍යමය වගකීම් ඉටු කිරීමට නොහැකිවීමෙන් සමාගමක් මුහුණ දෙන අවදානම වේ. ද්‍රවශීලතා කළමනාකරණය සඳහා සමාගම අනුගමනය කරනු ලබන ප්‍රවේශය වනුයේ සාමාන්‍ය මෙන්ම ආන්තික තත්වයකදී ද අනපේක්ෂිත අලාභ ඇති වන්නා වූ හෝ සමාගමේ කීර්තිනාමයට හානි වන ආකාරයේ හෝ ක්‍රියාවලියකින් තොරව සිය මූල්‍ය වගකීම් ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් ද්‍රවශීලිතාවයක් පවත්වා ගැනීමයි.

පොලී අනුපාත අවදානම

වෙළඳපොල පොලී අනුපාතයන් වෙනස්වීමේ අවදානමට සමාගම මූලිකවම ලක් වනුයේ පාවෙන පොලී අනුපාතයක් සහිත දිගුකාලීන ණය ලබා ගෙන ඇති විටකය. මෙම අවදානම කළමනාකරණය කිරීම සඳහා පාවෙන සහ ස්ථාවර පොලී අනුපාත වලින් යුත් සමතුලිත ණය පහසුකම් සම්මිශ්‍රණයක් පවත්වා ගැනීමට සමාගම කටයුතු කෙරේ.

3.1.4 තොග

ජෙව වත්කම් වලින් නෙලාගත් කෘෂි නිෂ්පාදන

වාර්තා කරන දිනට විකිණී නොමැති නමුත් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන දිනය වන විට විකිණී ඇති ජෙව වත්කම් වලින් නෙලාගත් කෘෂි නිෂ්පාදන (අස්වැන්න) එම විකුණුම් මිලෙන් විකුණුම් වියදම් අඩු කිරීමෙන් පසු ලැබෙන වටිනාකමට තක්සේරු කර ඇත.

මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කරන දින වන විටත් විකුණුම් ගිවිසුම් සඳහා එළැඹ නොමැති තොග ඇස්තමේන්තුගත සාමාන්‍ය ශුද්ධ විකුණුම් මිලක් යටතේ ඇස්තමේන්තු කර ඇත. පොල් සඳහා අස්ථාවර වෙළඳපොල තත්ත්වයක් පවතින අවස්ථාවක එම පොල් තොග කොප්පරා බවට පරිවර්තනය කිරීමෙන් පසු ලැබෙන ශුද්ධ උපලබ්ධිත අගයට ඇස්තමේන්තු කරනු ලැබේ.

වැඩිදුර සැකසූ කෘෂි නිෂ්පාදන

වැඩිදුර සකසන ලද කෘෂි නිෂ්පාදන වල වටිනාකම, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධිත වටිනාකම යන අගයන්ගෙන් අඩු වටිනාකමට තක්සේරු කෙරේ. මෙහිදී අබලි හා අඩු සංචලනයක් සහිත අයිතම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කර ඇත. ශුද්ධ උපලබ්ධිත වටිනාම යනු අදාළ තොග සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාවලිය තුළ විකිණීමෙන් ලැබීමට අපේක්ෂිත මිලෙන් අපේක්ෂිත විකුණුම් වියදම් සහ එම තොග විකිණිය හැකි තත්වයට පත් කිරීමට දැරිය යුතු වන වියදම් අඩු කොට ලැබෙන අගය වේ.

යෙදවුම් අමුද්‍රව්‍ය, පාරිභෝජන දෑ හා අමතර කොටස්

මේවා ප්‍රථම ලැබීම් සඳහා පළමු නිකුත් කිරීමේ (FIFO) පදනම මත සත්‍ය පිරිවැයට ගණනය කෙරේ.

'පැල තවාන්

පැල තවාන් පිරිවැය සඳහා සෘජු අමුද්‍රව්‍ය, සෘජු ශ්‍රමය සහ වෙනත් සෘජු පොදු කාර්ය පිරිවැය ඇතුළත්වේ. නිසි ප්‍රමණනය ඉක්මවා වැඩුනු පැල මෙහිදී ඉවත් කෙරේ.

3.1.5 මුදල් හා මුදල් වලට සමාන දෑ

මුදල් හා මුදල් වලට සමාන දෑ යන්න තුලට මුදල් ශේෂයන්, ඉල්ලුම් තැන්පත් සහ වටිනාකම වෙනස්වීම පිළිබඳ අවදානම අවම මට්ටමක පවතින දන්නා මූල්‍යමය වටිනාකමක් සඳහා කඩිනමින් මුදල් බවට පරිවර්තනය කළ හැකි ද්‍රවශීලී ආයෝජනයන් ගෙන් සමන්විත වේ.

3.2 වගකීම් හා ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ දක්වා ඇත්තේ වාර්තා කරන දිනයෙන් වසරක් තුළ ගෙවිය යුතු හෝ ඉල්ලූ විටකදි ගෙවීමට බැදී සිටින වගකීම් වේ. ජංගම නොවන වගකීම් වනුයේ වාර්තා කරන දිනයෙන් වසරකට පසු ගෙවිය යුතු ගෙවීම් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී දන්නා සියළු වගකීම් ඒවා සිදුවන කාලය තුළ වෙනත් විස්තීරණ ආදායමට ගිණුම්ගත කර ඇත.

යම් අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ දී සමාගම යම් නෛතික බැඳීමකට යටත්ව ඇත්ද එම බැඳීම විශ්වාසනීය ලෙස තක්සේරු කිරීමේ හැකියාව සහ එම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභයක මූල්‍ය ගලායාමක් අවශ්‍ය වන්නේද එවැනි විටක ඒ සඳහා වෙන් කිරීමක් සිදු කෙරේ.

3.2.1 සේවක ප්‍රතිලාභ

ස්ථිර දායක සැළසුම් - සේ.අ.අ සහ සේ.හා.අ

සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් නිර්ණය කළ ප්‍රතිලාභ සැලසුමක් යනු සේවා කාලය අවසානයේ ප්‍රතිලාභ හිමිවන සැලැස්මකි. ඒ යටතේ සමාගම තම සේවකයන් වෙනුවෙන් වෙනත් ආයතනයකට ස්ථාවර දායක මුදල් ලබා දීම සිදුවන අතර, වෙනත් වැඩිපුර ගෙවීමක් සඳහා නෛතික බැදියාවන් ඇතිවිම සිදු නොවේ. නිර්ණය කළ විශ්‍රාමික ප්‍රතිලාභ සැලසුම් ක්‍රමයකට කරනු ලබන දායකත්වය සේවක ප්‍රතිලාභ වියදමක් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ. සමාගම විසින් සෑම සේවකයෙකුගේම දළ පාරිශ්‍රමිකයෙන් ගණනය කරනු ලැබූ 12% ක ප්‍රමාණයක් සේවක අර්ථ සාධක අරමුදලට හෝ වතු කාර්ය මණ්ඩල සංගමයට හෝ ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක සමිතියට හෝ ගෙවනු ලැබේ.

සෑම සේවකයෙකුම දළ පාරිශ්‍රමිකයන් ගණනය කරනු ලබන 3% ක ප්‍රමාණයක් සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල සඳහා සමාගම ගෙවනු ලැබේ.

ස්ථිර ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම පාරිතෝෂිතය

වයස, සේවා කාලය හෝ සේවක වන්දි ගෙවීම් වැනි කරුණු එකක් හෝ කිහිපයක් හේතුකොටගෙන සේවය අවසන් කිරීමේ දී සේවකයෙකුට ලැබෙන මූල්‍ය ප්‍රතිලාභ ප්‍රමාණය තීරණය කිරීම, නිර්ණය කළ ප්‍රතිලාභ සැලසුම් පාරිතෝෂිත ක්‍රමයක් යටතේ සිදු වේ.

1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීම් පනතේ විධිවිධාන වලට අනුව සියළුම හිමිකම්ලාභී සේවකයන් සඳහා නිර්ණයකළ විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමයක් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම ප්‍රතිලාභ ක්‍රමය සඳහා සම්පූර්ණයෙන්ම අභ්‍යන්තර මුදල් යෙදවේ. විශ්‍රාමික පාරිතෝෂිත සඳහා වන වෙන් කිරීම් ස්වාධීන සුදුසුකම් ලත් ආයුඝනන තක්සේරු ආයතනය නිර්දේශ සැලකිල්ලට ගෙන සමාගම විසින් සිදු කෙරේ.

නිර්ණයකළ විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්මට අදාළව මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය තුළ හඳුනා ගනු ලබන වගකීම් ප්‍රමාණය, වාර්තා කරන දිනට නිර්ණය කළ ප්‍රතිලාභ වල වර්තමාන වටිනාකමට සඳහා හඳුනා නොගත් අතීත සේවා පිරිවැය ගැලපීමෙන් ගණනය කෙරේ. නිර්ණය කළ ප්‍රතිලාභ වගකීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 - විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය හි සඳහන් ප්‍රක්ෂේපිත

ඒකක ප්‍රතිලාභ ක්‍රමය යොදා ගෙන ගණනය කිරීම සිදු කර ඇත. නිර්ණායක කල ප්‍රතිලාභ වල වර්තමාන අගය ගණනය කිරීමේ දී අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීම සඳහා දල වශයෙන් ආසන්න වන කල්පිරීම් කාලයක් සහිත රාජ්‍ය බැදුම්කර වලට අදාළ පොලී අනුපාතය යොදා ගනී.

අත්දැකීම් තුලින් සිදු කරන වෙනස්කම් තුල සහ යොදා ගනු ලබන උපකල්පන වල වෙනස්වීම් තුල ඇති වන්නා වූ ලාභ හා අලාභ, හා ඒවා ඇති වූ කාලපරිච්ඡේද වෙනත් විස්තීරන ආදායමට ගලපනු ලැබේ. අතීත සේවා පිරිවැය විස්තීරණ ආදායම් ප්‍රකාශය තුල හදුනා ගනු ලැබේ. කෙසේ වෙතත් එසේ සිදු කරනු ලබන්නේ සේවකයන් සේවා කාලය තුල රැඳී සිටින කාලයේ (ඉදිරි පවරන ලද කාලය) වෙනස්වීමකට අදාළව එම වෙනස හට නොගන්නේ නම් පමණි. එවැනි අවස්ථාවක අතීත සේවා පිරිවැය ඉදිරි පවරන ලද කාලය පුරා සරල මාර්ග ක්‍රමය යටතේ ක්‍රමක්ෂය කරනු ලැබේ.

1983 අංක 12 දරණ පාරිතෝෂිත දීමනා පනතට අනුව මෙම ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබන්නේ වසර 5 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයන් පමණි.

නිර්ණය කළ ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂිත ප්‍රමාණය නිශ්චය කිරීම සඳහා භාවිතා කරන ලද මූලික උපකල්පන සටහන් අංක 24 හි දක්වා ඇත.

3.3 ප්‍රාග්ධන බැඳීම් හා හදිසි අවස්ථා

අසම්භාව්‍යයන් යනු අතීත සිදුවීමක් මත හට ගෙන ඇති නමුත් සමාගමේ පාලනයෙන් පරිබාහිර වූ අනාගත අවිනිශ්චිත සිදුවීමක, සිදුවීම හෝ සිදු නොවීම මත ඇති විය හැකි වත්කමක් හෝ වගකීමකි.

ප්‍රමාණාත්මක ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍යයන් සියල්ල 29 වන සටහනේ දක්වා ඇත.

3.4 විලම්බිත ආදායම

3.4.1 රාජ්‍ය ප්‍රදාන හා සහනාධාර

ප්‍රදාන හා ආධාර හදුනා ගැනෙනුයේ අදාළ ප්‍රදානය හිමි වන බවට සහතික වීමක් සහ ඒ සඳහා අවශ්‍ය කොන්දේසි සපුරා ලිය හැකි බවට තහවුරුවීමෙන් පසුව පමණි. කිසියම් ප්‍රදානයක් වත්කමක් සම්බන්ධයෙන් වන විට අදාළ වත්කමේ පිරිවැයෙන් ප්‍රදාන ලෙස ලැබෙන වටිනාකම අඩු කරනු ලැබේ. කිසියම් ප්‍රදානයක් වියදමක් සම්බන්ධයෙන් වන විට එම ප්‍රදානය ඊට අදාළ වියදමට අනුකූල වන පරිදි ක්‍රමානුකූල පදනමක් මත ආදායමක් ලෙස හදුනා ගැනේ.

3.5 විස්තීරණ ආදායම් ප්‍රකාශය

විස්තීරණ ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා වියදම් ක්‍රියාත්මක වන ක්‍රමය වඩාත් සාධාරණ බැවින් ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිති 01 හි විධිවිධාන වලට අනුකූලව එම ක්‍රමය විස්තීරන ආදායම් ප්‍රකාශය පිළියෙල කිරීම සඳහා යොදා ගෙන ඇත.

3.5.1 ආදායම් හදුනා ගැනීම

භාණ්ඩ අලෙවිය

ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිති අංක 15 මගින් ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිති අංක 18 ඇති "ආදායම" ඇතුළුව ආදායම් හදුනා ගැනීමේ උපදේශයත් ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිති අංක 11 හි "ඉදිකිරීම් කොන්ත්‍රාත්" සහ IFRIC අංක 13 හි "පාරිභෝගික ගරුත්ව වැඩසටහන්" විස්තාපනය විම සහ ඒවා 2018 ජනවාරි 1 දිනෙන් පසුව හෝ එදිනෙන් ඇරඹෙන වාර්ෂික දැනුම් දීමේ කාල සඳහා ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිති අංක 15 මගින් ආදායම හදුනා ගන්නා ප්‍රමාණය හා කාලවකවානුව තීරණය කරන විස්තීරණ ව්‍යුහය හඳුනා ගැනේ. ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිති අංක 15 තුලින් සේවාලාභීන් සමඟ කොන්ත්‍රාත් වලින් ඇති වන ආදායම් හා මුදල් ගලන වල අස්ථිරතාවය සහ ස්වභාවය, මුදල් හා කාලය මූල්‍ය ප්‍රකාශන තුලින් පරිශීලකයන් හට දැන ගැනීමට අවශ්‍ය නව ප්‍රමිතිගත හා සංඛ්‍යාත්මක හෙලිදරව්වක් සිදු කෙරේ.

ආදායම හා මුදල කෙසේද යන්න හදුනා ගැනීමට අවශ්‍ය වූ විට පස් වැදැරුම් මොඩලය යොදා ගැනීමට ආයතන කටයුතු කළ යුතුය. මොඩලය මගින් දිනය හෝ භාන්ඩ හෝ සේවාව සේවාලාබියට ලැබෙන මුදල හදුනා ගැනේ.

2018 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති අංක 15 ට අනුව ආදායම් හදුනා ගැනිමේ දී පියවර පහක ආදර්ශයක් මත වූ ප්‍රතිපත්ති සමාගම අනුගමනය කෙරේ. ඒ අනුව පහත දැක්වෙන සියළු ක්‍රමවේදයන් සපුරා ඇති තත්වය තුල ආදායම හදුනා ගැනේ.

- කොන්ත්‍රාත්තුවට අදාළ පාර්ශ්වකරුවන් කොන්ත්‍රාත්තු/ව අනුමත කර තිබීම;
- මාරු කළ යුතු භාණ්ඩ හෝ සේවා සම්බන්ධව එක් එක් පාර්ශ්වකරුවන්ගේ හිමිකම ආයතනය විසින් හදුනා ගැනිම;
- මාරු කළ යුතු භාණ්ඩ හෝ සේවා වලට අදාළ ගෙවුම් කොන්දේසි ආයතනය විසින් හදුනා ගැනීම;
- කොන්ත්‍රාත් තුළ වාණිජමය අරමුණක් තිබීම;
- සේවාලාභියා වෙත පැවරෙන භාණ්ඩ හෝ සේවා හුවමාරුවේදී ආයතනය ඇති හිමිකම හදුනා ගැනිම.

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති අංක 15 අනුගමනය කිරීම මගින් සමාගමේ මූලභූත ප්‍රකාශන වලට සැලකිය යුතු බලපෑමක් ඇති නොකෙරේ.

පොලී ආදායම

අය කර ගැනීම සැක සහිත නොවේනම් පොලි ආදායම් උපචිත (වත්කමෙන් අපේක්ෂිත අස්වැන්න සැලකිල්ලට ගෙන) වශයෙන් හදුනා ගැනේ.

ඉවත් කිරීමේ වාසි හෝ අවාසි

දේපල පිරියත සහ උපකරණ ඉවත් කිරීමෙන් ලැබෙන ලාභ හෝ අලාභ අදාළ දේපල පිරියත සහ උපකරණ වල ධාරණ අගය සහ ශුද්ධ විකුනුම් ආදායම් සංසන්දනය කිරීමෙන් නිර්ණය වන අතර ඒවා විස්තීරණ ආදායම් ප්‍රකාශයේ වෙනත් ආදායම් යටතේ දැක්වේ.

3.5.2 වියදම් හදුනා ගැනිම

මෙහෙයුම් වියදම්

ව්‍යාපාරික කටයුතු තුළ එදිනෙදා සිදුවන මෙහෙයුම් ක්‍රියාවලියේදී කරනු ලබන වියදම් සහ දේපල පිරියත හා උපකරණ නඩත්තු කිරීමේ දී වැය වන සියළු වියදම් මූල්‍ය වර්ෂයේ ලාභ/ (අලාභ) ගණනය කිරීම සඳහා විස්තීරන ආදායම් ප්‍රකාශය තුළ හදුනා ගැනේ. මූල්‍ය නොවන වත්කම් මන්දගාමී සංසරනයක් සහිත තොග, ප්‍රමාණය ඉක්මවා වැඩුනු පැල තවාන් ඇතුළු දේපල පිරියත හා උපකරණ සම්බන්ධ සියළු වගකීම් සහ ක්ෂයීම් සඳහා වෙන් කිරීම් සිදු කර ඇත.

මූල්‍ය පිරිවැය

මූල්‍ය පිරිවැය සඳහා පොලී වියදම් සහ මෙහෙයුම කල්බදු යටතේ සිදු කළ ගෙවීම් ඇතුළත් වේ. වත්කම් අත්පත් කර ගැනීම හෝ සුදුසුකම්ලත් වත්කම් නිෂ්පාදනයට හෝ ඉදිකිරීමට හෝ

අදාළ සථල පොලී අනුපාතික ක්‍රමය යටතේ හදුනා ගනු ලබන මූල්‍ය පිරිවැය හැර අනෙකුත් මුල්‍ය වියදම් විස්තීර්ණ ආදායම ප්‍රකාශයේ හදුනා ගැනේ. මෙහෙයුම් කල්බදු යටතේ කරනු ලබන ගෙවීම් සරල මාර්ග ක්‍රමය යටතේ බදු කාල සීමාව පුරා විස්තීරණ ආදායම් ප්‍රකාශය තුල හදුනා ගැනේ.

බදු වියදම

ආදායම් බදු වියදම් තුල වර්තමාන හා විලම්බිත බදු වලින් සමන්විත වේ. ආදායම් බදු වියදම සමකොටස් හදුනා ගැනීමේ දී සමකොටස් වල සෘජුව පිළිගත අයිතම වලට අදාළ ප්‍රමාණයට හැර විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හදුනා ගැනේ.

තථ්‍ය බදු

වර්තමානයට හා සංසදනාත්මක කාල සීමාව සඳහා වූ තථ්‍ය බදු වියදම ගෙවූ මුදලට හෝ අදාළ තක්සේරු වසරට අදාළව 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන වලට අනුව දන්වා සිටින දිනට පසුකාලීනව පැනවූ බදු පැනවෙන ආදායමට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා ගෙවීමට අපේක්ෂිත මුදල ලෙස හදුනා ගැනේ.

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතට 2018 අප්‍රියෙල් 1 දින සිට හදුන්වා දිය හැකි නව සංශෝධන වලට යටත්ව කෘෂිකර්මාන්තය සඳහා බදු විරාමයකට සමාගමට හිමිකමක් ඇත.

විලම්බිත බදුකරණය

විලම්බිත බදු වගකීම මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි වගකීම් ක්‍රමය භාවිතා කර හදුනා ගැනේ. මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කරනු ලබන වත්කම් හා වගකීම් වල ධාරන අගය සහ බදුකරණයේදී යොදා ගනු ලබන බදු පදනම අනුව එම වත්කම් හා වගකීම්වල ධාරන අගය අතර පවතින තාවකාලික වෙනස සම්බන්ධයෙන් විලම්බිත බදු ගණනය කෙරේ.

පහත දැක්වෙන තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු ගණනය නොකෙරේ. ව්‍යාපාර ඒකාබද්ධ කිරීමක් හැර ගිනුම්කරණ හෝ බදුමය ලාභය/ අලාභය හෝ කෙරෙහි බලපෑමක් නෙකරන ගනුදෙනුවක් හට ගන්නා වත්කමක හෝ වගකීමක පළමු හදුනා ගැනීම විලම්බිත බදු ගණනය කිරීම සිදු නොකෙරේ. උප සමාගමක් හෝ සාමූහිකව පරිපාලනය කරනු ලබන ව්‍යාපාරයකට අදාළව සිදු කරනු ලබන ආයෝජනයක් හා සම්බන්ධ වෙනසක් එම වෙනස දුරදක්නා අනාගත කාලයකදී ආපසු හැරවීමක් සිදු නොවේ යැයි සාධාරණව විශ්වාස කළ හැකි විටක ඒ සඳහා විලම්බිත බදු ගණනය නොකෙරේ. පළමුව හදුනා ගනු ලබන කීර්තිනාමයක් සම්බන්ධව බදු වන තාවකාලික වෙනස්වීමට අදාළව විලම්බිත බදු ගණනය නොකෙරේ. තාවකාලික වෙනස්කම් සම්බන්ධ විලම්බිත බදු ගණනය කිරීම සඳහා එම තාවකාලික වෙනස්කම් ආපසු හැරවෙන/ ප්‍රතිවර්තවන අවස්ථාවකදී අදාළ බදු වන බදු ප්‍රතිශතය යොදා ගැනේ. භාවිතා නොකරන ලද බදු අලාභ, බදු බැරකම් හා අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් සම්බන්ධව විලම්බිත බදු වත්කම් ලෙස හදුනා ගැනේ. කෙසේ වුවද, මෙම විලම්බිත බදු වත්කමක් හදුනා ගනු ලබන්නේ එය උපලබ්ධි කර ගත හැකි බව විශ්වාසනීයව තහවුරු වන්නේ නම් පමණි. විලම්බිත බදු වත්කම් සෑම වාර්තා කරන දිනකදීම සමාලෝචනය කරන අතර, අනාගතයේ උපලබ්ධි වන බදු ප්‍රතිලාභයේ ප්‍රමාණය යටත්ව ගැලපීමට කටයුතු කෙරේ. ප්‍රවර්තන බදු වත්කම් සහ බදු වගකීම් එකිනෙකට හිලව් කිරීමට හැකි බලාත්මක නීතිමය හිමිකමක් පවතින්නේනම් හා විලම්බිත බද්ද එකම ඒකකයක් සහ අධිකාරියක් වෙනුවෙන් වන විටක විලම්බිත බදු වත්කම් විලම්බිත බදු වගකීමකට හිලව් කිරීම සිදු කෙරේ.

විලම්බිත බදුකරණයට අදාළ තොරතුරු ගිණුම්කරණ ප්‍රකාශන වල අදාළ සටහන් තුල දක්වා ඇත.

3.6 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රමය යටතේ පිළියෙල කෙරේ. බදු වාරික ගෙවීම, ලාභාංශ ගෙවීම සහ ප්‍රදාන හා ආධාර ලැබීම් මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහ ලෙසද ලැබූ පොලී හා ලාභාංශ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලැබූ මුදල් ප්‍රවාහයන් ලෙසද වර්ගීකරණය කර ඇත.

3.8 කොටසක ඉපැයුම

කොටසක (EPS) දත්ත මූලික ඉපැයුම සමාගම විසින් ලබා දේ. කොටසක ඉපැයුම සමාගමේ සාමාන්‍ය කොටස්කරුවන්ට හිමි වාර්ෂික ලාභය හෝ පාඩුව වසර සඳහා වූ සාමාන්‍ය කොටස් වල බරතැබූ සාමාන්‍යයෙන් බෙදීමෙන් ගණනය කෙරේ.

3.9 දන්වා සිටින දිනට පසු සිදුවීම්

වාර්තා කරන දිනට පසු සිදුවීම් යනු මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන දිනය හා මූල්‍ය වාර්තා නිකුත් කිරීම සඳහා අනුමත කරන ලද දිනය අතර සිදුවන හිතකර හෝ අහිතකර සිදුවීම් යන වාර්තා කරන දිනට පසු සිදුවූ සියළුම ප්‍රමානාත්මක සිදුවීම් ය. වාර්තා කරන දිනට පසු සිදු වූ සියළුම ප්‍රමානාත්මක සිදුවීම් මූල්‍ය ප්‍රකාශන තුල අනාවරණය කිරීමට හෝ අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට හෝ කටයුතු කර ඇත.

මූල්‍ය ප්‍රකාශනවල සටහන්

දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා		2020 රු.	2019 රු.
4	**ආදායම**		
	පොල් (4.1 සටහන)	583,019,070	403,232,199
	රබර් (4.2 සටහන)	30,728,840	29,108,051
	පොල් ලෙලි	28,293,753	19,337,723
	රඹුටන්	7,043,169	9,427,855
	ගම්මිරිස්	2,663,768	5,719,107
	කජු	11,474,141	13,322,401
	අඹ	4,426,334	8,808,808
	මල් හා විසිතුරු පැල	333,900	269,705
	පොල් තෙල්	1,226,602	-
	වෙනත්	16,057,692	9,449,808
		685,267,268	**498,675,657**
4.1	**පොල් ආදායම**		
	අමු පොල්	542,784,044	374,459,297
	බීජ ගෙඩි ගෙඩි ගණන 32,809	2,964,036	11,602,707
	කොප්පරා	37,270,990	17,170,195
		583,019,070	**403,232,199**
	නිෂ්පාදනය (ගෙඩි)	11,411,931	16,300,283
	අලෙවි (ගෙඩි)	11,879,390	16,384,430
	ශුද්ධ අලෙවි සාමාන්‍යය (ගෙඩි 1000 බැගින්)	49,078	24,611
	අලෙවි පිරිවැය (ගෙඩි 1000 බැගින්)	28,779	19,002
4.2	**රබර් ආදායම**		
	RSS	-	2,837,228
	රබර් කිරි	30,205,640	25,204,589
	ඔටුපල් හා කුඩා කොටස්	523,199	1,066,234
		30,728,840	**29,108,051**
	නිෂ්පාදනය (කි.ග්‍රෑ.)	107,088	107,280
	අලෙවි (කි.ග්‍රෑ.)	104,605	119,198
	ශුද්ධ අලෙවි සාමාන්‍යය (කි.ග්‍රෑ. 1 බැගින්)	294	244
	අලෙවි පිරිවැය (කි.ග්‍රෑ.1 බැගින්)	396	380
5	**අලෙවි පිරිවැය**		
	පොල්	341,871,549	311,329,548
	රබර්	41,399,964	45,270,613
	රඹුටන්	2,885,497	2,232,740
	ගම්මිරිස්	2,321,728	5,969,701
	කජු	7,292,113	6,074,604
	අඹ	1,609,449	2,675,079
	මල් හා විසිතුරු පැල	1,843,247	1,538,664
	පාඩුව - වැවිලි පළුදුවීම්	-	-
	වෙනත්	10,253,733	10,626,697
		409,477,281	**385,717,645**

මූල්‍ය ප්‍රකාශනවල සටහන්

දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා	2020 රු.	2019 රු.
6 වෙනත් මෙහෙයුම් ආදායම		
ඵලදරන ජෛව වත්කම් ලාභය (6.1 සටහන)	19,318,559	35,952,689
ලාභ / (පාඩු) - දේපල පිරියත උපකරණ ඉවත් කිරීම් හා අලෙවිය	56,700	-
දැව ගස් විකිණීමෙන් ලාභය	1,320,466	6,335,132
ප්‍රමාද ඉවත් කිරීම සහ ගෙවීම් ගාස්තු - පොල්	11,289,969	9,554,842
කල්බදු/ පහසුකම් ගාස්තු ආදායම	15,522,071	13,706,726
වැලි / පස්	3,500	2,923,522
ආපසු ලියා හැරීම්	1,625,769	2,648,075
වෙනත් විවිධ ආදායම්	1,981,018	2,371,901
	51,118,052	**73,492,888**
6.1 ඵලදරණ ජෛව වත්කම් අලෙවි ලාභය - පොල් ගස් අලෙවිය	15,966,002	22,564,424
අඩු කළා: වර්ෂය තුලදී ඉවත් කළ පොල් ගස් වල පිරිවැය	(410,630)	(519,253)
අඩු කලා: සමුච්චිත ක්ෂය - දෙසැම්බර් 31 දිනට	390,655	476,649
	15,946,027	**22,521,820**
ඵලදරණ ජෛව වත්කම් අලෙවි ලාභය - රබර් ගස් අලෙවිය	3,378,210	13,991,000
අඩුකළා: වසර තුළ ගස් ඉවත් කිරීමේ පිරිවැය	(42,588)	(3,628,094)
එකතු කළා: සමුච්චිත ක්ෂය - දෙසැම්බර් 31 දිනට	36,910	3,067,963
	3,372,532	13,430,869
ලාභය - ඵල දරණ ජෛවවිද්‍යාත්මක වත්කම් අලෙවිය	**19,318,559**	**35,952,689**
7 පරිපාලන හා සාමාන්‍ය වියදම්		
වියදම් - වැටුප් හා ඒ ආශ්‍රිත	95,456,025	74,386,453
නඩත්තුව හා අළුත්වැඩියා	9,821,387	12,867,814
වෙනත් පරිපාලන වියදම්	20,809,570	27,992,809
	126,086,981	**115,247,075**
ලාභය - මෙහෙයුම් ක්‍රියාකාරකම්		
පහත දැක්වෙන අය කිරීම් අනතුරුව දක්වා ඇත;		
අධ්‍යක්ෂ පාරිශ්‍රමික	2,448,337	4,029,224
විගණක ගාස්තු - ව්‍යවස්ථාමය විගණනය	750,000	1,009,900
පරිත්‍යාග	144,350	316,080
ක්ෂය / ක්‍රමක්ෂය -		
කල් බදු හිමිකම් - ජනවසම වතු	2,621,414	2,614,259
නිශ්චල බදු දේපල - ජනවසම වතු	3,480,294	3,519,867
මේරූ ඵලා	17,705,928	15,983,257
දේපල, පිරියත හා උපකරණ	30,750,568	29,524,076
පුද්ගල පිරිවැයට අයත් දෑ		
ස්ථිර ප්‍රතිලාභ සැළැස්ම - විශ්‍රාම පාරිතෝෂිතය	18,260,157	16,329,411
ස්ථිර දායකත්ව සැළසුම් පිරිවැය - සේඅඅ හා සේභාඅ	39,287,287	39,122,309
කාර්යසාධන දීමනා	36,413,886	13,871,389
ප්‍රසාද දීමනා	11,959,703	11,244,758
නිවාඩු ගෙවීම්	8,129,906	8,057,103
ලෙඩ නිවාඩු	7,178,553	4,949,413
වැටුප් හා චේතන	293,612,845	292,396,027

දෙසැම්බර් 31 අවසන් වන වර්ෂය සඳහා	2020 රු.	2019 රු.

8 ශුද්ධ මූල්‍ය ආදායම /(වියදම)

මූල්‍ය ආදායම		
පොලී - කාලීන තැන්පත්	33,299,123	53,342,917
පොලී - භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිලදී ගැනීම (REPO)	1,455,605	3,335,258
පොලී - කාර්ය මණ්ඩලයට ලබාදී ඇති ණය	825,608	974,402
අය කර ගැනීම - පූර්වව ගෙවූ කාර්ය මණ්ඩල ප්‍රතිලාභ	1,253,931	1,651,327
	36,834,267	**59,303,904**
අඩු කළා: මූල්‍ය පිරිවැය		
කල් බදු පොලී - ජනවසම	29,254,796	28,228,798
පොලී- කෙටි කාලීන ණය ගැනීම්	-	258,586
ක්‍රමක්ෂය - කාර්ය මණ්ඩල පිරිවැය	1,253,931	1,651,327
	30,508,727	**30,138,711**
ශුද්ධ මූල්‍ය ආදායම /(වියදම)	6,325,540	29,165,193

9 ආදායම් බදු වියදම

ප්‍රවර්තන ආදායම් බදු වියදම (9.1) 9.2 සටහන්)	-	-
විලම්බිත බදු (9.3) 26 සටහන්)	28,312,387	18,132,567
	28,312,387	**18,132,567**

9.1 ප්‍රවර්තන ආදායම් බදු වියදම

